වාර්ෂික වාර්තාව
2021









භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

වාර්ෂික වාර්තාව

2021

පරිසර අමාත්‍යාංශය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

නො. 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.

දු.ක. : 011 2886289/011 2886290

ෆැක්ස් : 011 2886273

විද්‍යුත් තැපෑල : info@gsmb.gov.lk

වෙබ් අඩවිය : www.gsmb.gov.lk



සමාජ සංස්කෘතික සහ පාරිසරික සාරධර්ම සුරකින අතරම ජනතාවගේ ජීවන ප්‍රමිතීන් සහ ජීවනෝපායන් වැඩි දියුණු කිරීම සඳහා පෘථිවිය සහ එහි ශක්තිය පිළිබඳව අවබෝධ කර ගනිමින් සහ එය කළමනාකරණය කරමින් ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීම.

දැක්ම





ශ්‍රී ලංකාවේ බනිජ සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා සහ රටෙහි යහපත සඳහා බනිජ සතු ශක්තිය අවබෝධකර ගනු ලබන බව සහ කාර්යක්ෂම, ආරක්ෂිත සහ පාරිසරික වශයෙන් සවිමත් ආකාරයකින් බනිජ නිස්සාරණය කරගනු ලබන බව තහවුරු කිරීම සඳහා

මෙහෙවර



පටුන

විධායක සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය 6-7

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය 8-9

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් හා කාර්යංශය පිළිබඳ කෙටි විමසා බැලීමක් 10

ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණය 11-12

අපගේ නායකත්වය

කළමනාකාරීත්ව මණ්ඩලය 13-14

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 15-16

ක්‍රමෝපායික තත්ත්වය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ඉදිරි ක්‍රමෝපායන් 17-18

ක්‍රමෝපායක අරමුණු 19

පොදු හැඳින්වීම

කාර්යංශය ගැන තොරතුරු බිඳක් 20-21

ඓතිහාසික පසුබිම 22

කොවිඩ් 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් අපගේ ප්‍රතිචාරය 23

කාර්ය සාධනය සහ වටිනාකම් නිර්මාණය කිරීම

භූ විද්‍යා අංශය 25-39

කැණීම් අංශය 41-66

මානව සම්පත් අංශය 68-71

නීති අංශය 73-75

මූල්‍ය සමාලෝචනය 76

මූල්‍ය වාර්තා

සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති 78-86

ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 87

ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 88

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය 89

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 90

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 91-98

පාලනය සහ අවදානම් තත්ත්වයන්

ආයතනික පාලනය 99

විගණකාධිපතිවරයාගේ වාර්තාව 101-112

විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා පිළිතුරු 113-119

විගණන හා කළමණාකරණ කමිටු වාර්තාව 120-121

ආයතනික සමාජ වගකීම් 122-126

කාර්යාංශය හා සම්බන්ධ විය හැකි ආකාරය පිළිබඳ තොරතුරු 127

සභාපතිතුමාගේ සමාලෝචනය

2021 වර්ෂයෙහි වාර්ෂික වාර්තාව වෙත මෙම පණිවුඩය ලබා දීමට හැකි වීම මා හට ඉමහත් ගෞරවයක් බව පළමුව සඳහන් කිරීමට කැමැත්තෙමි. 2021 වර්ෂය තුළදී තමා වෙත ලබා දෙන ඉලක්ක සපුරාලීම, ව්‍යාපෘති සහ අනිකුත් සියළුම කටයුතු ඉටු කිරීම සඳහා කැප වී කටයුතු කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සියලුම සේවක සේවිකාවන්ට මගේ හෘදයාංගම කෘතවේදීත්වය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් හඳුන්වා දෙන ලද සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තියට හා අනුකූලව පාරිසරික ආචාරධර්ම සහ සම්මුතීන් වෙත ප්‍රමුඛතාවය ලබා දෙමින් තිරසර සමාජ ආර්ථික ක්‍රමවේදයක් ගොඩනැගීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ලෙස අපි පරිසර අමාත්‍යාංශය හා එක්ව කටයුතු කරමු.

පසුගිය වර්ෂ හා සංසන්දනය කර බැලීමේදී ශ්‍රී ලංකා රුපියල් මිලියන 3230ක ආදායමක් උපයමින් 44% ක වර්ධනයක් භූ.ස.ප.කා. විසින් පෙන්නුම් කරනු ලැබ ඇත. එකී ආදායමෙන් රුපියල් මිලියන 2000ක මුදලක් මහා භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලදී.

එසේ හෙයින්, අපගේ මූලික අරමුණ වනුයේ සක්‍රිය සහ නවෝත්පාදන දෘෂ්ටිකෝණයක් සහිත ඵලදායී රජයේ ආයතනයක් ලෙස අපගේ ආයතනය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉදිරියටත් කටයුතු කරමින් මෙම වර්ෂය තුළදී 2021 වර්ෂයට වඩා ඉහළ ආකර්ෂණීය වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීමයි.

ඒ අනුව, රටෙහි ආර්ථික සංවර්ධනය වෙත සැලකිය යුතු ප්‍රතිශතයක් දායක කර දළ දේශීය නිෂ්පාදිතය වැඩි දියුණු කිරීම සඳහා මඟ පෙන්වීමට අපි අපේක්ෂා කරමු.

ඒ අනුව ශ්‍රී ලංකාවේ පවතින සියළුම ඛනිජ සම්පත් හඳුනාගෙන ඒවායේ ප්‍රතිලාභ, ඒවා පිහිටි ස්ථාන සහ අදාළ ප්‍රමාණයන් පිළිබඳව නිසි තොරතුරු සංග්‍රහයන් සකස් කර ලැයිස්තුගත ඛනිජ සඳහා දේශීය හා විදේශීය වශයෙන් දැනට සහ අනාගතයේදී ඇති ඉල්ලුම පිළිබඳව අවසාන වශයෙන් ගවේෂණය කිරීමට සැලසුම් කරනු ලැබ ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස අනාගත ව්‍යාපෘති සංවර්ධනය කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාව ආකර්ෂණය කර ගැනීම සඳහා සහ කර්මාන්තය තුළ වැඩි අවස්ථාවන් නිර්මාණය කිරීම සඳහා හැකියාව ලැබෙනු ඇත.

විශේෂයෙන්ම, මහජනතාව වෙත බාධාවකින් තොරව අති විශිෂ්ඨ සේවාවක් ලබා දීම සඳහා දිරිමත් කරනු ලබන කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් සහ දුෂ්කරතාවයන් රහිත රාජකාරිමය කාර්ය පටිපාටීන් ක්‍රියාත්මක කිරීම සඳහා වන විධිමත් මාර්ගගත විසඳුමක් නිර්මාණය කර ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරභාවය ශක්තිමත් කරනු ලබන කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් බවට පත් වීම සඳහා අප විසින් වැඩි අවධානය යොමු කරනු ලැබ ඇත.

රටෙහි වටිනා ඛනිජවලින් බහුතරයක් පිළිබඳව වගකීම දරන රජයේ ආයතනය වන අපගේ ආයතනය පිළිබඳව මහජනතාව සතු දැනුවත්භාවය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක ඇති හෙයින් අපගේ ආයතනයෙහි ධනාත්මක හා තීව්‍ර ප්‍රතිසංවිධානයක් සිදු කිරීම සඳහා සුවිශේෂී ප්‍රවර්ධන වැඩසටහන් නිර්මාණය කිරීමටද සැලසුම් කරනු ලැබේ.

අවසාන වශයෙන් අපගේ අනාගත අපේක්ෂාවන් සාර්ථක ලෙස සපුරා ගැනීම සඳහා මේ දක්වා අඛණ්ඩව සිදු කරන ලද ආකාරයටම අපගේ සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සිය උපරිම සහයෝගය ලබා දෙනු ඇත යන්න මාගේ විශ්වාසයයි.

වෛද්‍ය සෙනරත් හේවගේ
සභාපති





අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය

2021 වර්ෂය අප කාර්යාංශයට මෙන්ම පුළුල් වශයෙන් ගත් කල සමස්ත ලෝකයටම බොහෝ ආකාරවලින් සුවිශේෂී වූ වර්ෂයක් විය. මෙම වර්ෂය භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මෙන්ම ඒ තුළ අප විසින් වැඩි දියුණු කළ යුතු සහ වැඩි දියුණු කරනු ලබන ක්ෂේත්‍ර තුළ උපරිම ප්‍රතිඵල ලබා ගත් වර්ෂයක් විය.

අපගේ සම්පත් කැනීම් කර්මාන්තයෙහි නිවහන වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වැඩි දියුණු කිරීම සහ නවීකරණය කිරීම සඳහා එකඟතාවයක් ඇති කර ගැනීම ඇතුළු දේශීය හා විදේශීය සේවාදායකයන් ශක්තිමත් කිරීම සඳහා වන අතිරේක පියවර අප විසින් නිර්මාණය කරනු ලබමින් පවතී.

වඩාත් පුළුල් ලෙස ගත් කළ අපගේ සමස්ත චින්තනය, තීරණ ගැනීමේ කාර්යය සහ කාර්ය සාධනය සවිමත් කරනු ලබන වඩාත් පරිපූර්ණ ප්‍රවේශයක් ඇතුලත් කිරීම මගින් ගෝලීය වශයෙන් ප්‍රජාවන් සහ පාර්ශ්වකරුවන් වෙත අපගේ ප්‍රවේශය වැඩි දියුණු කිරීමට අපි අදිටන් කරගෙන සිටිමු. කාර්යාංශය තුළ සේවය කරනු ලබන අපගේ සියලුම සේවක සේවිකාවන්ගේ කැපවීම සමග කුසලතාවය කාර්යාංශය සතුව ඇති අතර අපගේ වත්කම්වල ගුණාත්මකභාවය සහ සමාජය වෙත අප දක්වනු ලබන දායකත්වය මගින් අනාගතය පිළිබඳව සර්ව සුභවාදී වීමට මා දිරිමත් කරනු ලැබේ.

සංස්කෘතිකමය උරුමය සහ ප්‍රජාවන් හා සමාජ කාර්යසාධනය තුළ අපගේ නායකත්වය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි වර්ෂ 119 ක් තරම් දිගු ඉතිහාසය පුරාවට ගොඩ නගන ලද ශක්තිය සහ හැකියාවන් අප සතුව ඇත. තවද, 2021 වර්ෂය තුලදී අප විසින් ඉගෙන ගන්නා ලද පාඩම් තුලින් අනාගතයේදී වඩාත් හොඳ රාජ්‍ය ආයතනයක් ලෙස ඉස්මතු වීමට අප විසින් කටයුතු කරනු ලබන අතර සමාගමක කාර්යභාරය ගොඩනගනු ලබන පදනම වන්නේ සමාගමෙහි සංස්කෘතිය බව මාගේ විශ්වාසයයි.

තම ශක්තිමත් ආරක්ෂණ ප්‍රතිපත්ති නුදුරු අනාගතයේදී ප්‍රසිද්ධ කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අපේක්ෂා කරනු ලැබේ. 2020 වර්ෂය වනතුරු කිසි දිනෙක අත් කර නොගත් වැදගත් සංසිද්ධිස්ථානයක් ලෙස මෙය හැඳින්විය හැකිය. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීමට තම දායකත්වය ලබා දුන් සහ කැප වූ සිය ගණනක් වන සේවක සේවිකාවන් හා හවුල්කරුවන් වෙත පුද්ගලිකව ස්තුතිවන්ත වීමට මම කැමැත්තෙමි. එසේ වුවද, ප්‍රමුඛතම බනිජ කර්මාන්තකරුවා ලෙස සැලකෙන ප්‍රධාන රජයේ ආයතනය ලෙස අප විසින් ඉටු කළ යුතු තවත් බොහෝ කාර්යයන් ඇත.

අපගේ ආරක්ෂන කාර්යසාධනයෙහි සමස්ත අභිවෘද්ධිය සඳහා හා අපගේ මෙහෙයුම් කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මග පාදන අපගේ ආරක්ෂක පද්ධතීන් තවදුරටත් පරිපූර්ණ බවට පත් කිරීම කෙරෙහි 2022 වර්ෂයේදී අප විසින් අවධානය යොමු කරනු ලැබේ.

ගෝලීය වශයෙන් ව්‍යාප්ත වූ කොවිඩ් 19 වසංගත තත්ත්වයට මුහුණ දීමේදී එක් පවුලක් ලෙස අප විසින් ප්‍රතිචාර දක්වන ලද ආකාරය පිලිබඳව මා බෙහෙවින්ම ආඩම්බර වන අතර එහිදී අපගේ අරමුණ වූයේ අපගේ සේවක සේවිකාවන් හා ප්‍රජාවන් ආරක්ෂිතව සහ සෞඛ්‍ය සම්පන්නව තබා ගනිමින් අපගේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමත් අපගේ සේවාදායකයන්ට අවශ්‍ය සේවය වඩාත් හොඳින් අඛණ්ඩව ලබා දීමත්ය. නිදසුනක් ලෙස දින කිහිපයක කාලය තුළදී සේවක සේවිකාවන් සිය ගණනක් සඳහා රාජකාරී වේලාවන් වෙනස් කර වැඩ වාර සටහන් සකස් කිරීමට අප විසින් කටයුතු කරන ලදී. ආයුර්වේද මාර්ගෝපදේශ අනුගමනය කිරීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ආදිය ඇතුලත්ව සෞඛ්‍ය මාර්ගෝපදේශ හා අනුකූලව කටයුතු කරමින් අතිරේක සෞඛ්‍ය ක්‍රමවේදයන් අනුගමනය කිරීමටද අපි කටයුතු කළෙමු.

මුල් අවස්ථාවේදීම විශාල පරිමාණයෙන් සේවක සේවිකාවන් රෝගී තත්ත්වයේ තිබේදැයි පරීක්ෂාවට ලක් කරන ලද සහ එන්නත්කරණය සිදු කරන ලද දේශීය ආයතනවලින් එකක් ලෙස අප ආයතනය හැඳින්විය හැකිය. දිගු කාල පරිච්ඡේදයක් තම ආදරණීයයන් සහ පවුලේ සාමාජිකයන් වෙතින් ඈත්ව සිටිමින් මෙම කාලය තුළදී අපගේ සේවක සේවිකාවන් විසින් සුවිශේෂී කැප කිරීම් සිදු කරන ලදී. අප හට සක්‍රිය ලෙස සහාය දැක්වූ සහ අපගේ මෙහෙයුම් කටයුතු පහසුවෙන් පවත්වාගෙන යාම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දුන් ශ්‍රී ලංකා රජයට ස්තුති කිරීමට මා විසින් මෙය අවස්ථාවක් කර ගනු ලබන අතර රජය වෙත සුවිශාල මූල්‍යමය ප්‍රතිලාභයක් ලබා දීමට අපට හැකි වූ බව මාගේ විශ්වාසයයි.

මෙම වර්ෂය තුළදී ගෝලීය වශයෙන් කටයුතු කරමින් සහ කර්මාන්තයෙහි සංවර්ධනය සඳහා අපගේ වැඩිදියුණු කරන ලද සම්පත් පිළිබඳව මෙන්ම සම්පත් හා ආශ්‍රිත නව අරමුණු හා ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම ඉහළ නැංවීම සඳහා නව විෂය පථයක් අප විසින් සකස් කරනු ලබමින් පවතී. 2025

වර්ෂයේ සිට කඩදාසි භාවිතය අවම වශයෙන් 30% කින් අඩු කරනු ලබන තාක්ෂණයන් භාවිතා කරමින් අපගේ සේවාදායකයන් සමග ගනුදෙනු කිරීමට අපි කටයුතු කරමු.

කාර්යාංශයෙහි අභිවෘද්ධිය සඳහා දක්වන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන් ගරු අමාත්‍ය මහින්ද අමරවීර මහතාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට හෘදයාංගම ලෙස ස්තුතිවන්ත වීමට මම කැමැත්තෙමි. තවද, වසර ගණනාවක් තිස්සේ අපගේ කාර්යාංශය වෙත ලබා දෙන ලද වටිනා දායකත්වය වෙනුවෙන් සියළුම නිලධාරී මහත්ම මහත්මීන්ට සහ සේවක සේවිකාවන්ට මම ස්තුතිවන්ත වෙමි. ඉදිරි මාස සහ වර්ෂ දෙස බැලීමේදී, අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කණ්ඩායමක් ලෙස වෙහෙසවී කටයුතු කිරීමට අප විසින් මුහුණ දී ඇති සියළුම දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද, ඔබ හට හැකියාව ඇති බව මාගේ විශ්වාසයයි.

අපගේ මෙහෙයුම් කටයුතු සුරක්ෂිත හා කාර්යක්ෂම බවත්, අපගේ සේවාදායකයන් වෙත ඉහළ ගුණාත්මකභාවයක් සහිත විශ්වාසනීය සේවාවක් ලබා දෙමින් 2022 වර්ෂයේදී මෙන්ම ඉදිරියටත් මෙකී මෙහෙයුම් කටයුතු මනා ලෙස පවත්වා ගෙන යනු ලබන බවටත්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස මම ඔබට සහතික වෙමි. තිරසර නවෝත්පාදනයන් තුළ ආයෝජනයන් සිදු කර අපගේ ව්‍යාපාර කටයුතු වර්ධනය කර රැකියා අවස්ථා නිර්මාණය කරමින් දේශීය ව්‍යාපාර සමඟ හවුල්කාරිත්වයන් සහිතව කටයුතු කරමින් රජය වෙත ගෙවිය යුතු බදු සහ අනිකුත් ගාස්තු අඛන්ඩව ගෙවීමට අපි කටයුතු කරමු. සිය ගණනක් වන අපගේ සේවක සේවිකාවන්ගේ සහ සේවාදායකයන්ගේ කැපවීම සහ වෙහෙස මහන්සි වී සේවය කිරීම නොමැති නම් මේ කිසිවක් සිදු කළ නොහැකි වනු ඇත.

අවසාන වශයෙන්, අපගේ ජයග්‍රහණය යථාර්ථයක් බවට පත් කිරීමට කටයුතු කළ ශ්‍රී ලංකා රජයට, අපගේ හිතවත් සේවාදායකයන්ට සහ හවුල්කරුවන්ට මාගේ හෘදයාංගම කෘතවේදීභාවය පුද කිරීමට මම කැමැත්තෙමි.

ඔබට ජය පතමි.

ඉංජිනේරු සජ්ජන ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පිළිබඳ කෙටි විමසා බැලීමක්

මෙම ව්‍යවස්ථාපිත ආයතනයෙහි ප්‍රධාන අරමුණ වනුයේ ඛනිජ ගවේෂණය, ප්‍රවාහනය, සැකසීම, වෙළඳාම් කිරීම සහ ඛනිජ නිෂ්පාදන අපනයනය නියාමනය කිරීමයි. 1992 අංක 33 දරණ පතල් හා ඛණිජ පනත යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ස්ථාපිත කරන ලදි. 1903 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද පැරණිතම රාජ්‍ය ආයතන වලින් එකක් වූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කාර්යයන් පැවරීම සඳහා ප්‍රතිපාදන මෙම පනතෙහි වගන්තියක් මගින් ලබා දෙනු ලැබේ.

ඛනිජ සංවර්ධනය භාර ප්‍රධානතම ආයතනය ලෙස කාර්යාංශය පිහිටුවීම මගින් ඛනිජ පාදක කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු කැපවීම තහවුරු කරනු ලැබේ.

වැඩි මූදලක් වැය වන ආනයනයන් සඳහා ආදේශක ලබාදීම, ගොඩනැගිලි හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා අවශ්‍ය වෙළඳ භාණ්ඩ ලබාදීම සහ අපනයන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා දීම මගින් රැකියා උත්පාදනය කිරීම සහ රටට ආදායම උත්පාදනය කිරීම ඛනිජ මගින් සිදු කරනු ලැබේ. ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වාගෙන යෑම සහ මෙම තොරතුරු මහජනතාව වෙත ලබා දෙනු ලබන බව සහතික කිරීම සම්බන්ධයෙන් කාර්යාංශය වගකිව යුතු වේ.

තවද අප රටෙහි ඛනිජ සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම කාර්යාංශයෙහි සුවිශේෂී කාර්යයක් වේ. රටෙහි සුභ සිද්ධිය සඳහා ඛනිජ සතු ශක්තිය අවබෝධ කර ගනු ලබන බව සහ කාර්යක්ෂම, ආරක්ෂිත සහ පාරිසරික වශයෙන් ශක්තිමත් ආකාරයකින් ඛනිජ නිස්සාරණය කරනු කරගනු ලබන බව සහතික කිරීම එහි ප්‍රධාන කාර්යයක් වේ. ක්‍රමවත් ලෙස භූ විද්‍යා සිතියම් සැකසීම සහ රටෙහි ඛනිජ සම්පත් තක්සේරු කිරීම කාර්යාංශයේ ප්‍රධාන වගකීම් වේ.

පසුගිය කොටස් වල සාකච්ඡා කරන ලද කාරණාවන්ට අදාළව කාර්යාංශය විසින් දැන්ටමත් සිය ඉලක්ක සපුරා ගනු ලැබ ඇත. එසේ හෙයින් සභාපතිවරයා විසින් යෝජනා කරන ලද පරිදි, සාකච්ඡා කිහිපයක් මත පදනම්ව පිළිවෙලින් ව්‍යුහාත්මක වෙනස්කම් සහ කාර්ය පටිපාටිමය වෙනස්කම් යන ශීර්ෂ යටතේ ඉදිරි වර්ෂය සඳහා යෝජිත සැලැස්ම ඉදිරිපත් කිරීමට යෝජනා කරනු ලැබේ.

ව්‍යුහාත්මක වෙනස්කම් යටතේ පහත සඳහන් මාතෘකා සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ.

- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාලනය කරනු ලබන පනත සහ රෙගුලාසි සංශෝධනය කිරීම
- දුම්රිය යොදා ගනිමින් ඛනිජ ප්‍රවාහනය කිරීම
- අගය එකතු කිරීම- ඛනිජ සැකසීම
- හුණුගල් සඳහා වන රාජ්‍ය භාගය වැඩි කිරීම
- ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් පද්ධතිය
- ජනාධිපති කාර්ය සාධක බලකායෙහි තීරණ ක්‍රියාත්මක කිරීම
- ගවේෂණ බලපත්‍ර
- කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරන සේවකයන් වෙතින් මතුවන ගැටලු
- කාර්මික ඛනිජ ප්‍රර්ධනය කිරීම

රටෙහි දළ දේශීය නිෂ්පාදනය සඳහා දක්වන දායකත්වය 0.1% සිට 4% දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය කිරීමට කාර්යාංශය විසින් අපේක්ෂා කරනු ලැබේ.



මෙම විශ්ලේෂණය කාර්යාංශයේ වත්මන් තත්ත්වය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය කිරීමට හැකි වේ එය ශක්තිමත් කිරීම මගින් එහි කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා ව්‍යුහාත්මක ගැලපීම්. තුළ සම්මත **SWOT** විශ්ලේෂණයක් ශක්තීන් සහ දුර්වලතා අභ්‍යන්තර සාධක ලෙස සැලකේ නමුත් අවස්ථා සහ තර්ජන බාහිර වේ.

GSMB හි ශක්තිය

කාර්යාංශයේ ප්‍රධාන ශක්තිය වන්නේ එයබල ගැන්වෙන නියාමන අධිකාරිය වන 1992 පතල් හා ඛනිජ පනතයි. ඛනිජ කළමනාකරණය සහ ඛනිජයේ නියාමන බැඳීම් ඉටු කිරීම, අවශ්‍ය ප්‍රමිතීන් සමඟ විශිෂ්ට ප්‍රවීණ පළපුරුදු කාර්ය මණ්ඩලය කාර්යාංශය ශක්තිමත් කර ඇත. පළපුරුදු රසායනාගාරය වෘත්තිකයන්ගේ කණ්ඩායම, නවීන තාක්ෂණ උපකරණ කාර්යාංශයේ අද්විතීය ශක්තීන් ලෙස සැලකේ.

වසර සියයකට වඩා දිගු සේවා සපයන්නා ලෙස කාර්යාංශයේ කීර්තිය ප්‍රධාන ශක්තීන්ගෙන් එකකි ලෙස සැලකේ. ඛනිජ පිළිබඳ සමුච්චිත දැනුම, දිගුකාලීනව සංවර්ධිත උපාය මාර්ග, ඛනිජ ගවේෂණයේ සම්මතයන් සහ ඒ ආශ්‍රිත විෂයයන් කාර්යාංශය මෙම අංශයේ පුරෝගාමී ආයතනය බවට පත් කරයි.

අවශ්‍ය වැඩිදියුණු කිරීම්

පවතින ව්‍යුහාත්මක දුර්වලතාවලට අමතරව මූලික වෘත්තීයවේදීන් සහ සහායක කාර්ය මණ්ඩලය අතර අසමතුලිතතාවය ප්‍රධාන බාධාව ලෙස සැලකේ. අඩුවෙමින් පවතින වෘත්තිකයන් සහ වෘත්තීය නොවන අනුපාතය නිසා කාර්යාංශය දරාගත නොහැකි වැඩකටයුතුවලට උරදෙන ආයතනයක් බවට පත් කරයි. ඛනිජ ගවේෂණය සහ බලපත්‍ර නිකුත් කිරීම වැනි ප්‍රධාන කණ්ඩායම් සහ මූලික කාර්යයන් තිබියදීත්, සහායක කාර්ය මණ්ඩලය එකතු වී තිබියදීත්, දශක ගණනාවක් තිස්සේ අඛණ්ඩව පවතී. කලාපීය සැකසුම හරහා බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව විමධ්‍යගත කිරීම කාර්යාංශයේ තවත් දුර්වලතාවයකි, එය පොදු කාර්ය සඳහා දැඩි ලෙස එකතු කර ඇත. කාර්යාංශයේ සෑම අංශයකම පාහේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (ධජ) නොමැතිකම එහි ක්‍රියාකාරකම් පිළිබඳ තීරණ පුද්ගලීකරණය කිරීමට ඉඩ සලසන විශාල දුර්වලතාවයකි. කාර්මික ඛනිජ නිපදවීමට ප්‍රධාන දායක සාධකයක් වන අවස්ථාවන් නොසලකා හරිමින් නිසි විශ්ලේෂණයක් සිදු නොකර, අමුද්‍රව්‍ය, විශේෂයෙන් වැලි මත, අමුද්‍රව්‍ය තැනීම සඳහා කාර්යාංශය සිය මිනිස් බලය සහ සම්පත් විශාල වශයෙන් ආයෝජනය කර ඇත. රාජකීයත්වය අත්පත් කර ගැනීම සඳහා ආරක්ෂිත යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ අසාර්ථක/අඩුපාඩු කාර්යාංශයේ මූල්‍ය ශක්තිය බාදනය කරන ලද අඩුපාඩුවකි.



උරගා නොබැලූ ශක්තීන්

නිදහස් සහ විවෘත ආර්ථික පරිසරය තුළ රජයේ නියාමන කාර්යයන් ඉටු කරන ආයතන වල පැවැත්ම රඳා පවතිනුයේ ඒවා විසින් අත් කර ගනු ලබන පරිවර්තනයන් මතය. නියාමන සම්මතයන් කිසිදු ආකාරයකින් හානියට ලක් නොකරමින් අදාළ අංශයෙහි සියලුම ක්‍රියාකරුවන් හට ක්‍රියාත්මක වීම සඳහා සමාන වූ ඉඩකඩ සලසා දෙමින් දැඩි නියාමන භූමිකාවේ සිට මිත්‍රශීලී පහසුකම් සපයන්නකු බවට පරිවර්තනය වීමට/ විකසනය වීමට වර්තමානයේදී කාර්යාංශය වෙත අවස්ථාවක් ලැබී ඇත.

ආයෝජනයන් ආකර්ශනය කර ගැනීම සඳහා අමුද්‍රව්‍යවල සුරක්ෂිතතාවය තහවුරු කරමින් ඛනිජ ආයෝජන අංශය සඳහා පහසුකම් සැලසිය යුතුය යන කාරණය දශක ගණනාවක් තිස්සේ කාර්යාංශය විසින් තවදුරටත් මග හරිනු ලැබ ඇත.

මතුවිය හැකි තර්ජනයන්

ඉදිකිරීම් කර්මාන්තය අර්ධ ලෙස බිඳවැටීම හේතුවෙන් තවදුරටත් නරක අතට හැරී ඇති සහ පෙර නොදුටු විරූ ආකාරයට ඉහළ ගොස් ඇති පොදු කාර්ය පිරිවැය කාර්යාංශය වෙත එල්ල වී ඇති ආසන්නතම සහ කෙටිකාලීන තර්ජනය වේ. කමිටු සහ අනෙකුත් ආයතන සම්බන්ධ වන බාහිර බලධාරීන් වෙත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කටයුතු විමධ්‍යගත කිරීම මධ්‍යකාලීන තර්ජනයන් වේ. විදේශ රටවල වඩාත් හොඳ රැකියා අවස්ථාවන් සොයමින් වෘත්තීය කාර්ය මණ්ඩලය කාර්යාංශය අත්හැර යාම කාර්යාංශය වෙත එල්ල වී ඇති දිගුකාලීන තර්ජනයක් වන අතර සමස්තයක් ලෙස කර්මාන්තය කෙරෙහි සුවිශාල බලපෑමක් එමගින් ඇති කරනු ලැබිය හැකිය.

කළමනාෘ



වෛද්‍ය සෙනරත් හේවගේ මහතා
අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති



ඒ. ආර්. වික්‍රමරත්න මහතා
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩබ්. ඩී. එස්. සී. වැලිවිට මහතා -
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



අයි. සී. පතිරාජ මහතා -
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ටී. එච්. එම්. පී. සාගර මහතා -
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඉංජිනේරු සජීජන ද සිල්වා මහතා -
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ටී. එච්. එක්නැත්ගෙදර මහතා
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



කේ. වී. ජගත් කීර්ති කුමාර මහතා
- අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
(2020 ඔක්. 2021 ඔක්.)



එස්. එන්. බී. තල්දෙන
මෙනවිය -
අධ්‍යක්ෂ මණ්ඩල

ජ්‍යෂ්ඨ කළමනාකාරිත්වය



ආචාර්ය ඩබ්.අයි.එස්.ප්‍රනාන්දු
ජ්‍යෂ්ඨ අධ්‍යක්ෂ (භූ විද්‍යා) වැඩබලන



එම්. එච්. ජේ. පී. අජිත්ප්‍රේම මහතා
අධ්‍යක්ෂ (සිතියම් හා භූ විද්‍යා තොරතුරු)



කේ. ඒ. එච්. ලියනාරච්චි මහත්මිය
අධ්‍යක්ෂ (ඛනිජ හිමිකම්)



වයි. පී. එස්. සිරිවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ (විද්‍යාගාර හා භෞතික පරීක්ෂණ)



එල්. ඒ. ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ (පාරිසරික බලපෑම් ඇගයීම් සහ ප්‍රාදේශීය)



කේ. වී. ජගත් කීර්තිකුමාර
අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා)



යූ. ජේ. පී. සේනාරත්න මහතා
අධ්‍යක්ෂ (මානව සම්පත්)



සුමේධා රාහුබද්ද මහත්මිය
අධ්‍යක්ෂ (මූල්‍ය)



එම්. එස්.කේ ප්‍රනාන්දුමහත්මිය
අධ්‍යක්ෂ (නීති රා.ඉ.)

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ඉදිරි ක්‍රමෝපායන්

කාර්යපටිපාටිමය වෙනස්කම් යටතේ පහත සඳහන් මාතෘකා සාකච්ඡාවට ලක් කරනු ලැබේ.

01 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාලනය කරනු ලබන පනත සඳහා සංශෝධන සිදුකිරීම. මෙහෙයුම්/ කාර්යමය දුෂ්කරතාවයන් මගහරවා වර්තමාන වෙළඳපොළ අවශ්‍යතාවයන් හා අනුගතව යාවත්කාලීන වීමට මෙය පහසුවක් වනු ඇත. මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා විශේෂඥ මග මගපෙන්වීම /සහාය ලබා ගනිමින් හඳුනාගනු ලැබූ සංශෝධන පිළිබඳ කටයුතු අවසන් කිරීමට තීරණය කරනු ලැබ ඇත.

02 කාර්යාංශයෙහි කටයුතු පහසුවෙන් සිදුකර ගෙන යෑම සඳහා කාර්ය පටිපාටිමය කාර්ය සංග්‍රහයක් සම්මත කර ගනු ලැබීම. බාහිර මානව සම්පත් උපදේශකයකු හට මෙම කාර්යය පැවරීමට තීරණය කරන ලදි.

03 සේවකයන්ගේ ගැටලු අවම කිරීම සඳහා බඳවා ගැනීමේ පටිපාටිය වෙනස් කරනු ලබන අතර එම කාර්යය මානව සම්පත් අංශය වෙත පවරනු ලබනු ඇත.

04 ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ඛනිජ වර්ග පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා, ශ්‍රී ලංකාවෙහි භූ විද්‍යා සිතියම්, ඛනිජ සහ චාතුර්තික සිතියම් පිළියෙල කිරීමට යෝජනා කරනු ලැබේ. දකුණු පළාත් ඛනිජ සිතියම සකස් කිරීම හා මුද්‍රණය කිරීම, කතිරවේලි, කල්කුඩා-වාකරේ යන ප්‍රදේශ වල ක්ෂේත්‍ර සහ විද්‍යාගාර කටයුතු ද මෙමගින් ආවරණය කරනු ඇත.

05 ව්‍යවසායකත්ව සම්පත් සැලසුම් කිරීම- රජයේ ප්‍රසම්පාදන කාර්යපටිප-ාටිය හා අනුගතව මෙම කාර්යය ඉටු කරනු ලබන අතර එමගින් මෙහෙයුම් කාර්යයන් විධිමත් කිරීම සඳහා සහ ආයතනයෙහි වලදායිත්වය ප්‍රශස්ත මට්ටමට ගෙන වීම සඳහා සහාය වනු ඇත.

06 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයහි ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා ISO 9000/2015 තත්ත්ව කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉල්ලුම් කිරීමට තීරණය කරන ලදී.

07 විශේෂයෙන්ම චික් වහලක් යටදී කාර්මික ඛනිජ ද්‍රව්‍ය සැපයීම සඳහා තනි නැවතුම් සාප්පුව යන සංකල්පය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදි. රජයේ ආයතන සම්බන්ධයෙන් ලේඛන පිළියෙල කිරීම සඳහා දැරිය යුතු වන වෙහෙස මෙමගින් දුරලනු ඇත.

08 නිවැරදි තොරතුරු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා එවැනි තොරතුරු මුද්‍රිත මාධ්‍ය වල පළ කිරීමට තීරණය කරන ලදී.

09 පහත සඳහන් කාර්යයන් ඇතුළත්ව, කැණීම් අංශයෙහි 2023 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම, ආයතනික සැලැස්ම සහ වාර්ෂික වාර්තාව පිළිබඳ කටයුතු අවසන් කිරීමට තීරණය කරන ලදි.

(i) වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අක්වෙරළ වැලි කැනීම් සඳහා කැණීම් බලපත්‍ර දෙකක් ලබා දීම.

(ii) මාලදිවයින් රාජ්‍යය වෙත මුහුදු වැලි කියුබික් මීටර් සීයක් අපනයනය කිරීම සඳහා වන ක්‍රියාවලිය පහසු කරලීම.

(iii) මහා පරිමාණ පුනරුත්ථාපන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(iv) සෙසු ප්‍රදේශ සඳහා ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ඉදිරියටත් පැවැත්වීම.

10 ප්‍රාදේශීය කටයුතු පිළිබඳ විෂය පථය පුළුල් කිරීමට සහ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවීම මගින් ප්‍රාදේශීය කාර්යාල වැඩි දියුණු කිරීම සඳහා යෝජනා කරනු ලැබ ඇත.

11 අක්වෙරළ කැණීම් බලපත්‍ර මත පදනම්ව කැණීම් අංශය තුළින් ආදායම් උත්පාදනය කර ගැනීමට යෝජනා කරනු ලැබ ඇත.

12 පරිසරය වෙත ඇතිකරනු ලබන බලපෑම යථා තත්ත්වයට පත් කිරීම සඳහා එක් ප්‍රදේශයක් සඳහා කැණීම් ආරක්ෂණ අංශය විසින් පුනරුනරුත්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරනු ලැබ ඇත.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව කාර්යාංශය විසින් සිය සමස්ත ආදායමෙන් 15%ක ආදායම් බද්දක් ගෙවන අතරතුරම 2021 වර්ෂය තුළදී ඒකාබද්ධ අරමුදල වෙත රුපියල් බිලියන 2ක මුදලක් ලබාදී ඇති බව දැනුම් දෙන්නේ සතුටිනි.

ක්‍රමෝපායික අරමුණු

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වැඩසටහන්වල පුළුල් විවිධත්වය සහ සංකීර්ණභාවය සලකා බැලීමේදී, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඉටු කරනු ලබන සියළුම කටයුතු හා අදාළව එකී ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් එය සතු අරමුණුවල ලේඛනයක් ලෙස, සැලසුම හැඳින්විය නොහැකි වන අතර, මෙම අරමුණු සපුරා ගැනීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අනුගමනය කිරීමට අදහස් කරනු ලබන ප්‍රධාන ප්‍රවේශයන් පෙන්නුම් කරනු ලබන ප්‍රධාන ක්‍රමෝපායන් සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් අතකර ගැනීමට බලාපොරොත්තු වන වැදගත් වෙනස්කම් හා ප්‍රතිඵල නිරූපණය කරනු ලබන ප්‍රමුඛතාගත අරමුණු සැලැස්ම මගින් ඉදිරිපත් කරනු ලැබේ.



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සඳහා අදාල අරමුණු හා ක්‍රමෝපායන් 10ක් දක්නට ලැබෙන අතර ඒවා එක් එක් ක්‍රමෝපායක කාර්ය රාමු හතර යටතේ ඒවාට අදාළව අත් කර ගත යුතු අදාළ ක්‍රමෝපායන් යටතේ දක්වා ඇත.

කාර්යාංශය ගැන

අපි ශ්‍රී ලංකාවේ ඛනිජ කර්මාන්ත සඳහා මඟපෙන්වීම ලබා දෙමු.

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ සේවා සැපයීම සඳහා පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඛනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය වන අතර ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ වගකීම මෙමගින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ ඛනිජ සංවර්ධනය සඳහා බලයලත් ආයතනය වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මේ දක්වා ඛනිජ ගවේෂණ කටයුතු සිදු කර ඇති ආයතනය වන අතර එතුළින් රට වෙත ප්‍රතිලාභ සලසා දී ඇත.

ශ්‍රී ලංකාව කුඩා රටක් වන හෙයින් එහි උප පෘෂ්ඨීය ඛනිජ සම්පත ද කුඩා මට්ටමක පවති. එහෙයින් කාර්යාංශය විසින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීම දිරිගන්වන අතරම ඛනිජ අරපිරිමැස්මෙන් යුතුව භාවිතා කිරීමද අවධාරණය කරනු ලැබේ. එලෙසම ඛනිජ යනු පුනර්ජනනීය නොවන වාණිජ ද්‍රව්‍යයන් වන හෙයින් ඒවා අපතේ යැවීමට එරෙහිව අනතුරු ඇඟවීම් ද සිදු කරනු ලැබේ.

ජාතියට භූ විද්‍යාත්මක ශක්‍යතාවයන් ලබා දෙන ප්‍රමුඛයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පෘථිවියේ ඇති සම්පත් හා ඒ ආශ්‍රිත ගැටළු හා ප්‍රශ්න පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම සිදු කරනු ලැබේ. බහුවිධ වූ විද්‍යාත්මක විශේෂඥ දැනුම මගින් බහු විෂයයීක ගවේෂණ සිදු කිරීමට අප හට හැකියාව ලබා දෙනු ලබන අතර සම්පත් කළමනාකරුවන්, සැලසුම්කරුවන් සහ අනිකුත් පාරිභෝගිකයින් වෙත භූ විද්‍යා සිතියම් මාලාවක් ඇතුළු භූ විද්‍යා තොරතුරු අපක්ෂපාතී ලෙස ලබා දෙනු ලැබේ. පෘථිවිය පිළිබඳ තොරතුරු ලබා ගැනීම සහ අවබෝධ කර ගැනීම, ස්වාභාවික ව්‍යසන වලින් ජීවිත වලට සහ දේපලවලට සිදුවන හානි අවම කර ගැනීම, භූ විද්‍යාමය බලශක්ති සහ ඛනිජ සම්පත් කළමනාකරණය කිරීම සහ අපගේ ජීවිතවල ගුණාත්මකබව ආරක්ෂා කිරීම සහ ඉහළ නැංවීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ජාතිය වෙත සේවය සලසාලනු ලැබේ.

මූලික මෙහෙයුම් කටයුතු 4 ක් කාර්යාංශය සතුව ඇත. භූ විද්‍යා සිතියම් සැකසීම - ඛනිජ ගවේෂණය, ඛනිජ හිමිකම් සහ කැනීම් රෙගුලාසි (ප්‍රධාන කාර්යය) සේවාදායකයන් අරමුණු කරගත් කටයුතු (ඛනිජ සම්පත් ගවේෂණ, විද්‍යාගාර සේවා, භූ භෞතික හා කැනීම් කටයුතු පිළිබඳ එකඟතාවයන්) සහ භූ විද්‍යාත්මක තොරතුරු ලබා දීම (පළ කරන ලද හෝ පළ නොකරන ලද වාර්තා සඳහා ප්‍රවේශය සහ සිය පුස්තකාලය තුළ ඇති සිතියම් හා වෙනත් ලේඛන) එම කාර්යයන් වේ.

නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ සහ පොලොන්නරුව දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රාදේශීය කාර්යාල 15 ක් සහ හසලක සහ කන්තලේ පිහිටි උප කාර්යාල 2 ක් සහිතව කැනීම් අංශය වර්තමානයේදී ක්‍රියාත්මක වේ. මෙම ප්‍රාදේශිය කාර්යාලවල ප්‍රධාන කටයුතු වන්නේ අදාල පළාත් තුළ විවිධ කැනීම් කර්මාන්තවල නිරත පාරිභෝගික ජනතාව වෙත වඩාත් හොඳ සේවාවක් ලබා දීමත් නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීමත් ය.


Anuradhapura
Kandy

ඓතිහාසික පසුබිම



1903 වර්ෂයේදී ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතාගේ මූලිකත්වය යටතේ ආරම්භ කරන ලද ලංකා ඛනිජ සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිට ශත වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ පැවතුණ භූ විද්‍යා දෙපාර්තමේන්තු මාලාවක සාඩම්බර අනුප්‍රාප්තිකයා ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය. රටේ ඛනිජ සම්පත් පිලිබඳව තොරතුරු අනාවරණය කර ගැනීම, ප්‍රවර්ධනය කිරීම සහ ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තු විසින් ඉතිහාසය පුරාම සුවිශේෂී වාර්තාවක් තබා ඇති අතර එකී කාර්යය වෙනුවෙන් රට තුළ දැනට ක්‍රියාත්මක වන සියළුම ඛනිජ කර්මාන්ත ණයගැති වේ.

1939දී ඛණිජ ගවේෂණ දෙපාර්තමේන්තුව ඛනිජ විද්‍යා දෙපාර්තමේන්තුව ලෙස නම් කරන ලද අතර 1962 දී භූ විද්‍යා සමීක්ෂණ දෙපාර්තමේන්තුව ලෙස එය නැවත නම් කරන ලදී. 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව 1993 මාර්තු මස 18 වැනි දින කාර්යාංශය පිහිටුවන ලද අතර එතුලින් භූ විද්‍යා සමීක්ෂණ කටයුතු සමඟනූතන පතල් දෙපාර්තමේන්තුවක් සතු නව වගකීම් ද ඒකාබද්ධ කරන ලදී.

ඛනිජ සංවර්ධනය පිළිබඳ ප්‍රමුඛතම ආයතනය ලෙස කාර්යාංශය පිහිටුවීම තුළින් ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා රජය සතු වගකීම් ඉටු කිරීම අවධාරණය කරනු ලැබේ. මිල අධික ආනයන සඳහා ආදේශක සැපයීම, ගොඩනැගිලි සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා භාණ්ඩ ලබා දීම සහ අපනයන කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලබා දීම තුළින් රට තුළ රැකියා නිර්මාණය කිරීම සහ රටට ආදායම උත්පාදනය කිරීම සඳහා ඛනිජ දායක වෙයි. ජාතික භූ විද්‍යා දත්ත පදනම පවත්වා ගැනීම සහ මෙම තොරතුරු මහජනතාවට ලබා දෙන බවට වගබලා ගැනීම උදෙසා ද කාර්යාංශය වගකීම දරයි.

කොවිඩ් 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් අපගේ ප්‍රතිචාරය



Wash Hand

1. මහජනතාව වෙත සේවය සලසා දීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ලෙස 2021 වර්ෂයේ පළමු අර්ධය තුළදී චක්‍රලේඛන කිහිපයක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලදී.

2. කොවිඩ් 19 වසංගත තත්ත්වයෙහි බලපෑම අඩු කිරීම සඳහා යම් ශක්‍යතාවයකින් ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක කිරීම උදෙසා වන විවිධ ක්‍රියාමාර්ග භූ.ස.ප.කා. විසින් පැහැදිලි කරන ලදී.



Use Soap

3. ගර්භනී සේවිකාවන් සහ කිරි දෙන මවුවරුන් වැනි පුද්ගලයන් තම නිවාස සහ කාර්යාල වලින් බැහැර නොයාමට සැලැස්වීම වැනි ක්‍රියාමාර්ග අප විසින් ගන්නා ලද අනිකුත් ක්‍රියාමාර්ග වලට ඇතුලත් විය.



Avoid Crody

4. කාර්යාලයෙහි සේවයෙහි නිරත වන අතරතුරදී කොවිඩ් 19 රෝගය වැළඳී ඇති බවට හඳුනාගනු ලබන සේවකයන් හට වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම සඳහා මූල්‍යමය සහාය ලබා දෙන ලදී.

5. එන්නත් ලබා ගැනීම සඳහා වැඩි අවස්ථාව ලබා දීම සඳහා ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.



Use Masker

6. නව සෞඛ්‍ය සනීපාරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය උපකරණ හා පහසුකම් හඳුන්වා දීම සහ අනුගමනය කළ යුතු සෞඛ්‍යමය ක්‍රියා පිළිවෙත් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීම.

7. තමාට සමීපතම කාර්යාලයට ගොස් සේවයට වාර්තා කිරීම සඳහා සේවකයන්ට අවසර ලබා දීම.



Use Distinction

8. සේවයට කැඳවීමේදී රාජකාරී ලේඛන ක්‍රමයක් අනුගමනය කිරීම.



Avoid Shakehand

භූ විද්‍යා අංශය

භූ විද්‍යා අංශයෙහි ප්‍රගතිය කාණ්ඩ 3 ක් යටතේ විස්තර කරනු ලැබේ. (1) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රතිපාදන මගින් මූල්‍ය සම්පාදනය කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් කටයුතු (2) සේවාදායකයන්ගේ ඉල්ලීම් මත ක්‍රියාත්මක කරනු ලබන සේවාදායක ප්‍රතිචාර ව්‍යාපෘති සහ (3) කෙටි ක්ෂේත්‍ර සංචාර, රැස්වීම්, පුහුණුවීම් සහ ප්‍රකාශන ඇතුලත් වෙනත් කටයුතු

1.1. ක්‍රියාකාරී සැලසුම් කටයුතු (භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රතිපාදන)

භූ විද්‍යා අංශයෙහි 2021 වර්ෂය සඳහා අදාල ක්‍රියාකාරී සැලසුම් කටයුතු ප්‍රධාන කාර්යසාධන ක්ෂේත්‍ර 4 ක් යටතේ ක්‍රියාත්මක කරන ලදී.

එම්.පී.ඒ. -1 සිතියම් සැකසීම, භූ රසායනික තොරතුරු (භූ දත්ත) නිර්මාණය කිරීම සහ දත්ත ප්‍රචාරණය කිරීම

එම්.පී.ඒ. -2 ඛනිජ පරීක්ෂණ, භූ භෞතික පරීක්ෂණ සහ සම්පත් ඇගයීම

එම්.පී.ඒ. -3 පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පෘථිවි ලක්ෂණ සහ භූ කම්පන අධීක්ෂණය

එම්.පී.ඒ. -4 සිතියම් සැකසීම, භූ රසායනික තොරතුරු (භූ දත්ත) නිර්මාණය කිරීම සහ දත්ත ප්‍රචාරණය

එම්.පී.ඒ. - 1 සිතියම් සැකසීම, භූ රසායනික තොරතුරු (භූ දත්ත) නිර්මාණය කිරීම සහ දත්ත ප්‍රචාරණය කිරීම

අ) භූ විද්‍යා සිතියම් මුද්‍රණය කිරීම:

මුළු ශ්‍රී ලංකාවම ආවරණය කරනු ලබන භූ විද්‍යා සිතියම් පලකිරීම කාර්යාංශයේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි. ඛනිජ හා භූගත ජලය ගවේෂණය, ප්‍රධාන ඉදිකිරීම් හා සිවිල් ඉංජිනේරු කාර්යයන් සහ නායයෑම් උවදුරු සිතියම් පිලියෙල කිරීම ආදී කාර්යයන් ගණනාවක් සඳහා භූමිය පිළිබඳ භූ විද්‍යා තොරතුරු ඇතුලත් භූ විද්‍යා සිතියම් යොදා ගනු ලැබේ. මුළු රටම ආවරණය වන පරිදි භූ විද්‍යා සිතියම් (1: 100,000 පරිමාණයේ) 21 මුද්‍රණ කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2014 වර්ෂයේදී නිම කරන ලදි. 1:25,000 පරිමාණයේ භූ විද්‍යා සිතියම් සැකසිම 2019 වර්ෂයේදී ආරම්භ කරන ලදි.මිනුම්දෝරු දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන 1:50000 පරිමානයේ ඊඑඡ සිතියම් මත පදනම්ව මෙය සිදු කරනු ලැබේ.මෙම වැඩ සටහන යටතේ පළමු සිතියම ලෙස නිලාවැලි කලාපය (අංක 23) තෝරා ගන්නා ලදි.ක්ෂේත්‍ර කටයුතු (සිතියම් සැකසිම) 2019 වර්ෂයේදී නිම කරන ලද අතර විද්‍යාගාර විශ්ලේෂන කටයුතු සිදු කරනු ලබමින් පවතී . සමස්ත රටම ආවරණය කරනු ලබන 1:500,000 පරිමාණයේ භූ විද්‍යා සිතියමක් සකස් කරනු ලබමින් පවතින අතර 2022 මාර්තු මස අවසානය වන විට එය මුද්‍රණය සඳහා ලබා ගත හැකි වනු ඇත.





1 රූප සටහන : නිලාවැලිහි 1:25,000 පරිමාණයේ භූවිද්‍යා සිතියම (වම්පස) සහ 1:50,000 පරිමාණයේ සමස්ත දිවයිනෙහිම සිතියම (දකුණු පස)ග

චාතුර්ථික සිතියම් (වෙරළබඩ කලාපීය) වැඩසටහන

භූ විද්‍යා කාල පරිමාණයට අයත් චාතුර්ථික කාල පරිච්ඡේදය වර්තමානයේ සිට අවුරුදු මිලියන 2කට පෙර අතීතයේ සිට වර්තමානය දක්වා දිව එයි. ශ්‍රී ලංකාවේ චාතුර්ථික සැකසීම් වෙරළබඩ අවසාදිතයන්ට හා ජලගැලිම් ඇති වන තැනිතලා ප්‍රදේශවල දියළුමය අවසාදිතයන්ට සීමා වන අතර පස් සැකසීම් ඒ තුළට ඇතුළත් වේ. එහෙත් මෙම සැකසීම් තුළ ආර්ථිකමය ලෙස වැදගත් මැටි හා වැලි නිධි, කොරල් තැන්පතු, සශ්‍රික පස් ආවරණ සහ භූගත ජල ප්‍රභව අන්තර්ගත වන හෙයින් ඒවා අතිශයින්ම සුවිශේෂී වේ. චාතුර්ථික භූ විද්‍යා සිතියම් සැකසීම නම් ව්‍යාපෘතිය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2008 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

චාතුර්ථික සිතියම් සැකසීමේ වැඩසටහන යටතේ සිතියම් මුද්‍රණය කිරීම

මාතර, අම්බලන්ගොඩ - බලපිටිය සහ කළුතර චාතුර්ථක සිතියම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මීට පෙර පළ කරන ලද අතර හම්බන්තොට - තංගල්ල සහ පුත්තලම යන සිතියම් 2021 වර්ෂයේදී පල කරන ලදී. මීට අමතරව සිලාවතුර සහ තිස්සමහාරාම යන සිතියම් සැකසීමේ කටයුතු නිම කරන ලද අතර එකී සිතියම් සංස්කරණ මණ්ඩලය වෙත භාර දෙනු ලැබ ඇත.

චාතුර්ථික සිතියම් සැකසීමේ වැඩසටහන යටතේ සිතියම් මුද්‍රණය කිරීම

මාතර, අම්බලන්ගොඩ - බලපිටිය සහ කළුතර චාතුර්ථක සිතියම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් මීට පෙර පළ කරන ලද අතර හම්බන්තොට - තංගල්ල සහ පුත්තලම යන සිතියම් 2021 වර්ෂයේදී පල කරන ලදී. මීට අමතරව සිලාවතුර සහ තිස්සමහාරාම යන සිතියම් සැකසීමේ කටයුතු නිම කරන ලද අතර එකී සිතියම් සංස්කරණ මණ්ඩලය වෙත භාර දෙනු ලැබ ඇත.

චාතුර්ථක සිතියම් සැකසීමේ කටයුතු

කල්පිටිය, යාල, ගාල්ල සහ විල්පත්තු කලාපවල සිතියම් සැකසීමේ කටයුතු සිදුකරනු ලබමින් පවතින අතර හලාවත සහ බක්කුළු ඔය 1 : 50,000 සිතියම් ප්‍රදේශ තුළ ක්ෂේත්‍ර කටයුතු නිම කරනු ලැබ ඇත.





2 වන රූප සටහන : සංචාරක මන්ඩලය වෙත භාර දී ඇති තිස්සමහාරාම සිතියම (ඉහළ) සහ සිලාවතුර සිතියම (පහළ)

(ඇ) පාංශු භූ රසායනික සිතියම් වැඩසටහන

පසෙහි භූ රසායනික ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා 2008 වර්ෂයේදී පාංශු භූ රසායනික වැඩසටහන ආරම්භ කරන ලදී. බනිජ ගවේෂණය, පරිසර අධීක්ෂණය, කෘෂිකාර්මික පර්යේෂණ සහ භූ සෞඛ්‍ය උවදුරු අධ්‍යයන කටයුතු සඳහා මෙම සිතියම් ප්‍රයෝජනවත් වේ. 1:50,000 පරිමාණයේ පාදක සිතියම් මත භූ රසායනික සිතියම්වල ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලබමින් පවතින අතර 1:100,000 පරිමාණය මත ඒවා පළ කරනු ලැබේ. කලාප අංක 20 රක්වාන - තංගල්ල කලාපය සඳහා පළමු භූ රසායනික සිතියම් කට්ටලය නිම කරන ලද අතර 2016 වර්ෂයේදී භූ රසායනික සිතියම් සංග්‍රහයක් ලෙස පළ කරන ලදී.

ආරම්භකව (0 – 0.3m) පෘෂ්ඨීය පස සහ 0.3 - 2m ගැඹුරින් ඇති පස තුලින් එක් එක් 1 km^2 වර්ගඵලය සහිත හතරැස් ප්‍රදේශයක් තුලින් පස් නියැදි 2 ක් එකතු කර ගනු ලබන අතර ඉන් අනතුරුව එය එක් එක් $4km^2$ ප්‍රදේශය දක්වා භාවිතා කරනු ලැබේ. පරමාණුක අවශෝෂක වර්ණාවලිමානය (AAS) සහ ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශන විමෝචන වර්ණාවලිමානය (ICP-OES) යොදා ගනිමින් රසායනික ලක්ෂණ විශ්ලේෂණය කරනු ලැබේ.



3 වන රූපසටහන : විදුම් ක්‍රමය මගින් පස් නියැදි එකතු කිරීම

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි විද්‍යාගාර කටයුතු

කලාප අංක 19 හි (අළුත්ගම - ගාල්ල) විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබමින් පවතී.

පාංශු භූ රසායනික සිතියම් වැඩසටහනෙහි සිතියම් සම්පාදනය කිරීමේ සහ මුද්‍රණය කිරීමේ කටයුතු

කලාප අංක 06 (වවුනියාව - ත්‍රිකුණාමලය) සහ කලාප අංක 08 (අනුරාධපුරය-පොළොන්නරුව) පාංශු භූ රසායනික සිතියම් සංග්‍රහයක් සැකසීමේ කටයුතු සිදු කරනු ලබමින් පවතින අතර ඉතා ඉක්මනින් සංස්කරණ මණ්ඩලය වෙත භාර දෙනු ලබනු ඇත.



4 වන රූප සටහන : වවුනියාව, ත්‍රිකුණාමලය කලාපය තුළ කැඩ්මියම් ව්‍යාපෘතිය (ඉහළ) සහ අනුරාධපුරය - පොළොන්නරුව කලාපය (පහළ) තුළ මැග්නීසියම් ව්‍යාප්තිය

සවිස්තරාත්මක භූ රසායනික සිතියම් වැඩසටහන

පළ කරන ලද සිතියම් වල විශේෂිත ප්‍රදේශ සඳහා සවිස්තරාත්මක භූ විද්‍යා සිතියම් හඳුන්වා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ හම්බන්තොට කර්මාන්ත කලාපය සඳහා ක්ෂේත්‍ර කටයුතු නිම කරනු ලැබ ඇති අතර රසායනික විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබමින් පවතී.



5 වන රූප සටහන : හම්බන්තොට කර්මාන්ත කලාපය තුළ සහ ඒ අවට පස් නියැදි ලබා ගැනීමේ (වම්පස) සහ ජල නියැදි ලබා ගැනීමේ (දකුණු පස) ප්‍රදේශ පෙන්නුම් කරනු ලබන සිතියම්

(ඈ) වාර්ෂික බනිජ ග්‍රන්ථ - 2019 සහ 2020

2019 සහ 2020 යන වර්ෂවල වාර්ෂික බනිජ ග්‍රන්ථයන්හි මුද්‍රණය සඳහා සූදානම් කර ඇති පිටපත් මුද්‍රණ කටයුතු සිදු කිරීම සඳහා මුද්‍රණ සංස්ථාව වෙත භාර දී ඇත.

(ඉ) පළාත් බනිජ පරීක්ෂණ සහ පළාත් බනිජ සිතියම්

උතුරු මැද සහ සබරගමුව යන පළාත් වල පළාත් බනිජ සිතියම් නිම කරන ලද අතර මුද්‍රණය සඳහා සූදානම් කරන ලද පිටපත් 2019 වර්ෂය අවසානය වන විට භාර දෙන ලදී. ඌව පළාතෙහි මුද්‍රණය සඳහා සූදානම් පිටපත 2020 පළමු කාර්තුව තුළදී භාර දෙන ලදී. කෙසේ වුවද, සිතියම් මුද්‍රණය කිරීමේ කාර්යය චීනයේ සිදු කරනු ලබන බැවින් මුද්‍රිත සිතියම් තවමත් ලැබී නොමැති අතර කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කිසියම් ප්‍රමාදයක් සිදු වී ඇත.



6 වන රූප සටහන : ඌව පළාත් බනිජ සිතියමෙහි මුද්‍රණය සඳහා සූදානම් පිටපත

දකුණු පළාත් බනිජ සිතියම් සැකසීමේ කාර්යය නිම කරනු ලැබ ඇති අතර එය සංස්කරණ මන්ඩලය වෙත සමාලෝචනය කිරීම සඳහා භාර දෙනු ලැබ ඇත.

(ඊ) බනිජ සඳහා සුවිශේෂී සිතියම් / වාර්තා පිලියෙල කිරීම

'තිරුවානා ඉල්ලම්' සහ 'ඛනිජ වැලි' පිලිබඳ බනිජ සඳහා සුවිශේෂී වාර්තාවන්හි අවසන් වාර්තා පිලියෙල කරනු ලබමින් පවතී.

(ඊ) බනිජ සඳහා සුවිශේෂී සිතියම් / වාර්තා පිලියෙල කිරීම

'තිරුවානා ඉල්ලම්' සහ 'ඛනිජ වැලි' පිලිබඳ බනිජ සඳහා සුවිශේෂී වාර්තාවන්හි අවසන් වාර්තා පිලියෙල කරනු ලබමින් පවතී.



7 වන රූප සටහන : සංස්කරණ මණ්ඩලය වෙත භාර දෙන ලදුව ඇති දකුණු පළාත් බනිජ සිතියම

එම්.පී.ඒ.-3 පර්යේෂණ හා සංවර්ධන කටයුතු, පෘථිවි ලක්ෂණ සහ භූ කම්පන නිරීක්ෂණාය

(අ) අක්‍රිය භූ කම්පන නිරීක්ෂණ ශක්‍යතාවය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශය තුළ භූ කම්පන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම (2019 සිට ඉදිරියට සිදු කරගෙන යනු ලැබේ.)

මාර්තු මාසය මුල් භාගයේදී ඉදි කිරීම් කටයුතු සහ සංවේදක සවි කිරීමේ කටයුතු නිම කරන ලද අතර 2020 මාර්තු මස 04 දින බල්ක් භූ කම්පන මධ්‍යස්ථානය විසින් දත්ත පරිග්‍රහණය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ බස්නාහිර ප්‍රදේශය තුළ භූ කම්පන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම : ආරම්භක කටයුතු

ශ්‍රී ලංකාවේ බස්නාහිර ප්‍රදේශය තුළ භූ කම්පන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ කටයුතු චීනයෙහි පිහිටි චීන භූ කම්පන පරිපාලන ආයතනයෙහි සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සහයේගිතාවය යටතේ ආරම්භ කරන ලදී. කළමනාකාරිත්ව මන්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව භාර දෙනු ලදුව අනුමැතිය ලබා දෙන ලදී. දෙපාර්ශ්වයෙහි තාක්ෂණික කාර්ය මණ්ඩලයන් අතර ආරම්භක සාකච්ඡාවන් පවත්වා අවබෝධතා ගිවිසුම කෙටුම්පත් කරන ලදී.

භූ විද්‍යාත්මක ව්‍යාපෘතිය, කලාපීය භූ විද්‍යාව, පාෂාණ ඉල්ලම් සහ ප්‍රවේශ්‍යතාවය පැවතීම යන කරුණු මත පදනම්ව බස්නාහිර, ගිනිකොන දිග සහ නිරිත දිග ප්‍රදේශවල යෝජිත ස්ථාන සඳහා සුදුසු ප්‍රදේශ කිහිපයක් හඳුනාග න්නා ලදී. පරිපාලන කටයුතු නිම කරන ලද වහාම වැඩිදුර ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදු කරනු ඇත.

භූ කම්පන මධ්‍යස්ථාන 04 සහ භූ කම්පන නිරීක්ෂණ මධ්‍යස්ථානය නඩත්තු කිරීම

භූ කම්පන මධ්‍යස්ථාන වෙත දත්ත ලබා ගැනීම 2021 වර්ෂය තුලදී සතුටුදායක මට්ටමක පැවැති අතර දේශීය වශයෙන් වාර්තා වූ භූ චලන, භූ ස්පන්දන සිද්ධීන් සහ ඉන්දියන් සාගරයේ ඇති වූ භූ කම්පන සිද්ධීන් පිලිබඳව මහජනතාව වෙතින් ලැබුණු විමසීම් සඳහා දත්ත මධ්‍යස්ථානය විසින් සාර්ථකව ප්‍රතිචාර දක්වන ලදී.

භූ කම්පන කලාප සිතියම් පිළියෙල කිරීම

භූ කම්පන උවදුරු යනු කිසියම් ප්‍රදේශයක් තුළ සිදු විය හැකි භූ කම්පන ආශ්‍රිතව සිදුවන උවදුරු වන අතර භූ කම්පන උවදුරු සිතියමක් මගින් විවිධ ප්‍රදේශවල සාපේක්ෂ වශයෙන් සිදු විය හැකි උවදුරු පෙන්නුම් කරනු ලැබේ. භූ කම්පන උවදුරු වල අවදානම් තත්ත්වයන් අවබෝධ කර ගැනීමට සහ ව්‍යසන අවම කිරීමට සහාය වීම පිණිස වැදගත් තොරතුරු එකී සිතියම් මගින් ලබා දෙනු ලබන අතර ඉඩම් පරිහරණ

සැලසුම් සැකසීම, උවදුරු අවම කිරීම සහ හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීම සඳහා එකී සිතියම් යොදා ගත හැකිය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ඇමෙරිකා එක්සත් ජනපද භූ විද්‍යා සමීක්ෂණ ආයතනය සහ ජාත්‍යන්තර භූ කම්පන මධ්‍යස්ථානය යන ආයතනවල දත්ත පදනම් වෙතින් ඓතිහාසික වාර්තා සහ පර්යේෂණ පත්‍රිකා වෙතින් ලැබුණු දත්ත යොදා ගනිමින් භූ කම්පන සුචිය පිලියෙල කරනු ලැබ ඇත. ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ සිට කි.මී. 500 අරයක් ඇතුලත ප්‍රදේශය තුල සිදුවන භූ කම්පන එමගින් ආවරණය කරනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ සහ අවට ඇති භූ විද්‍යාත්මක ව්‍යුහයන්හි දත්ත ශාස්ත්‍රීය සමාලෝචනයන් මත පදනම්ව නැවත ඇගැයීමට ලක් කරනු ලබමින් පවතී.

ශ්‍රී ලංකාවි මධ්‍යම ප්‍රදේශය තුළ තාවකාලික භූ කම්පන නිරීක්ෂණ ජාලයක් නිර්මාණය කිරීම

ජලාශ වේලි ප්‍රදේශ තුළ ස්වාභාවිකව සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ක්ෂුද්‍ර භූ කම්පනයන් නිරීක්ෂණය කිරීම සඳහා දැඩි කෙටිකාලීන භූ කම්පන ජාලයක් යොදා ගැනීම මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සහ ජර්මනියේ ජී. එෆ් .ඉසඩ් ආයතනයෙහි සහයෝගිතාවය යටතේ මෙය ආරම්භ කරන ලදී. ජී.එෆ්.ඉසඩ් විසින් සපයන ලද සංවේදක දහයක් දිගන ප්‍රදේශය අවට සවි කරන ලදී. 2021 ජුනි මස සිට දෙසැම්බර් දක්වා මාස 6 ක කාල පරිච්ඡේදයක් තුළ දත්ත එක් රැස් කරනු ලැබිණි.

දැනුවත් කිරීමේ වැඩසටහන්



01 රූපසටහන : තාවකාලික භූ කම්පන මධ්‍යස්ථාන ජාලය පිහිටි ස්ථානයෙහි සිතියම

1. දිගන ප්‍රදේශයෙහි දැනුවත් කිරීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා එක්ව මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. 2021 මාර්තු මස 08 දින සිට 10 දක්වා මෙම වැඩසටහන පවත්වන ලදී. කුණ්ඩසාලේ සහ පහතහේවාහැට යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ඉලක්ක කරමින් මෙම වැඩසටහන් පවත්වන ලදී. 2020 වර්ෂයේදී මෑත කාලීනව දිගන ප්‍රදේශය තුළ සිදු වූ භූ කම්පන සිද්ධි වෙත මෙම වැඩසටහන මගින් අවධානය යොමු කරන ලදී.

2. මාධ්‍ය නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන

පරිසර අමාත්‍යාංශයෙහි අධීක්ෂණය යටතේ 2021 සැප්තැම්බර් මස 23 දින මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාව තුළ මෑතකාලීනව සිදු වූ භූ කම්පන පිළිබඳව සාකච්ඡා කිරීම සහ භූ කම්පන පිළිබඳව පොදු හැඳින්වීමක් සිදු කිරීම කෙරෙහි මෙම වැඩසටහන මගින් අවධානය යොමු කරන ලදී. කොළඹ දිස්ත්‍රික්කයෙහි මාධ්‍ය නිලධාරීහු මෙම වැඩසටහනට සහභාගි වූහ.

(ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි පුස්තකාලයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීම

1. පුස්තකාලයෙහි දත්ත කළමනාකරණය ඉදිරියටත් සිදු කර ගෙන යාම සඳහා කොහා මෘදුකාංග පද්ධතිය

පළ නොකරන ලද තාක්ෂණික වාර්තා සඳහා දත්ත ඇතුළත් කිරීම නිම කරන ලදී. සඟරා ලිපි සඳහා දත්ත ඇතුලත් කිරීම ආරම්භ කරන ලද අතර ඉදිරි අවුරුදු කිහිපය තුළ මෙය ක්‍රියාත්මක වනු ඇත.

2. පුස්තකාල ලේඛන සංරක්ෂණය කිරීම සහ කල් තබා ගැනීම - 80%

කල් තබා ගැනීම සිදු කළ යුතු අදාළ පුස්තකාල ලේඛන තෝරා ගෙන එම කාර්යය නිම කිරීම සඳහා ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය වෙත භාර දෙන ලදී.

3. සඟරා බැඳීම - 80%

බැඳිය යුතු වන විද්‍යාත්මක සඟරා තෝරා ගන්නා ලද අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලැබ ඇත.

(ආ) කෞතුකාගාරයෙහි තත්ත්වය වැඩි දියුණු කිරීම

නව විද්‍යාගාර ගොඩනැගිල්ලෙහි වැඩ නිම කළ පසු කෞතුකාගාරය එහි ස්ථාපිත කරනු ලබන හෙයින් එම ගොඩනැගිල්ලෙහි වැඩ නිම කරන තුරු මෙම වැඩසටහන කල් තබන ලදී.

එම්. පී.ඒ. -4 යටිතල පහසුකම්, විද්‍යාගාර පහසුකම් සහ විදුම් ශක්‍යතාවය සංවර්ධනය කිරීම

(අ) පාෂාණ විද්‍යා විද්‍යාගාරය

පාෂාණ විද්‍යා විද්‍යාගාරය විසින් උපදවන ලද ආදායම

	විස්තරය	ආදායම / වටිනාකම (රු.)
1	බාහිර සේවාදායකයන් සඳහා සිදු කරන ලද විශ්ලේෂණ කටයුතු (නියැදි 365) වැලි නියැදි වල ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය - නියැදි 17 තුනීකඩ පිළියෙල කිරීම සහ පාෂාණ විද්‍යාත්මක විශ්ලේෂණය - නියැදි 21 වෙනත් (ඛනිජ හඳුනාගැනීම, අංශු ප්‍රමාණ විශ්ලේෂණය) - නියැදි 279	1,453,890.00
2	ව්‍යාපෘති සඳහා සිදු කරන ලද අනිකුත් විශ්ලේෂණ සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන්ගේ ඉල්ලීම් මත සිදු කරන ලද ක්ෂේත්‍ර කටයුතු	1,115,500.00
3	නියාමන කටයුතු සඳහා සිදු කරන ලද අනිකුත් විශ්ලේෂණ කටයුතු (නියැදි 73)	341,500.00

ක්‍රියාකාරී සැලසුම් කටයුතුවලට අදාලව සිදු කරන ලද කටයුතු

ව්‍යාපෘතියේ නම	විශ්ලේෂණය ඉල්ලා සිටින ලද්දේ කවුරුන් විසින්ද යන වග	විශ්ලේෂණ ප්‍රභේදය	නියැදියේ ස්වභාවය	නියැදි සංඛ්‍යාව	විශ්ලේෂණයේ වටිනාකම (රු.)
ජලධාරා අවසාධිත පරීක්ෂණ	ජයකොඩි මහතා ජ්‍යෙෂ්ඨ භූ විද්‍යාඥ	පූර්ණ ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය	වැලි	24	120,000.00
DNRMS/RT/2020	කේ .ඒ .පී සමීර මහතා භූ විද්‍යාඥ	පූර්ණ ඛනිජ විද්‍යාත්මක විශ්ලේෂණය	වැලි / පාෂාණ	46	292,000.00
භූ විද්‍යාත්මක සිතියම් සැකසීම	එච්. එස්. ලසන්ත මහතා භූ විද්‍යාඥ	තුනී කඩ සකස් කිරීම	පාෂාණ	27	162,000.00
Total				**97**	**574,000.00**









(ආ) විශ්ලේෂණ විද්‍යාගාරය

විශ්ලේෂණ විද්‍යාගාරය විසින් උපදවන ලද ආදායම

	විස්තරය	ආදායම / වටිනාකම (රු.)
1	බාහිර සේවාදායකයන් - නියැදි 290 හුණුගල්, තිරුවානා, ඩොලමයිට්, මිනිරන්, ෆෙල්ඩ්ස්පාර්, පස්, වැලි, සිමෙන්ති, මයිකා, බනිජවැලි, මැටි, ජලය, දිරාගිය පාෂාණ සහ අනිකුත් මිශ්‍ර ලෝහ සහ ගඩොල් හෝ පිඟන් මැටි පාෂාණ මිශ්‍රණයන් අඩංගු නියැදි 290 ක් විවිධ අංශවල සහ පුද්ගලයින්ගේ ඉල්ලීම් මත විශ්ලේෂණය කිරීම	2,527,355.00
2	භූ විද්‍යා අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති එප්පාවල විදුම් සිදුරු නියැදිවල රසායනික විශ්ලේෂණ කටයුතු - නියැදි 178	2,670,000.00
3	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන්ගේ ඉල්ලීම් මත ඔවුන්ගේ ව්‍යාපෘති / පර්යේෂණ සඳහා - නියැදි 101	558,500.00
4	නියාමන කටයුතු සඳහා සහ විශේෂ ඉල්ලීම් මත සිදු කරන ලද විශ්ලේෂණ කටයුතු - නියැදි 13	77,000.00

භූ රසායනික සිතියම් සැකසීම

කලාප අංක 19 - අළුත්ගම - ගාල්ල : මතුගම, අම්බලන්තොට, බලපිටිය, අළුත්ගම සහ ගාල්ල 1:50,000 කලාප වලින් එකතු කර ගන්නා ලද නියැදි 1050 ක ජීර්ණය කිරීම සහ මූලික නියැදි පිලියෙල කිරීම නිම කරන ලදී. නව විද්‍යාගාර ගොඩනැගිල්ල තුළ අළුතින් මිලදී ගන්නා ලද ප්‍රේරිත යුග්ම ප්ලාස්මා ප්‍රකාශ විමෝචන වර්ණාවලිමානය සවි කරන ලද පසු විශ්ලේෂණ කටයුතුද ආරම්භ කරනු ඇත.

විද්‍යාගාර ප්‍රතිතනය -ISO 17025

තිරුවානා, ඩොලමයිට් සහ ජලය ආශ්‍රිත රසායනික විශ්ලේෂණ කටයුතු සම්බන්ධයෙන් 2021 ජනවාරි මාසයේදී විශ්ලේෂණ විද්‍යාඥයින් වෙත ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ ISO/IEC 17025 2017 ප්‍රතීතනය ප්‍රදානය කරන ලදී.

නව විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදි කිරීම

මහල් 6කින් යුතු විද්‍යාගාර ගොඩනැගිල්ලෙහි ඉදි කිරීමේ කටයුතු 2019 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර එම ඉදි කිරීම් කටයුතු 2020 වර්ෂය අවසානය වන විට නිම කිරීමට අපේක්ෂා කරන ලදී. කෙසේ වුවද වසංගත තත්ත්වය හේතුවෙන් එම ඉදි කිරීම් කටයුතු 2022 වර්ෂය තුළද කරගෙන යාමට සිදු විය.

භූ විද්‍යා අංශය විසින් මෙහෙයවන විශේෂ ව්‍යාපෘති- 2021

භූ විද්‍යා අංශය විසින් 2021 වර්ෂය තුළ දී දිවයිනේ ප්‍රදේශ කිහිපයක ඉඩම් ස්ථායීතාවය පවත්වා ගැනීම,පස් කැණීම් සිදු කිරීම හා සම්බන්ධ විශේෂ ව්‍යාපෘති කිහිපයක් සිදු කර ඇත. ඒවායින් සමහරක් පහත දැක්වේ.

- ත්‍රිකුණාමලයේ ඕර්ෂිල් හි කඩා වැටුණු ළිඳක් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය
- ඇල්පිටියේ (ගාල්ල) අමුණුගොඩ ,පට්ටියකන්ද ප්‍රදේශයේ ගොඩබිම වැලි කැනීම සිදු කරන ලද ස්ථානයේ වත්මන් පුනරුත්ථාපන තත්ත්වයන් පරීක්ෂා කිරීම.
- අරුවක්කාරු - එළුවන්කුලම,එප්පාවල විදුම් ව්‍යාපෘතියෙහි භූ භෞතික පරීක්ෂණය
- වැලිකන්ද,බෝඅත්ත,අරලගංවිල සහ නිදන්වල යන ප්‍රදේශවල මාදුරු ඔයේ ගංගා වැලි පරීක්ෂා කිරීම
- හෝමාගම,බටවල ප්‍රදේශයේ නායයාම පිළිබඳ භූ විද්‍යාත්මක පරීක්ෂණය
- ඇල්පිටිය,ගලපිටමඩ ප්‍රදේශයේ බොරළු කැණීම පිළිබඳ භූ විද්‍යාත්මක පරීක්ෂණය
- පොල්ගහවෙල වඩුවාව ඉඩමෙහි පරිමාව ඇස්තමේන්තු කිරීම
- මාදම්පේ,මහවැව සහ නාත්තන්ඩිය සිලිකා වැලි සිතියම්කරණ ව්‍යාපෘතිය
- විශේෂ අයදුම්කරුවන් හය දෙනෙකු සඳහා, ත්‍රිකුණාමලයේ පරෙයිපන්නන් ප්‍රදේශයෙහි මහවැලි ගඟේ ගංගා වැලි පරීක්ෂණය
- මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සියඹලාගොඩ බොරළු කැණීමේ ව්‍යාපෘතිය සඳහා භූ විද්‍යාත්මක පරීක්ෂනය.
- වඩුවාවල සංචිත ඇස්තමේන්තුව - සමීක්ෂණයේ මූලික සැලැස්ම් කටයුතු වලට සම්බන්ධ විය.
- ජලයෙන් යටවන ජලාශ ප්‍රදේශයේ කැණීමට හැකි වැලි ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම
- යෝජිත අරංගොඩ වැව - මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය
- සේරුවිල එවලුම්පත්තුවේ තාවකාලික ආයුධ ගබඩාව පිළිබඳ විමර්ශනය
- ත්‍රිකුණාමලයේ මහවැලි ගඟේ රාල්කුලියේ මොල්ලිමඩු ප්‍රදේශයේ ගංගා වැලි සංචිත පිළිබඳ මූලික විමර්ශනය
- මිල්ලැවපිටියේ ඉඩම් ස්ථායිතාව පිළිබඳ පරීක්ෂාව
- අමිතිරිගල පාංශු කැණීම් පරීක්ෂාව
- මල්ලවපිටියේ පස් කැණීම් පරීක්ෂාව
- කල්තොට-ඉලුක්පැලැස්ස ප්‍රදේශයේ (ෆෙල්ඩ්ස්පාර්) ඉඩම් පරීක්ෂාව





විශේෂ කණ්ඩායම් විසින් තාවකාලික භූ කම්පන ජාලය පරීක්ෂා කිරීම දියත් කර දිගන ප්‍රදේශය අවට භූ විද්‍යාත්මක සිතියම්ගත කිරීම සම්පූර්ණ කරන ලදී.

- හලාවත සිට දික්වැල්ල දක්වා වෙරළ වැලි/පාෂාණ සාම්පල එක්රැස් කිරීම සඳහා කෙටි ක්ෂේත්‍ර සංචාරය
- වාරිමාර්ග කටයුතු සඳහා මුන්ටන්කුමාරවේලි අමුණ ප්‍රතිසංස්කරණය කිරීම සහ එකතු වී ඇති වැලි ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම.
- සූරියපුර, කන්තලේ ප්‍රදේශය අවට වැලි ගොඩදැමීමේ කටයුතු විමර්ශනය කිරීම සඳහා ඩ්‍රෝන යානා සමීක්ෂණයක්
- භූ භෞතික විමර්ශනය සහ භූ විද්‍යාත්මක සිතියම්කරණය - නාවලපිටිය
- කුලියාපිටිය ප්‍රදේශයේ යෝජිත බොරළු කැණීම් භූමිය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාව
- කළුතර දිස්ත්‍රික්කයේ ගල් කොරි භූමිය පරීක්ෂා කිරීම
- යාන්ඔය ජලාශයේ වැලි සහ මැටි පරීක්ෂණය
- මාදුරු ඔයේ (පොළොන්නරුව) ගංගා වැලි පරීක්ෂණය
- මුන්දේනි ආරු (මඩකලපුව) හි ගංගා වැලි පරීක්ෂණය
- කහබිලිය ඔයේ (ලංකාපුර) ගංගා වැලි පරීක්ෂණය
- මා ඔයේ (කොච්චිකඩේ සිට පන්නල දක්වා) ගංගා වැලි පරීක්ෂණය
- මා ඔයේ (පන්නල සිට නල්ල දක්වා) ගංගා වැලි පරීක්ෂණය

- ලනානි ආරු, මගලවටවන ආරු සහ නවකිරි ආරු (මඩකලපුව සහ අම්පාර) ගංගා වැලි පරීක්ෂණය .
- කොස්වැටිය, පල්ලෙබැද්දේ දී විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂණය .
- මධ්‍යම අධිවේගී ව්‍යාපෘතිය සඳහා කළුගල් කුට්ටි , වැලි, බොරළු සහ පස් නිස්සාරණය සඳහා සුදුසු සංචිත ස්ථාන සොයා



- අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්ක තුළ ඡ1-ී කාණ්ඩයට වර්ග කර ඇති පාෂාණ හමුවන ස්ථාන ඇගයීම සඳහා විශේෂ ක්ෂේත්‍ර පරීක්ෂනය
- පුත්තලම, සේනකුඩිරිප්පුව ගම්මානයේ භූගත ජලය කාන්දුවීමේ ගැටලුවෙහි වත්මන් තත්ත්වය විමර්ශනය කිරීම සඳහා ඒකාබද්ධ පරීක්ෂණය
- සේනකුඩිරිප්පුව ගම්මානයෙන් කාන්දු වන ජලයේ අයන සාන්ද්‍රණය විශ්ලේෂණය සඳහා නිදර්ශක එකතු කිරීම.
- ඔයාමඩුව, තන්තිරිමලේ පහළ මල්වතු ඔය ව්‍යාපෘතියෙහි භූ භෞතික පරීක්ෂනය / වැලි සහ මැටි පරීක්ෂනය
- ගංගා වැලි පරීක්ෂනය, මා ඔය, පන්නල
- භූ භෞතික පරීක්ෂනය / වැලි සහ මැටි පරීක්ෂනය යාන්ඔය, රුවන්පුර, පදවිය
- ත්‍රිකුණාමලයේ ඕර්ෂිල් හි කඩා වැටුණු ළිඳ පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණය
- ඇල්පිටියේ (ගාල්ල) අමුණුගොඩ, පට්ටියකන්ද ප්‍රදේශයේ ගොඩබිම වැලි ගොඩ දැමූ ස්ථානයේ වත්මන් පුනරුත්ථාපන තත්ත්වයන් පරීක්ෂා කිරීම.
- අරුවක්කාරු-එළුවන්කුලම භූ භෞතික පරීක්ෂනය
- එප්පාවල විදුම් ව්‍යාපෘතිය
- හෝමාගම, බටවල නාය යාම් පිළිබඳ භූ විද්‍යාත්මක පරීක්ෂණය
- ඇල්පිටිය, ගලපිටමඩ බොරළු කැණීම් පිළිබඳ භූ විද්‍යාත්මක පරීක්ෂනය
- පොල්ගහවෙල වඩුවාව ඉඩමෙහි පරිමාව ඇස්තමේන්තු කිරීම
- මාදම්පේ, මහවැව සහ නාත්තන්ඩිය සිලිකා වැලි සිතියම්කරණ ව්‍යාපෘතිය
- විශේෂ අයදුම්කරුවන් 6 දෙනෙකු සඳහා, ත්‍රිකුණාමලයේ පරෙයිපන්නන් ප්‍රදේශය තුළ මහවැලි ගඟේ ගංගා වැලි පරීක්ෂනය
- බොරළු කැණීමේ ව්‍යාපෘතිය සඳහා මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සියඹලාගොඩ ප්‍රදේශයේ භූ විද්‍යාත්මක පරීක්ෂනය.

- වඩුවාවල වත්තෙහි සංචිත ඇස්තමේන්තුව - පරීක්ෂණයේ මූලික සැලැස්මට සම්බන්ධ
- ජලයෙන් යටවන ජලාශ ප්‍රදේශයේ කැණීමට හැකි වැලි ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම
- යෝජිත අරංගොඩ වැව - මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය
- සේරුවිල එවලුම්පත්තුවේ තාවකාලික ආයුධ ගබඩාව පිළිබඳ විමර්ශනය
- ත්‍රිකුණාමලයේ මහවැලි ගඟේ රාල්කුලියේ මොල්ලිමඩු ප්‍රදේශයේ ගංගා වැලි සංචිත පිළිබඳ මූලික පරීක්ෂණය





වර්ෂය තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්

2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව භූ විද්‍යා අංශය විසින් ක්‍රියාකාරකම් කිහිපයක් සම්පූර්ණ කර ඇත. මෙම ක්‍රියාකාරකම් මගින් රට තුළ පිහිටි ඛනිජ සම්පත් පිළිබඳ තොරතුරු සපයන ලදී.

- මහවිලච්චිය-වන්නි-මයෝසීන් සංකීර්ණවල සීමා මායිම්
- මාතර- ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතියෙහි විදුම් සහ භූ භෞතික කටයුතු අතර සහසම්බන්ධතා දත්ත
- කැළණි ගඟේ වැලි පරීක්ෂණය 2021
- කැළණි ගඟේ වැලි පරීක්ෂණය 2021
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රදේශයේ මහවැලි ගඟේ ගංගා වැලි පරීක්ෂණය
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ , සාමාන්‍ය මුහුදු මට්ටමට අදාළව මහවැලි ගඟේ ඉවුරු උස පිහිටුවීම,
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මහවැලි ගඟ අවට ලවණ ජලය කාන්දු වීම පිළිබඳ පර්යේෂණ කටයුතු.
- ක්ෂේත්‍ර කටයුතු - හම්බන්තොට කර්මාන්ත කලාපය - (ජල සාම්පල)
- එප්පාවල විදුම් ව්‍යාපෘතිය- එප්පාවල
- අදාළ දත්ත රැස්කිරීමේ සමීක්ෂණය
- දිවයින පුරා මැටි දක්නට ලැබෙන ස්ථාන හඳුනා ගැනීම
- සංචිත - මා ඔය
- මීටියාගොඩ අවට ප්‍රදේශයට විශේෂ අවධානය සහිතව ගාල්ල දිස්ත්‍රික්කය තුළ කෙයොලින් පරීක්ෂණය.
- මල්වතු ඔයේ පතුලේ වැලි තැන්පත්වීම් පිළිබඳ සිද්ධි අධ්‍යයනය සඳහා ප්‍රතිචාර දැක්වීම
- යෝජිත මල්වතු ඔය ව්‍යාපෘතියේ වැලි සහ මැටි පරීක්ෂණය
- දකුණු පළාතේ ඛනිජ ගවේෂණය - පරදූව, අකුරැස්ස
- තුන් වන උ පාය මාර්ගික රාමුව: ජාතික පර්යේෂන හා සංවර්ධන ක්‍රමෝපායක් සකස් කිරීම: න්‍යෂ්ටික අමුද්‍රව්‍ය පරීක්ෂණය
- කහටගහ මිනිරන් පතලෙහි භූගත ඉල්ලම් සිතියම්කරණ පරීක්ෂනය.
- ත්‍රිකුණාමලය,කන්තලේ ප්‍රදේශයෙහි මහවැලි ගං ඉවුර දිගේ භූ භෞතික සමීක්ෂණය




SRILANKA PROVINCIAL MINERAL MAP
SOUTHERN PROVINCE



කැණීම් අංශය

අපගේ ආර්ථිකයට අවශ්‍ය අමුද්‍රව්‍ය, ඛනිජ සහ ලෝහ සපයන පතල් කර්මාන්තය විසින් නවීන ජීවන රටාවන්ට නවෝත්පාදනයන්ට සහ ඉංජිනේරුමය ජයග්‍රහණයන් හට පදනම සපයා දෙන හෙයින් එකී කර්මාන්තය අතිශයින් වැදගත් වී ඇත. ඛනිජ කැනීම හේතුවෙන් ප්‍රධාන වශයෙන්ම පාරිසරික හා සමාජ ගැටළු ඇති විය හැකි හෙයින් එකී කැනීම් කටයුතු මනා ලෙස නියාමනය කළ යුතු වේ. 2009 අංක 66 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ පනත මගින් රට තුළ සිදු කරනු ලබන කැනීම් කටයුතු නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ.

ප්‍රධාන කාර්යාලය සහ පාරිභෝගිකයාගේ පහසුව පිණිස රට පුරා පිහිටුවා ඇති ප්‍රාදේශීය කාර්යාල 20 ක් තුලින් වර්තමානයේදී පතල් අංශය ක්‍රියාත්මක වේ.

පතල් අංශයෙහි ප්‍රධාන කටයුතු

1. ශ්‍රී ලංකාවේ කැනීම් කටයුතු නියාමනය කිරීම

(අ). ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීම

(ආ). පරීක්ෂණ පිපිරවීම් සිදු කිරීම

(ඇ). තාක්ෂණික වාර්තා ඇගයීමට ලක් කිරීම

(ඈ). ඛනිජ ගවේෂණය, කැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ අපනයන සඳහා බලපත්‍ර නිකුත් කිරීම

(ඉ) රාජ්‍ය භාග ගාස්තු අය කර ගැනීම

(ඊ) වැඩබිම් වෙත ගොස් පතල්වල ආරක්ෂාව අධීක්ෂණය කිරීම

(උ) වැඩබිම්වල පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය කිරීම

2. විශේෂඥ ඉංජිනේරු සේවා මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම

3. කලාපීය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම / සංවර්ධනය කිරීම

4. කාර්ය මණ්ඩල පුහුණු කිරීම / කුසලතා සංවර්ධනය සහ කාර්යසාධනය අධීක්ෂණය කිරීම

(අ). මහජන පැමිණිලි පිලිබඳව කටයුතු කිරීම

(ආ). අධිකරණවල විභාගවන නඩු සඳහා පෙනී සිටීම

(ඇ). වැඩ බිම්වල ආරක්ෂාව පිළිබඳගැටලු විසඳීම

5. දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු ආදිය පැවැත්වීම

6. වාණිජමය පදනමකින් ඛණිජ නිස්සාරණය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර පිලිබඳව අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම

ලබා දෙන විශේෂ සේවාවන්

- පතල් ස්ථාන පරීක්ෂා කිරීම (ජංගම සේවය - බලපත්‍ර නිකුත් කිරීම, තාක්ෂණික උපදෙස්)
- විශේෂඥ සේවාවන් (පිපිරවීම් ශිල්පීය ක්‍රම, බලපත්‍ර නවීකරණය කිරීම, ආරක්ෂණ උපක්‍රම□ පරීක්ෂණ පිපිරවීම්, ඉරි තැලීම් පරීක්ෂා කිරීම)
- දැනුවත් කිරීමේ වැඩසටහන් (රජයේ නිලධාරීන් සහ බලපත්‍රලාභීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, කැනීම් කටයුතුවල නිරත වන ජනතාව සඳහා වැඩමුළු, ප්‍රදර්ශන)
- පුනරුත්ථාපන වැඩසටහන් (පරිසරය ආරක්ෂාව සඳහා පතල් දිරිමත් කිරීම සහ පතල් විසින් සිදු කරනු ලබන පරිසර ආරක්ෂණ හා පුනරුත්ථාපන කටයුතු අධීක්ෂණය කිරීම)

බලපත්‍ර නිකුත් කිරීම තුළින් උපදවනු ලබන ආදායම

2009 අංක 66 දරණ පනත මගින් සංශෝධිත 1992 අංක 33 දරන පනත යටතේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් පහත සඳහන් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

- ගවේෂණ බලපත්‍ර
- කැනීම් බලපත්‍ර (ශිල්පීය, කාර්මික , විශේෂිත මගින්)
- වෙළඳ බලපත්‍ර
- අපනයන බලපත්‍ර
- ප්‍රවාහන බලපත්‍ර

මෙම බලපත්‍ර පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

‹ ගවේෂණ බලපත්‍ර (ග.බ)

බලපත්‍රය මගින් අවසර ලබා දෙනු ලබන සියළුම ඛණිජ වර්ග ගවේෂණය කිරීම සඳහා විශේෂිත අයිතිවාසිකම ගවේෂණ බලපත්‍ර මගින් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබේ.

‹ කැනීම් බලපත්‍ර (කැ.බ)

I) ශිල්පීය කැනීම් බලපත්‍ර (ශි. කැ. බ)

හෙක්ටෙයාර් දහයක් නොඉක්මවන ප්‍රදේශය තුළ හෝ මීටර් 25 නොඉක්මවන ගැඹුරක් දක්වා බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති සියළුම ඛනිජ කැනීම, සැකැස්ම සහ වෙළඳාම් කිරීම සඳහා විශේෂිත අයිතිය

ශිල්පීය කැනීම් බලපත්‍ර මගින් බලපත්‍රලාභියා වෙත ලබා දෙනු ලැබේ.

1. ඒ කාණ්ඩය - මේ තුළ පහත සඳහන් නිර්ණායක එකක් හෝ වැඩි ගණනක් අඩංගු විය යුතුය.

• විදුලි සිදුරෙහි ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය.

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට ඝන මීටර් 100 (100ප3* ට වඩා නොඅඩු සහ ඝන මීටර් 600 (600m3) ට වඩා නොවැඩි විය යුතුය.

• යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතුය.

2. බී කාණ්ඩය - පහත සඳහන් නිර්ණායක එකක් හෝ කිහිපයක් අඩංගු විය යුතුය.

• විදුම් සිදුරෙහි ගැඹුර මීටර් 1.5 ට වඩා අඩු විය යුතුය.

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට ඝන මීටර් 100 (100 ප3* නොඉක්මවිය යුතුය.

• යන්ත්‍රෝපකරණ කිසිවක් භාවිතා නොකළ යුතුය.

2) කාර්මික කැනීම් බලපත්‍ර :කා කැ බ*

බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය තුල සියළුම ඛනිජ වර්ග ගවේෂණය කිරීම, කැනීම, සැකැසීම හා වෙළඳාම සඳහා සුවිශේෂී අයිතිවාසිකම කාර්මික කැනීම් බලපත්‍ර මගින් ලබා දෙනු ලැබේ.

1. ඒ කාණ්ඩය : (පහත සඳහන් නිර්ණායක එකක් හෝ කිහිපයක් අඩංගු වේ)

• පිපිරවීම් ක්‍රමවේදය විය යුත්තේ අධික බලැති පිපිරවීම් ද්‍රව්‍ය සහ වරකට විදුලි ඩෙටනේටර් 5කට සහ විදුම් සිදුරු 5කට වැඩි සංඛ්‍යාවක් භාවිතා කරනු ලබන බහු සිදුරු විදුම් ක්‍රමයයි.

• විදුම් සිදුරක ගැඹුර මීටර් 3 ට වඩා වැඩි විය යුතුය.

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට කියුබ් :2ල000* වඩා වැඩි විය යුතුය.

• මෙහිදී භාවිතා කිරීම සඳහා කාර්යාංශය විසින් අවසර ලබා දෙනු ලබන යන්ත්‍රෝපකරණ විය යුත්තේ මඩ අදින යන්ත්‍ර, මාර්ග විදුලි උපකරණ, ජැක්කු මිටි, කම්ප්‍රෙෂර් යන්ත්‍ර, ගල් කඩන යන්ත්‍ර, ඉදිරි කොන් පැටවුම් යන්ත්‍ර, එස්කැවේටර් යන්ත්‍ර සහ බැකෝ යන්ත්‍රයි.

• වෙනත් කිසියම් යන්ත්‍රෝපකරණ භාවිතා කළ යුත්තේ කාර්යාංශය විසින් අවසර ලෙබා දෙනු ලබන පරිදිය.

• කැනීම් ප්‍රදේශය හෙක්ටෙයාර් :10* කට වඩා වැඩි විය යුතුය.

• පතලක ගැඹුර මීටර් 25ට වැඩි විය යුතුය.

• විදුම් සිදුරක විෂ්කමහය මිලිමීටර් 42ට වඩා වැඩි විය යුතුය.

2. බී කාණ්ඩය (පහත සඳහන් නිර්ණායක එකක් හෝ වැඩි ගණනක් අඩංගු විය යුතුය.)

• පිපිරවීම් ක්‍රමය අධි බලපැති පිපිරවීම් ද්‍රව්‍ය යොදා ගනු ලබන සහ විදුලි ඩෙටනේටර් සංඛ්‍යාව සහ විදුම් සිදුරු සංඛ්‍යාව 5 නොඉක්මවන බහු විදුම් සිදුරු විය යුතුය.

• ප්‍රස්ථෝතන රැහැන හෝ පුපුරනශීලී නොවන ද්‍රව්‍ය මගින් සිදු කරන පැතිරවීම යොදා ගනිමින් සිදු කරන බහු විදුම් සිදුරු ක්‍රමය පිපිරවීම් ක්‍රමය විය යුතුය.

• විදුම් සිදුරක ගැඹුර මීටර් තුන(3) නොඉක්මවිය යුතුය.

• මඩ කැනීම් යන්ත්‍ර, ජැක්කු මිටි, කම්ප්‍රෙෂර්, ගල් කඩන යන්ත්‍ර, ඉදිරි කොන් පැටවුම් යන්ත්‍ර, එස්කැවේටර් සහ බැකෝ යන්ත්‍ර කාර්යාංශය විසින් භාවිතයට අවසර දෙනු ලබන යන්ත්‍රෝපකරණ විය යුතුය.

• වෙනත් කිසියම් යන්ත්‍රෝපකරණ භාවිතය කාර්යාංශය විසින් අවසර ලබා දෙනු ලබන පරිදි විය යුතුය.

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට කියුබ් දෙදහස :2000* නොඉක්මවිය යුතුය.

• පතලෙහි ගැඹුර මීටර් 25 නොඉක්මවිය යුතුය.

• කැනීම් ප්‍රදේශය හෙක්ටෙයාර් :10* නොඉක්මවිය යුතුය.

• විදුම් සිදුරෙහි විෂ්කම්භය මිලිමීටර් හතලිස් දෙක (43) නොඉක්මවිය යුතුය.

3. සී කාණ්ඩය : (පහත සඳහන් නිර්ණායක එකක් හෝ වැඩි සංඛ්‍යාවක් අඩංගු වේ)

• පිපිරවීම් ක්‍රමය විය යුත්තේ එක් විදුම් සිදුරක් පමණක් විදීමයි.

• විදුම් සිදුරක ගැඹුර මීටර් තුන (3 **m**) නොඉක්මවිය යුතුය

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට කියුබ් දහය :1000* නොඉක්මවිය යුතුය

• ජැක්කු මිටි, කම්ප්‍රෙෂර් යන්ත්‍ර, ගල් කඩන යන්ත්‍ර, ඉදිරි කොන් පැටවුම් යන්ත්‍ර, එස්කැවේටර් සහ බැකෝ යන්ත්‍ර කාර්යාංශය විසින් භාවිතයට අවසර ලබා දෙනු

ලබන යන්ත්‍රෝපකරණ විය යුතුය.

• කැනීම් ප්‍රදේශය හෙක්ටෙයාර් (2) නොඉක්මවිය යුතු අතර පතලෙහි ගැඹුර මීටර් විසිපහ (25 ප) නොඉක්මවිය යුතුය

4. ඩී කාණ්ඩය : (පහත සඳහන් නිර්ණායක එකක් හෝ වැඩි සංඛ්‍යාවක් අඩංගු වේ)

• පිපිරවීම් ක්‍රමය විය යුත්තේ එක් විදුම් සිදුරක් පමණක් විදීමයි.

• විදුම් සිදුරක ගැඹුර මීටර් එකයි දශම පහ (1.5) නොඉක්මවිය යුතුය

• නිෂ්පාදන ධාරිතාවය මාසයකට කියුබ් පන්සියය :500* නොඉක්මවිය යුතුය

• ජැක්කු මිටි, කම්ප්‍රෙෂර් යන්ත්‍ර, ඉදිරි කොන් පැටවුම් යන්ත්‍ර සහ එස්කැවේටර් කාර්යාංශය විසින් භාවිතයට අවසර ලබා දෙනු ලබන යන්ත්‍රෝපකරණ විය යුතුය.

• කැනීම් ප්‍රදේශය හෙක්ටෙයාර් (2) නොඉක්මවිය යුතු අතර පතලෙහි ගැඹුර මීටර් විසිපහ (25 ප) නොඉක්මවිය යුතුය

• **විශේෂී ඛණිජ** (RML)

• **විශේෂිත ඛනිජ ගවේෂණය කිරීම**, කැනීම, සැකසීම සහ වෙළඳාම් කිරීම සඳහා වන බලපත්‍රය අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව ලබා දිය හැකිය.

• **වෙළඳ බලපත්‍ර (වෙ ඛ)**

• බලපත්‍රය නිකුත් කරනු ලබන ඛනිජ මිලදී ගැනීම, ගබඩා කිරීම, සැකසීම, වෙළඳාම සහ අධ්‍යක්ෂවරයාගේ විශේෂිත අවසර සහිතව අපනයනය කිරීම සඳහා විශේෂිත නොවන හිමිකම වෙළඳ බලපත්‍ර මගින් ලබා දෙනු ලැබේ.

• ඒ කාණ්ඩය - අපනයනය සඳහා ඛනිජ වෙළඳාම් කිරීම

• බී කාණ්ඩය - දේශීය වශයෙන් ඛනිජ වෙළඳාම් කිරීම

• සී කාණ්ඩය - අතින් නිපදවනු ලබන ගඩොල් සහ හුණු වෙළඳාම් කිරීම

• **ප්‍රවාහන බලපත්‍ර**

මෙකී බලපත්‍රය තුළ නිශ්චිතව දක්වා ඇති ඛනිජ වර්ග මෙකී බලපත්‍රය තුළ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණයන් මෙකී බලපත්‍රය තුල නිශ්චිතව සඳහන් කර ඇති කාල පරිච්ඡේදයන් තුළ ප්‍රවාහනය සඳහා ඛනිජ අඩංගු ද්‍රව්‍ය හෝ ඛනිජ ප්‍රවාහනය සඳහා වන බලපත්‍ර නිකුත් කරනු ලැබේ. සියළුම ගවේෂණ, කැනීම් සහ වෙළෙඳ බලපත්‍ර වලට අදාලව ඛනිජ අඩංගු ද්‍රව්‍ය හෝ ඛනිජ ප්‍රවාහනය සඳහා පවාහන බලපත්‍රයක් අවශ්‍ය වේ.

• **ඛනිජ අපනයනය**

සියළුම ගවේෂණ, කැනීම් හා වෙළඳ බලපත්‍ර ලාභීන් විසින් එකී බලපත්‍ර නිකුත් කරනු ලබන ඛනිජ අපනයනය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂවරයාගේ විශේෂ අවසරය ලබා ගත යුතු වේ.

• **රාජ්‍ය භාගය (ආදායම)**

1992 අංක 33 දරන පනතෙහි 26 වන වගන්තිය ප්‍රකාරව ඛනිජවල අයිතිය ජනරජය සතු වේ. එසේ හෙයින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනුමැතිය සහිතව ඛනිජ නිස්සාරණය කළ යුතු අතර නිස්සාරණය කරනු ලබන ඛනිජ ප්‍රමාණය සඳහා රාජ්‍ය භාගය ගෙවිය යුතු වේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් උපයන ලද රාජ්‍ය භාග ආදායම පිළිබඳ තොරතුරු පහත සඳහන් සටහන මගින් පෙන්නුම් කරනු ලැබේ.



1 රූපසටහන : 2005 සිට 2021 දක්වා කාලපරිච්ඡේදය තුළදී උපයන ලද රාජ්‍ය භාග ආදායම

වර්ෂය	රාජ්‍ය භාග ආදායම (රු මි)	වර්ෂය	රාජ්‍ය භාග ආදායම (රු මි)
2005	143.06	2014	1,128.46
2006	150.26	2015	1,293.43
2007	199.66	2016	1,578.58
2008	284.05	2017	2,569.32
2009	378.29	2018	4202.44
2010	453.85	2019	1,977.61
2011	586.89	2020	1,594.37
2012	732.71	2021	2,295.53
2013	681.27		

පතල් පරීක්ෂා කිරීම් මගින් උපයන ලද ආදායම

පතල් පරීක්ෂා කිරීමක ප්‍රධාන අරමුණ වනුයේ නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලතාවය තහවුරු කර ගැනීම මත අවශ්‍ය අවස්ථාවලදී යෝග්‍ය අනුකූලතා ක්‍රියාමාර්ග ගැනීමයි. ස්ථාන පරීක්ෂාවන් සිදු කිරීම සඳහා බලපත්‍ර ප්‍රභේදය මත සඳහන් වූ යම් මුදලක් කාර්යාංශය විසින් අය කරනු ලැබේ.

පහත සඳහන් සටහන් තුළ දැක්වෙන පරිදි පතල් පරීක්ෂා කිරීම මගින් උපයන ලද ආදායමෙහි සිදුවූ

ශීඝ්‍ර වර්ධනය මගින් රට තුළ ඛනිජ කර්මාන්තයෙහි සිදුව ඇති ශීඝ්‍ර සංවර්ධනය පෙන්නුම් කරනු ලැබේ.



2.2 රූපසටහන : 2005 සිට 2021 දක්වා කාල පරිච්ඡේදය තුලදී පතල් පරීක්ෂා කිරීම මගින් උපයන ලද ආදායම

වර්ෂය	පතල් පරීක්ෂා කිරීමේ ගාස්තු (රු.මි)	වර්ෂය	පතල් පරීක්ෂා කිරීමේ ගාස්තු (රු.මි)
2005	**5.25**	2014	**140.15**
2006	4.43	2015	182.94
2007	5.61	2016	247.95
2008	30.07	2017	260.66
2009	52.76	2018	243.54
2010	95.45	2019	231.81
2011	128.42	2020	250.83
2012	142.52	2021	289.31
2013	153.23		

බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයන ලද ආදායම

විවිධ ඛනිජ වර්ග සඳහා කාර්යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව මගින් උපයන ලද ආදායම පහත දැක්වෙන පරිදි වේ.

බලපත්‍ර කාණ්ඩය	නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	සම්පූර්ණ ගාස්තුව
ගවේෂණ බලපත්‍ර	42	8,154,250.00
කාර්මික කැනීම් බලපත්‍රය 'ඒ'	117	20,128,250.00
කාර්මික කැනීම් බලපත්‍රය 'බී'	178	5,778,000.00
කාර්මික කැනීම් බලපත්‍රය 'සී'	2432	26,393,800.00
කාර්මික කැනීම් බලපත්‍රය 'ඩී'	599	3,141,230.57
ශිල්පීය කැනීම් බලපත්‍රය 'ඒ'	1615	7,839,040.76
ශිල්පීය කැනීම් බලපත්‍රය 'බී'	2105	4,202,223.66
වෙළඳ බලපත්‍රය 'ඒ'	18	135,000.00
වෙළඳ බලපත්‍රය 'බී'	4229	21,146,800.00
වෙළඳ බලපත්‍රය 'ඒ'	-	-
ප්‍රවාහන බලපත්‍රය	1432626	128,936,340.00
අපනයන බලපත්‍රය	666	3,286,470.00
මුළු එකතුව		**229,141,404.99**

ඛනිජ ගවේෂණය, කැනීම, වෙළඳාම, ප්‍රවාහනය සහ අපනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයන ලද ආදායම පහත සඳහන් සටහන මගින් පෙන්වනු ලැබේ.



3 වන රූප සටහන : 2005 සිට 2021
දක්වා කාල පරිච්ඡේදය තුළ බලපත්‍ර නිකුත් කිරීම මගින් උපයන ලද ආදායම

වර්ෂය	බලපත්‍ර ගාස්තු (රු මි.)	වර්ෂය	බලපත්‍ර ගාස්තු (රු මි.)
2005	36.05	2014	75.6
2006	47.04	2015	80.0
2007	48.04	2016	224.8
2008	41.9	2017	176.4
2009	45.07	2018	145.47
2010	57.64	2019	180.81
2011	79.46	2020	149.22
2012	69.82	2021	229.14
2013	91.15		

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - කැනීම් අංශය
කාර්යසාධන සාරාංශය (මූල්‍ය හා භෞතික) - 2021 වර්ෂය

ශ්‍රී ලංකාවේ කැනීම් කටයුතු නියාමනය කිරීම

	වාර්ෂික ඉලක්කය හා ප්‍රතිපාදන		අත්කරගත් භෞතික හා මූල්‍ය ඉලක්කයන්		ප්‍රගතිය(%)	
	භෞතික ඉලක්කය	මූල්‍ය ඉලක්කය :රු මි*	අත්කරගත් භෞතික ඉලක්කය	අත්කරගත් මූල්‍ය ඉලක්කය (රු මි)	භෞතික	මූල්‍ය
බලපත්‍ර නිකුත් කිරීම						
ගවේෂණ බලපත්‍ර	35	8	42	8.15	120	101.9
කාර්මික කැනීම් බලපත්‍ර ඒ	150	22.5	117	20.13	78	89.5
කාර්මික කැනීම් බලපත්‍ර බී	400	12	178	5.78	44.5	48.2
කාර්මික කැනීම් බලපත්‍ර සී	1300	13	2,432	26.39	187.1	203
කාර්මික කැනීම් බලපත්‍ර ඩී	800	4	599	3.14	74.9	78.5
ශිල්පීය කැනීම් බලපත්‍ර ඒ	1,450	7.25	1,615	7.84	111.4	108.1
ශිල්පීය කැනීම් බලපත්‍ර ඒ	2,500	5	2,105	4.20	84.2	84.0
වෙළඳ බලපත්‍ර ඒ	30	0.225	18	0.14	60	62.2
වෙළඳ බලපත්‍ර බී	4,400	22	4,229	21.15	96.1	96.1
වෙළඳ බලපත්‍ර සී	10	0.01	-	-	-	0.0
ප්‍රවාහන බලපත්‍ර	1,150,000	103.5	1,432,626	128.94	124.6	124.6
අපනයන බලපත්‍ර	700	3.5	666	3.29	95.1	94.0
රාජ්‍ය භාගය		2,100		2295.5		109.3
පරීක්ෂා කිරීමේ ගාස්තු		312		289.31		92.73
වෙනත් ආදායම		50		27.16		54.3
පරීක්ෂණ පිපිරවීම් සිදු කිරීම (සංඛ්‍යාව)	200	9.2	246	13.62	123	148

විශේෂඥ ඉංජිනේරු සේවා මධ්‍යස්ථානයෙහි ප්‍රගතිය

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	සපුරා ගත් ඉලක්ක (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
ක්‍රියාකාරී ඉංජිනේරු සැලසුම් ඒකකය	200	246	123	
වෙළඳ වටිනාකම් සමීක්සණ පැවැත්වීම	01			සිලිකා වැලි සඳහා වෙළඳපොල වටිනාකම් සමීක්ෂණයක් පවත්වන ලදී
ගල්පතල් වල කාර්මික කැනීම් බලපත්‍ර බී සඳහා ඇගයීම් සිදු කිරීම	35	38	108.6	

ප්‍රාදේශීය යටිතල වැඩි දියුණු කිරීම් / සංවර්ධනය කිරීම්

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
නව ප්‍රාදේශීය කාර්යාල පිහිටුවීම	1	100	මුලතිවු ප්‍රාදේශිය කායර්ාලය පිහිටුවන ලදී. පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය සඳහා තෝරා ගන්නා ලද ගොඩනැගිල්ල ලබා ගත නොහැකි වූ හෙයින් වෙනත් ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු නැවත ආරම්භ කරන ලදී.
ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් ලබා ගැනීම	2	100	රත්නපුර සහ පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාල සඳහා ඉඩම් ලබා ගැනීමේ කටයුතු නිම කරන ලදී
ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදි කිරීම	2		පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම කරනු ලැබ ඇත – 75 %
			කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාල්ය අලුත්වැඩියා කිරීමේ කටයුතු නිම කරනු ලැබ ඇත – 100 %
			රත්නපුර ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු නතර කරනු ලැබ ඇති අතර භාන්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු පොරොත්තුව සිටිනු ලැබේ.

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	සපුරා ගත් ඉලක්ක (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
දැනුවත් කිරීම්	21	26	123.8	
කුසලතා සංවර්ධනය	20	02	10	

බලපත්‍ර ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීම

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	සපුරා ගත් ඉලක්ක (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
අභියාචනා විභාග කිරීම	100	27	27	
ප්‍රතික්ෂේප කිරීම්	900	855	95	
මුදල් ආපසු ලබා දීම	800	183	22.9	
අවලංගු කිරීම	35	43	122.9	වලංගු බලපත්‍ර අවලංගු කිරීම -18 කල් ඉකුත් වූ බලපත්‍ර අවලංගු කිරීම - 23 තාවකාලික අත්හිටුවීම් - 18

කැනීම් ආශ්‍රිත තොරතුරු තාක්ෂණ විසඳුම්

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
රජයේ ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කිරීම	1		උපදේශක කටයුතු පත් කිරීමේ අදියර තුළ
ක්‍රියාවලිය ප්‍රමිතිගත කිරීම අ) එස් 5 ආ) අයි එස් ඕ	3 1	30 -	පොලොන්නරුව ප්‍රාදේශීය කාර්යාලය තුළ පමණක් එස් 5 ක්‍රමය ආරම්භ කර ඇති අතර එය 90 % නිම කරනු ලැබ ඇත.
රුක් රෝපණ වැඩසටහන	3	100	යාන් ඔය (2021.03.13 සහ 14) සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී. එලෙසම අප්‍රේල් 12 දින 'නැකතට පැලයක්' වැඩසටහනට සමගාමීව අප විසින්ද රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී. මාතලේ ප්‍රදේශය තුළ පැල බෙදා දීමේ වැඩසටහනක්ද පවත්වන ලදී

.

පරීක්ෂණ ඒකකය

කාර්යය	අපේක්ෂිත කරන ලද ඉලක්කය (සංඛ්‍යාව)	සපුරා ගත් ඉලක්ක (සංඛ්‍යාව)	ප්‍රගතිය (%)	සටහන්
ගල් පතල් තුළ ප්‍රමාණාත්මක ඛනිජ නිමානය	20	6	30.0	

ප්‍රාදේශීය කාර්යාල

අම්පාර, අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගම්පහ, හම්බන්තොට, යාපනය, කෑගල්ල, කලුතර, නුවර, කුරුණෑගල, මාතලේ, මාතර, මොනරාගල, මුලතිවු, පොලොන්නරුව, රත්නපුරය, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන නගරවල පිහිටි ප්‍රාදේශීය කාර්යාල විස්සක් (20) සහ මන්නාරම, හසලක සහ කන්තලේ යන නගරවල පිහිටි උප කාර්යාල තුනක් :03* තුලින් කැනීම් අංශය දැනට ක්‍රියාත්මක වේ. කැනීම් කර්මාන්තය තුළ නිරත අප ගනුදෙනුකරුවන් හට දීප ව්‍යාප්ත ලෙස වඩාත් හොඳ සේවාවක් ලබා දීම සහ නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම මෙම ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කටයුතු වේ.

2021 වර්ෂය තුළ ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්ත කරන ලද ප්‍රාදේශීය කැනීම් ඉංජිනේරුවරුන්ගේ නාම ලේඛනය පහත දැක්වේ.

ප්‍රාදේශීය කාර්යාල	ප්‍රාදේශීය කැනීම් ඉංජිනේරු
අම්පාර	ඉංජිනේරු එච් ඒ සි එන් බණ්ඩාර (වැඩ බලන)
අනුරාධපුරය	ඉංජිනේරු පී කේ කරුණානන්ද
බදුල්ල	ඉංජිනේරු ඩබ් ඒ එස් රූපවංශ
මඩකලපුව	ඉංජිනේරු එම් ආර් එම් ෆාරිස්
කොළඹ	ඉංජිනේරු ඩබ් ඒ එම් පෙරේරා (වැඩ ආවරණ)
ගම්පහ	ඉංජිනේරු ආර් එස් පී රත්නායක (වැඩ බලන)
හම්බන්තොට	ඉංජිනේරු යු එච් පී ප්‍රියන්ත
යාපනය	ඉංජිනේරු ඩී මයුරන්
කෑගල්ල	ඉංජිනේරු කේ පී පී කුමුරුහේන (ආවරණ)
කළුතර	ඉංජිනේරු ඩබ් ඒ ඒ පී වන්නිආරච්චි
නුවර	ඉංජිනේරු ඒ පී විමලසේන
කුරුණෑගල	ඉංජිනේරු කේ එන් ඩබ්ලිව් කේ විමලරත්න
මාතලේ	ඉංජිනේරු ඒ එච් එස් පී අධිකාරි
මාතර	ඉංජිනේරු ඩබ් එල් පී එම් ඩග්ලස් (වැඩ ආවරණ)
මොනරාගල	ඉංජිනේරු ටී එම් ඩබ් බණ්ඩාර
මුලතිවු	ඉංජිනේරු ඩී මයුරන්
පොලොන්නරුව	ඉංජිනේරු ඩබ්ලූ එම් ටී යූ ජයසිංහ (වැඩ ආවරණ)
රත්නපුරය	ඉංජිනේරු එස් අබේසිංහ (වැඩ ආවරණ)
ත්‍රිකුණාමලය	ඉංජිනේරු පී ඒ එස් කුමාරසිංහ
වවුනියාව	ඉංජිනේරු ජේ එම් ඊ පී කේ ජයසේකර

.

කැනීම් අංශය විසින් සිදු කරන ලද විශේෂ කටයුතු

◂ කැනීම් කර්මාන්තය තුළ දක්නට ලැබෙන ගැටලු හඳුනා ගැනීම

කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල ගල් පතල් කර්මාන්තයේ නිරත කැනීම් බලපත්‍ර හිමිකරුවන්ගේ ගැටලු හඳුනා ගැනීම සඳහා 2021-03-12 දින කුරුණෑගලදී වැඩසටහනක් පවත්වන ලදී. කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු ඩී සර්ජන ද සිල්වා, ප්‍රධාන කැනීම් ඉංජිනේරු කුෂාන් ගුණසේකර, ප්‍රාදේශීය කැනීම් ඉංජිනේරු ඒ පී විමලරත්න යන මහත්වරුන් සහ උතුරු මැද පළාතේ පලාත් පරිසර අධිකාරියේ නිලධාරීන් සහ මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් මෙම අවස්ථාවට සහභාගි විය.





එලෙසම කැනීම් බලපත්‍ර හිමියන්ගේ ගැටලු හඳුනා ගැනීම සඳහා වූ තවත් වැඩසටහනක් 2021-03-13 දින ගරු අමාත්‍ය මහින්ද අමරවීර, කාර්යාංශයේ සභාපති අනුර වල්පොල, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් ආර් එම් රත්නායක, අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු ඩී සජ්ජන ද සිල්වා යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් අනුරාධපුර නගරයේදී පවත්වන ලදී.





◂ කුසලතා සංවර්ධන වැඩසටහන්

විෂය චක්‍රලේඛ, මූල්‍ය රෙගුලාසි යටතේ වූ කාර්යපටිපාටි හා ක්‍රියාකාරිත්වය සහ ඒ ආශ්‍රිත ආයතනික කාර්යපටිපාටීන් සහ වාහන ඵලදායී ලෙස භාවිතා කිරීම සම්බන්ධයෙන් වූ පුහුණු වැඩසටහන් 2021ග03ග27 දින භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.





◂ මුලතිවු ප්‍රාදේශීය කාර්යාලය විවෘත කිරීම

මහජනතාව වෙත කාර්යක්ෂම ලෙස සේවාවන් සැපයීම සඳහා නව ප්‍රාදේශීය කාර්යාලයක් 23.12.2021 දින මුලතිවු දිස්ත්‍රික්කය තුළ පිහිටුවන ලදී. මුලතිවු දිස්ත්‍රික් ලේකම්වරයාගේ හා කාර්යාංශයේ සභාපතිවරයාගේ සහභාගිත්වය ඇතිව විවෘත කිරීමේ උත්සවය පවත්වන ලදී.





◂ මාර්ගගත ක්‍රමයට ගෙවීම් සිදු කිරීම සඳහා පිවිසුමක් හදුන්වා දීම

බලපත්‍ර ක්‍රියාවලිය විධිමත් කිරීමේ ආරම්භක පියවරක් ලෙස ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා මාර්ගගත ගෙවීම් ක්‍රමවේදයක් කාර්යාංශය විසින් හඳුන්වා දෙන ලද අතර මෙම ක්‍රමවේදය දියත් කිරීමේ උත්සවය 2021.09.30 දින පවත්වන ලදී.





◂ මාර්ගගත ගෙවීම් ද්වාරය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන

මංගත ගෙවීම් ක්‍රමදෙව්ය පිලිබඳව සේවාදායකයන් සහ ප්‍රාදේශීය කාර්යාලවල කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා සමස්ත රටම ආවරණය කරමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 21 ක් පවත්වන ලදී.





කැනීම් ක්‍රියාවලියෙහි නීතිමය පසුබිම පිළිබඳව ශ්‍රී ලංකා හමුදා නිලධාරීන් දැනුවත් කිරීම සහ නීති විරෝධී කැනීම් කටයුතු පාලනය කිරීම සඳහා ඔවුන්ගේ සක්‍රිය සහභාගිත්වය ලබා ගැනීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහනක් කිලිනොච්චිය නෙළුම් පියස ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.









පතල් සුරක්ෂිතතා අංශය

මේ දක්වා සිදු කරන ලද කටයුතු පහත විස්තර කරනු ලැබේ.

කැනිම් ආරක්ෂණ අංශය විසින් පවත්වන ලද වැඩමුළු

අංකය	දිස්ත්‍රික්කය	තේමාව	දිනය	ආදායම - ශ්‍රී ලං රු
1	කොළඹ	ආරක්ෂිත වැඩබිමක් - සුරක්ෂිත හෙටක්	31.01.2020	140,000.00
2	කළුතර	ආරක්ෂිත වැඩබිමක් - සුරක්ෂිත හෙටක්	28.02.2020	150,000.00
3	හම්බන්තොට	ආරක්ෂිත වැඩබිමක් - සුරක්ෂිත හෙටක්	06.03.2021	184,500.00
4	රත්නපුරය	ආරක්ෂිත වැඩබිමක් - සුරක්ෂිත හෙටක්	06.04.2021	190,000.00

සේවකයන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහ කැනීම් ප්‍රදේශ සුරක්ෂිත ස්ථාන බවට පත් කරන ආකාරය සම්බන්ධයෙන් කැනීම් ආරක්ෂණ අංශය විසින් වැඩමුළු කිහිපයක් පවත්වන ලදී.

ආරක්ෂිත වැඩ බිමක් - සුරක්ෂිත හෙටක් කොළඹ ප්‍රාදේශීය දැනුවත් කිරීමේ වැඩසටහන 31.01.2020






"ආරක්ෂිත වැඩ බිමක් - සුරක්ෂිත හෙටක්" කළුතර ප්‍රාදේශීය දැනුවත් කිරීමේ වැඩසටහන 28.2.2020






"ආරක්ෂිත වැඩ බිමක් - සුරක්ෂිත හෙටක්" හම්බන්තොට ප්‍රාදේශීය දැනුවත් කිරීමේ වැඩසටහන 06.06.2021






"ආරක්ෂිත වැඩ බිමක් - සුරක්ෂිත හෙටක්" හම්බන්තොට ප්‍රාදේශීය දැනුවත් කිරීමේ වැඩසටහන 06.04.2021



02. පැමිණිලි විමර්ශනය කිරීම

අනුමත බදවා ගැනීම් ක්‍රමවේද අනුව කැනීම් ප්‍රදේශ සහ බලපත්‍ර සම්බන්ධයෙන් ලැබෙන සියලුම පැමිණිලි විමර්ශනය කිරීමේ කාර්යය කැනීම් ආරක්ෂන අංශය වෙත පැවරී ඇත. කලාපීය කාර්යාල මට්ටමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාව සහ එම පැමිණිලි සම්බන්ධයෙන් ගන්නා ලද පියවර පහත වගුව තුළ විස්තර කරනු ලැබේ.

අංකය	ප්‍රාදේශීය කාර්යාලය	2019 වර්ෂය		2020 වර්ෂය		2021 වර්ෂය	
		ලැබුණු	පිළිතුරු යවන ලද	ලැබුණු	පිළිතුරු යවන ලද	ලැබුණු	පිළිතුරු යවන ලද
01.	අම්පාර	40	20	25	06	24	17
02.	අනුරාධපුරය	47	39	33	31	52	46
03.	බදුල්ල	59	41	50	45	50	49
04.	මඩකලපුව	09	02	14	09	11	10
05.	කොළඹ	100	31	73	20	122	12
06.	ගම්පහ	83	71	53	42	61	59
07.	හම්බන්තොට	47	05	21	13	29	18
08.	ප්‍රධාන කාර්යාලය	-	-	-	-	268	232
09.	යාපනය	10	10	13	11	06	06

10.	කළුතර	77	62	65	50	53	49
11.	මහනුවර	74	50	49	24	39	39
12.	කෑගල්ල	35	26	27	23	47	37
13.	කුරුණෑගල	200	159	136	55	142	66
14.	මාතලේ	11	05	25	20	22	21
15.	මාතර	96	39	98	76	79	68
16.	මොනරාගල	48	34	40	33	31	31
17.	පොලොන්නරුව	25	13	26	15	31	24
18.	රත්නපුරය	65	18	40	26	40	36
19.	ත්‍රිකුණාමලය	31	17	23	11	58	11
20.	වවුනියාව	04	02	03	02	04	04

03. නීතිවිරෝධී පතල් ස්ථාන පිලිබඳ විමර්ශන කටයුතු

පතල් ස්ථාන සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීම අප රාජකාරියෙහි කොටසක් වේ. පතල් ආරක්ෂණ ක්ෂේත්‍ර නිලධාරියා විසින් මෙහෙයවනු ලබන කණ්ඩායම වෙත මෙම රාජකාරියෙහි නිරත වීමේ කාර්යය පවරනු ලැබ ඇත. නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන්ගේ සහාය ඇතිව අප අංශය විසින් විමර්ශනය කරන ලද, විවිධ තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන නීති විරෝධී පතල් ස්ථාන පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

වර්ෂය	දිනය	වටලන නීති විරෝධී ස්ථාන	අත්අඩංගුවට ගන්නා ලද තැනැත්තන් සංඛ්‍යාව
2020	2020.10.09	ත්‍රිකුණාමලය, කින්නියා	02
	2020.10.10	ත්‍රිකුණාමලයේ සිට සේරුවාවිල	01
	2020.10.22	ත්‍රිකුණාමලය, මුතූර්	01
	2020.10.22	ත්‍රිකුණාමලයේ සිට සේරුවාවිල	-
	2020.10.23	මාතලේ දඹුල්ල	01
	2020.11.04	මන්නාරම එළුපුකාම්බෙයි	02
	2020.11.06	අනුරාධපුරය, ගල්කිරියාගම	01
	2020.11.21	මඩකලපුව, වාලච්චේනෙ	02
	2020.11.22	මඩකලපුව, වාලච්චේන	01
	2020.11.22	පොලොන්නරුව, වැලිකන්ද	01
	2020.11.24	කුරුණෑගල, අලව්ව	02
	2020.11.25	කුරුණෑගල, අලව්ව	04
	2020.12.10	කුරුණෑගල, කුරුණෑගල	01
	2020.12.11	වවුනියාව, සෙට්ටිකුලම්	04
	2020.12.12	අනුරාධපුරය, තඹුත්තේගම	01
	2020.12.15	කුරුණෑගල, පොල්පිතිගම	05
	2020.12.16	කුරුණෑගල, ගිරිඋල්ල	03

	2020.12.16	කුරුණෑගල, නාරම්මල	01
2021	2021.01.06	පොළොන්නරුව, බකමූණ	02
	2021.01.08	බදුල්ල, මහියංගනය	02
	2021.01.12	ගම්පහ, මීරිගම	04
	2021.01.13	රත්නපුරය, නිවිතිගල	04
	2021.01.21	වවුනියාව (දකුණ) වවුනියාව	0
	2021.01.22	කුරුණෑගල, වාරියපොල	02
	2021.01.23	කුරුණෑගල, නාරම්මල	03
	2021.01.23	කුරුණෑගල, නාරම්මල	01
	2021.01.26	කුරුණෑගල, වාරියපොල	07
`	2021.02.06	කුරුණෑගල, පොල්ගහවෙල	01
	2021.02.07	රත්නපුර, රත්නපුර	0
	2021.02.08	මොනරාගල, තණමල්විල	02
	2021.02.08	මොනරාගල, කුඩාඔය	02
	2021.02.12	කිලිනොච්චිය, කිලිනොච්චිය	0
	2021.02.15	කුරුණෑගල, කොටවෙහෙර	03
	2021.02.16	පොළොන්නරුව, හිඟුරක්ගොඩ	0
	2021.02.18	මඩකලපුව, වහාරි	02
	2021.02.20	පුත්තලම, මාදම්පෙ	02
	2021.02.24	ඡමඑඒක්පල ඒ්පචැ	03
	2021.02.24-25	කුරුණෑගල, පන්නල	09
	2021.02.27	අනුරාධපුරය, කැකිරාව	04
	2021.03.01	අනුරාධපුරය, හොරොව්පතාන	04
	2021.03.03	කුරුණෑගල, ගනේවත්ත	07
	2021.03.10	කුරුණෑගල, වාරියපොල	03
	2021.03.12	කුරුණෑගල, ගනේවත්ත	03
	2021.03.19	රත්නපුර, නිවිතිගල	02
	2021.03.24	වවුනියාව (දකුණ) වවුනියාව	02
	2021.03.26	කුරුණෑගල, වාරියපොල	01
	2021.03.29	කුරුණෑගල, නාරම්මල	03
	2021.03.31	හම්බන්තොට, වීරකැටිය	02
	2021.04.02	බදුල්ල, මහියංගනය	02
	2021.04.05	කොළඹ, හෝමාගම	03
	2021.04.09	පුත්තලම, මාරවිල	01
	2021.04.09	පුත්තලම, මාරවිල	03
	2021.05.18	පොළොන්නරුව, තමන්කඩුව	01
	2021.05.18	මඩකලපුව, කිරාන්	02
	2021.05.19	මඩකලපුව, කිරාන්	02
	2021.05.21	පොළොන්නරුව, වැලිකන්ද	01
	2021.05.21	පොළොන්නරුව, වැලිකන්ද	01
	2021.05.29	මඩකලපුව, වාලච්චේනෙ	04
	2021.05.30	අම්පාර, මහඔය	05
	2021.05.30	අම්පාර, මහඔය	05
	2021.05.31	අනුරාධපුරය, පළුගස්වැව	03

	2021.06.01	පුත්තලම, නාත්තන්ඩිය	02
	2021.06.17	පොලොන්නරුව, වැලිකන්ද	05
	2021.06.25	පොලොන්නරුව, තෙබෝ	01
	2021.06.27	මහනුවර, උඩුනුවර	01
	2021.06.28	පුත්තලම, නාත්තන්ඩිය	01
	2021.07.02	රත්නපුරය, බලංගොඩ	0
	2021.07.11	අනුරාධපුරය, තිරප්පනේ	01
	2021.07.11	අනුරාධපුරය, තිරප්පනේ	01
	2021.07.13	පුත්තලම, ආනමඩුව	03
	2021.07.15	කුරුණෑගල, බමුණාකොටුව	02
	2021.07.15	කුරුණෑගල, බිංගිරිය	01
	2021.07.17	කුරුණෑගල, කුලියාපිටිය	01
	2021.07.17	කුරුණෑගල, උඩුබැද්දාව	01
	2021.07.22	අනුරාධපුරය, නොච්චියාගම	01
	2021.07.24-25	ගම්පහ, කටාන	02
	2021.07.28	කුරුණෑගල සිට බිංගිරිය	01
	2021.07.30	පුත්තලම, නාත්තන්ඩිය	01
	2021.08.08	බදුල්ල, මහියංගනය	02
	2021.09.04	අනුරාධපුරය,තලාව	01
	2021.09.09	ත්‍රිකුණාමලය, කින්නියාව	01
	2021.09.14	කුරුණෑගල, පොතුහැර	02
	2021.09.16	මඩකලපුව, කරදියනාරු	02
	2021.09.21	මුලතිවු, මාන්කුලම්	10
	2021.09.24	කුරුණෑගල, මහකුඹුක් කුඩාවෙල	0
	2021.09.27	මහනුවර, නාවලපිටිය	03
	2021.09.28	අනුරාධපුරය කහටගස්දිගිලිය	04
	2021.09.30	මඩකලපුව, කරදියනාරු	03
	2021.09.30	මඩකලපුව, කරදියනාරු	01
	2021.10.09	අනුරාධපුරය කැබිතිගොල්ලෑව	02
	2021.10.09	අනුරාධපුරය මැදවච්චිය	01
	2021.10.12	පුත්තලම, මහවැව	02
	2021.10.12	පුත්තලම, හලාවත	01
	2021.10.13	අනුරාධපුරය, පදවිය	02
	2021.10.14	කුරුණෑගල, අලව්ව	02
	2021.10.14	කුරුණෑගල, අලව්ව	01
	2021.10.5	පුත්තලම, දංකොටුව	02
	2021.10.16	පුත්තලම, මහවැව	02
	2021.10.22	කළුතර, තෙබුවන	02

04. කැනීම් ප්‍රදේශ පුනරුත්ථාපනය

බැංකු ඇපකරය ගණනය කිරීම සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිසි යන්ත්‍රණයක් අනුගමනය කර නොමැති බවත් පුනරුත්ථාපනය නොකරන ලද කැනීම් ප්‍රදේශ දිවයින පුරාම දක්නට ලැබෙන අතර නිසි ලෙස කටයුතු නොකරන බලපත්‍රලාභීන්ට එරෙහිව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ප්‍රමාණවත් ලෙස පියවර ගෙන නොමැති බවත් ජාතික විගණන කාර්යාලය විසින් පෙන්වා දෙන ලදී.

එලෙසම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් බැංකු ඇපකර අත් කර ගෙන ඇති කැනීම් ප්‍රදේශ සම්බන්ධයෙන් කටයුතු කරන ලෙස පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත උපදෙස් ලබා දෙන ලදී.

කැනීම් ආරක්ෂණ ඒකකය විසින් මේ සම්බන්ධයෙන් පුනරුත්ථාපන මාර්ගෝපදේශ පිළියෙල කරනු ලැබ ඇති අතර, එකී මාර්ගෝපදේශ විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලදී. මෙකී මාර්ගෝපදේශ ප්‍රකාරව කැනීම් ප්‍රදේශ පුනරුත්ථාපනයට අදාලව චක්‍රලේඛ කෙටුම්පත් තුනක් සකස් කරන ලද අතර ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා නිල අනුමැතිය ලබා ගන්නා ලදී. අනිකුත් අධ්‍යක්ෂවරුන්ගේ එකඟතාවය ලබා ගත් වහාම මෙම චක්‍රලේඛ ක්‍රියාත්මක කරනු ඇත.

වර්ෂය	පුනරුත්ථාපනය කරන ලද කැනීම් ප්‍රදේශ	පුනරුත්ථාපනය කරන ලද කැනීම් ප්‍රදේශ ප්‍රතිශතය
2012	152	79%
2013	196	75%
2014	231	73%
2015	204	72%
2016	202	70%
2017	272	75%
2018	316	68%
2019	400	70%
2020	429	79%
2021 Until March	89	63%
Total	**2491**	**73%**

05. කැනීම් ප්‍රදේශ අධීක්ෂණය - දිද්දෙනිය, හංවැල්ල මාර්ග සංවර්ධන අධිකාරිය

කැනීම් ප්‍රදේශ අධීක්ෂණය කිරීමේ කාර්යය ශක්තිමත් කිරීමේ අංගයක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙහි ව්‍යාපෘති සඳහා අවශ්‍ය පුද්ගලයන් බාහිර සම්පත්දායකයන් ලෙස බඳවා ගැනීමට කැනීම් ආරක්ෂණ ඒකකය විසින් පියවර ගෙන ඇත. දිද්දෙනිය හංවැල්ල ප්‍රදේශයෙහි ට්‍රේලර් අධීක්ෂණ ස්ථාන පිහිටි තැන් සොයා ගැනීමේ අඛණ්ඩ අධීක්ෂණ කටයුතු සඳහා කැනීම් ආරක්ෂණ අංශය මේ දක්වා සම්බන්ධ වෙමින් පවතී.

මාර්ග සංවර්ධන අධිකාරී ව්‍යාපෘතිය වෙතින් ලැබුනු ආදායම පිළිබඳව විස්තර පහත වගුව තුළ දක්වනු ලැබේ.

මාර්ග සංවර්ධන අධිකාරි ව්‍යාපෘති	වර්ෂය	කැනීම් ඉංජිනේරුවරයා සඳහා වැටුප්
බදුල්ල චෙන්කලඩි ව්‍යාපෘතිය	2020	3,528,000.00
මධ්‍යම අධිවේගී ව්‍යාපෘතිය - 1	2020	2,020,000.00
මධ්‍යම අධිවේගී ව්‍යාපෘතිය - 2	2019	100,000
	2020	100,000
	2021	400,000

06. ආරක්ෂණ විගණනය

ආරක්ෂණ විගණනය සහ කැනීම් ස්ථාන ආරක්ෂිත ස්ථාන බවට පත් කිරීම සඳහා පහසුකම් සැපයීම පිණිස යෝජනා සකස් කිරීම කැනීම් ආරක්ෂණ අංශයෙහි අත්‍යවශ්‍ය අංගයක් වේ. මේ යටතේ කැනීම් ආරක්ෂන අංශය විසින් ආරක්ෂණ විගණනයන් කිහිපයක් සිදු කර ඇති අතර ඒවා කිහිපයක් පහත දැක්වේ.

- සීමාසහිත ධම්සිලා පුද්ගලික සමාගමට අයත් මයිකා පතලෙහි ආරක්ෂන ගැටළු කිහිපයකට අදාලව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඇතිපොල මයිකා පතලෙහි සේවය කරන සේවකයන්ගේ ජීවිතවලට නුදුරු දිනයකදී ඇති විය හැකි අනතුරුදායක තත්ත්වයන් පිලිබඳව නිරීක්ෂණය කරන කරන ලද අතර එම ගැටලු විසඳීම සඳහා කටයුතුවල විෂය පථය හා සීමාවන් ලබා දෙන ලදී. ඒ අනුව සමාගම විසින් එම ගැටලු විසඳනු ලැබ ඇත.
- දැකඩ ප්‍රදේශයෙහි මධ්‍යම අධිවේගී මාර්ගයට ආසන්නව පිහිටා ඇති කේවීඒ වීරසිංහ මහතාට අයත් ගල්පතල ආශ්‍රිතව ආරක්ෂන විගණනයක් සිදු කරන ලදී.







07. අනතුරු පරීක්ෂණ කිරීම සහ වාර්තා කිරීම

අනතුරු පරීක්ෂා කර ඒවා පිලිබඳව වාර්තා කිරීමද මෙම ඒකකයෙහි විෂය පථය යටතට අයත් වන අතර මෙම ඒකකය විසින් අනතුරු කිහිපයක් පරීක්ෂා කරනු ලැබ ඇති අතර ඒවායින් කිහිපයක් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

අනතුර පරීක්ෂා කරන ලද දිනය	කාර්මික කැනීම් බලපත්‍ර අංකය	කාර්මික කැනීම් බලපත්‍ර හිමියාගේ නම	දිස්ත්‍රික්කය	මරණ සංඛ්‍යාව
2020.05.13	IML/A/HO/1535/LR/8	ප්‍රියන්ත එන්ටර්ප්‍රයිසස් හි පී ජී ඒ විජේසිරි	පොළොන්නරුව	01
2020.05.25-26	IML/B/HO/6136/LR/04	එස් එස් ජයසංගාර්	වවුනියාව	01
2020.05.26	IML/D/BD/N/227/LR/02	එම් එල් බාලසුරිය	බදුල්ල	-
2020.11.18	AL/A/BD/074/LR/05	එම් සෝමසිරි	බදුල්ල	01
2020.12.17	IML/C/HO/N/9132/LR/4	පී බී එස් කේ පුංචි බණ්ඩාර	අනුරාධපුරය	01
2020.12.21	IML/C/HO/N/9030/LR/5	නෙත්මි මෙට්ල් ක්‍රෂර්	ගම්පහ	01
2020.12.26	IML/C/HO/N/13 IML/C/HO/N/14	සී/ස මිට්කෝ ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම	ගම්පහ	03
2021.03.17	IML/C/HO/N/12019/LR/01	එම් ජී ඩී එම් සේනාධීර	මාතලේ	01
2021.04.29	IML/C/GM/N/46	එම් ඩී ආර් ටී විජේරත්න	ගම්පහ	01
2021.07.12	IML/C/COL/N/025/R/01	ඩබ් එම් ඒ ඩී එස් මල්ලිකා ජයසුන්දර	කොළඹ	02
2021.08.10	IML/C/Anu/N/0112	ඩබ් එම් ජී එස් අධිකාරි	අනුරාධපුරය	01
2021.08.11	IML/C/HO/N/408/R/13	ඊ එම් පේ ජයතිලක	මාතලේ	01
2021.08.30	IML/C/MT/N/102	වී කෝදාගොඩ	මාතර	01
2021.10.14	IML/C/HO/14748	සී/ස කේෂාන් මයිනින් ඇන්ඩ් ක්‍රෂින් පුද්ගලික සමාගම	මාතර	01



08. පතල් සමූහ නිරීක්ෂණය

මේ යටතේ කැනීම් ආරක්ෂණ ඒකකය විසින් පතල් සමූහයක් නිරීක්ෂණය කරන ලද අතර පතල් ආරක්ෂණය සහ පතල් ප්‍රදේශ පුනරුත්ථාපනය සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. එක් එක් පතලෙහි සියළුම කටයුතු මගින් පතල් සමූහයෙහි ඉතිරි කැනීම් ප්‍රදේශවලට බලපෑමක් ඇති කරනු ලැබේ. එසේ හෙයින් පතල් ප්‍රදේශ පිහිටි සම්පූර්ණ භූමියම භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කිරීම සඳහා ඒවා පිරවීම සඳහා ඒකාබද්ධ පුනරුත්ථාපන සැලසුම් සකස් කළ යුතු බවට කැනීම් බලපත්‍රලාභීන් හට අවබෝධ කර දෙනු ලැබුණි. කැනීම් ආරක්ෂණ අංශයෙහි පෙළඹවීම මත සිදු කරන ලද නිරීක්ෂණයන් කිහිපයක් පහත දැක්වේ.

මාදම්පේ

පුත්තලම මාදම්පේ ප්‍රදේශයේ පතල් ප්‍රදේශ වල පුනරුත්ථාපන කටයුතු සහ බලපත්‍ර ක්‍රියාකාරකම් පහසුවෙන් සිදු කර ගෙන යාම සඳහා කැනීම් ආරක්ෂණ අංශය සම්බන්ධ විය. මෙම සිලිකා වැලි පතල් සමූහය සම්බන්ධයෙන් අඛණ්ඩ අධීක්ෂණයක් සිදු කරන ලදී.



දිද්දෙනිය

මෙම පතල් සමූහය හංවැල්ල දිද්දෙනිය ප්‍රදේශයෙහි පිහිටා ඇත. කැනීම් ආරක්ෂන අංශය විසින් මෙම පතල් සමූහය පරීක්ෂා කරන ලද අතර මෙම ප්‍රදේශවල පුනරුත්ථාපන හා අධීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය විසඳුම් ලබා දෙන ලදී.



කොස්වැටිය

මෙම පතල් සමූහය කැනීම් ආරක්ෂණ අංශය විසින් පරීක්ෂා කරන ලද අතර මෙම ප්‍රදේශවල පුනරුත්ථාපන හා අධීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය විසඳුම් ලබා දෙන ලදී.



09. වෙනත් කටයුතු -

i. බලපත්‍ර සඳහා අත්සන් කිරීම සහ රැස්වීම් වලට සහභාගි වීම, ගවේෂණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් වලට සහභාගි වීම, පාරිසරික පිරිවැය / වටිනාකම් අනුපාත ඇගයීම් සඳහා සහභාගි වීම.

වර්ෂය	සිදු කරන ලද ඇගයීම් සංඛ්‍යාව
2019	20
2020	30
2021	28

ii. ඉරි තැලිම් පරීක්ෂා කිරීම

දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ මාතර නගරයට පිවිසීම සඳහා කපුදූව ප්‍රදේශයෙහි අන්තර් හුවමාරුවක් ඉදි කිරීම සඳහා පස තුළට කුළුණු බැස්සවීම මගින් නිවාසවලට ඇති විය හැකි බලපෑම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට මාතර ප්‍රාදේශීය කාර්යාලය හා එක්ව ඉරි තැලීම් පරීක්ෂා කිරීමක් සිදු කිරීම සඳහා කැනීම් ආරක්ෂන ඒකකය විසින් කටයුතු කරන ලදී. මෙම කාර්යය තුලින් උපයන ලද ආදායම ශ්‍රී ලංකා රුපියල් 218,160.00 කි.





iii.එස්පීඅයි මාර්ගෝපදේශ පිලියෙල කිරීම

මේ වන විට මෙම කාර්යයෙන් 80% ක් නිම කරනු ලැබ ඇත. 2022 මැයි මාසයේ සිට මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

iv. වාර්තා සැකසීම පරීක්ෂා කිරීම

මේ වන විට මෙම කාර්යයෙන් 80% ක් නිම කරනු ලැබ ඇත. 2022 මැයි මාසයේ සිට මෙම මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

v. පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය

පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය තුළදී කැනීම් ආරක්ෂණ ඒකකය විසින් සමස්ත කැනීම් අංශය නියෝජනය කරන ලද අතර මෙම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා තම පූර්ණ දායකත්වය ලබා දෙන ලදී.

මානව සම්පත් අංශය

Organizational Structure



මානව සම්පත් සමාලෝචනය

භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්යාංශයේ සේවාවන් ලබා ගන්නා සාමාන්‍ය ජනතාවට පහසුකම් සැලසීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 21ක් සහ උප කාර්යාල 3ක් ඇති අතර එම ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල අතර කාර්ය මණ්ඩල බෙදී යන ආකාරය පහත දැක්වේ.

රැකියා අවස්ථා ලබාදීම සඳහා අදාළ කාර්යාලය පිහිටි ප්‍රදේශවලින් බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවාගෙන ඇත.



භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය පිටකෝට්ටේ පිහිටා ඇති අතර එහි කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව 291 ක් වන අතර සියලුම ප්‍රධාන දෙපාර්තමේන්තු එහි මහල් හයක ගොඩනැගිල්ලක ස්ථානගත කර ඇත. මූලික වශයෙන් උපායමාර්ගික සහ පාලන අංශය ප්‍රධාන කාර්යාලය විසින් හසුරුවනු ලැබේ. සභාපති , අධ්‍යක්ෂ ජනරාල් , අධ්‍යක්ෂවරු ඇතුළු සියලුම ප්‍රධාන නිලධාරීන් මෙහි ස්ථානගත කර ඇත.



බඳවා ගැනීමේ පටිපාටිය (SOR)

බඳවා ගැනීමේ පටිපාටිය මගින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, තෘතීයික කළමනාකාරිත්වය

ද්විතියික මට්ටම සහ ප්‍රාථමික මට්ටම ලෙස කළමනාකරණ මට්ටම් පහක් හඳුන්වා දී ඇත.

මේ සියලු මට්ටම් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙහි මනා ක්‍රියාකාරිත්වය සඳහා සිය පූර්ණ සහාය ලබා දෙයි.



2021 වර්ෂය තුළ මානව සම්පත් අංශය සහ පරිපාලන අංශයේ කාර්ය සාධනය

1. ස්වයංක්‍රීය නිවාඩු සහ පැමිණීම සටහන් කිරීමේ ක්‍රම වේදයක් හඳුන්වා දීම.

2. සේවකයින් සඳහා පුහුණු වැඩසටහන් හතරක් සංවිධානය කිරීම.

3. බාහිර රෝගී අංශයේ ප්‍රතිලාභය රු. 60000/= දක්වා වැඩි කිරීමට අනුමැතිය ලබා ගැනීම.

4. පිරිවැය අඩු කිරීම සඳහා මුද්‍රණ යන්ත්‍ර, ඡායාරූප පිටපත් යන්ත්‍ර ආදිය කුලියට ගැනීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.

5. රටේ හදිසි අවස්ථාවක නිවසේ සිට වැඩ කිරීම සඳහා ලැප් ටොප් හෝ පරිගණක මිලදී ගැනීමට සේවකයින්ට ණයක් ලබා දීමට මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.

6. දීර්ඝ කාලයක් ප්‍රමාද වී ඇති, ජ්‍යෙෂ්ඨ තනතුරු 10කට වැඩි සංඛ්‍යාවක් සඳහා සේවකයන් බඳවා ගැනීමේ කාර්යය සිදු කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

7. නව ස්ථාන මාරු ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

8. දුක්ගැනවිලි කමිටුවේ නිර්දේශ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්තාවක් සකස් කර අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීම.

9. සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පටිපාටිය සහ ආයතනික ව්‍යුහයේ අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගැනීම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

10. සේවකයින්ගේ ගැටළු විසඳීම සඳහා විශේෂයෙන් පත් කරන ලද කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම.

11. මානව සම්පත් අංශයේ දෛනික රාජකාරි සියල්ල ඵලදායී ලෙස ඉටු කිරීම.

2022 සඳහා සැලසුම් - මානව සම්පත් සහ පරිපාලනය අංශය

1. ස්වයංක්‍රීය නිවාඩු සහ පැමිණීම සටහන් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම
2. නව සේවක මණ්ඩලයක් සකස් කර කළමනාකරිත්ව මණ්ඩලයේ අනුමැතිය සහිතව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
3. වසරේ පළමු මාස හය තුළ සියලුම බඳවා ගැනීම් සම්පූර්ණ කිරීම.
4. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, දුක්ගැනවිලි කමිටුවේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන නිර්දේශ ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම
5. සේවකයින් සඳහා ඔවුන්ගේ රැකියා භූමිකාවට අදාළව, මසකට දෙවරක් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම,.
6. . නායකත්වය සහ ඉංග්‍රීසි භාෂාව වැඩිදියුණු කිරීම සම්බන්ධව වසර තුළ පුහුණු වැඩසටහන් හයක් සංවිධානය කිරීම.
7. ජාතික ඵලදායිතා ආයතනයේ සහාය ඇතිව "පහ සංකල්පය හඳුන්වා දීම සහ පුහුණු වැඩසටහන් තුනක් සංවිධානය කිරීම.
8. අවම වශයෙන් බාහිර පුහුණු වැඩසටහන් දෙකක්වත් සංවිධානය කිරීම.
9. සුබසාධක සංගමයේ සහයෝගය ඇතිව සේවකයින් අතර සමගිය වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරඟාවලියක්, අවුරුදු උත්සවයක්, වෙසක් උත්සවයක් සංවිධානය කිරීම.
10. මිල්ක් බාර් එකක් විවෘත කිරීම සහ සේවකයන්ගේ උපයෝගිතා බිල්පත් ගෙවීම සඳහා යන්ත්‍රයක් සවි කිරීම.

නීති අංශය

■ නීති අංශයේ කටයුතු

- නීති අංශය විසින් මෙහෙයවන ලද මුළු නඩු සංඛ්‍යාව- 75 ශ්‍රේෂ්ඨාධිකරණය - නඩු 10

  අභියාචනාධිකරණය - නඩු 20

  සිවිල් අභියාචනා මහාකධිරණය - නඩු 1

  මහාධිකරණය - නඩු 4

  දිස්ත්‍රික් අධිකරණය - නඩු 3

  ඔහේස්ත්‍රාත් අධිකරණය - නඩු 31

  කම්කරු විනිශ්චය සභාව - නඩු 1

  මානව හිමිකම් කොමිසම - නඩු 3

  කම්කරු දෙපාර්තමේන්තුව - නඩු 2

- අධිකරණයේ පෙනී සිටීම් - පෙනී සිටීම් 213

ජනවරි	-	නඩු 24	ජූලි	-	නඩු 23
පෙබරවාරි	-	නඩු 19	අගෝස්ත	-	නඩු 12
මාර්තු	-	නඩු 26	සැප්තැම්බර්	-	නඩු 11
අප්‍රේල්	-	නඩු 10	ඔක්තෝබර්	-	නඩු 33
මැයි	-	නඩු 8	නොවැම්බර්	-	නඩු 10
ජූනි	-	නඩු 11	දෙසැම්බර්	-	නඩු 26

- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් සිදු කරන ලද වැටලීම් වලින් අනතුරව අලුතින් පවරන ලද නඩු

  ජනවාරි සිට අප්‍රේල් - 20 ඔක්තෝබර් - 04

  නොවැම්බර් - 02

- නීති අංශය විසින් මෙහෙයවනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සමග නීතිමය උපදෙස් ලබා ගැනීම සඳහා සිදු කරන ලද සාකච්ඡාවන් - 15

- කැනීම් ලිපිගොනු පිලිබඳ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සතු ලිපිගොනු පරීක්ෂා කිරීම් - 16

- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් සිදු කරන ලද විමර්ශන සහ වැටලීම් - 147%

  - විමර්ශන - 33
  - වැටලීම් - 114

- නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශය විසින් මෙහෙයවන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව - 295

- විමර්ශන සහ වැටලීම් තුලින් රජයට දඩ මුදල් උපයා දෙන ලද මුළු මුදල රුපියල් 1,874,766.25

- රාජ්‍ය භාගය, එන්තරවාසි සහ උසාවියේ නඩුගාස්තු තුලින් උපයන ලද මුළු මුදල - රුපියල් 1,129,540.80

- නීති උපදෙස් ලබා ගැනීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීති අංශය වෙත ලැබුණු ලිපි සංඛ්‍යාව - 1334
- පොලිස් ස්ථාන, අධිකරණ, රජයේ අධිකාරි, පරිපාලිත ආයතන, බලපත්‍රලාභීන් / අයදුම්කරුවන් සහ වෙනත් තැනැත්තන් වෙත යැවීම සඳහා පිලියෙල කරන ලද ලිපි වාර්තා සිහි කැඳවීම් සංඛ්‍යාව - 484
- නීති අංශය විසින් මෙහෙයවන ලද කැනීම් පිලිබඳ අභියාචනා ලිපි ගොනු සංඛ්‍යාව - 20
- නීති උපදෙස් ලබා දීම සඳහා නීති අංශය විසින් මෙහෙයවන ලද කැනී ම්ලිපිගොනු සංඛ්‍යාව - 251
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් මෙහෙයවන ලද ලිපි සහ ලිපිගොනු සංඛ්‍යාව - 312
- පතල් හා ඛනිජ පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන් නීතිය අංශය විසින් පොලිස් නිලධාරීන් සහ පොලිස් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීම් වැඩසටහන් සංඛ්‍යාව - 10

වැඩසටහන්

- පෙබරවාරි - පොලිස් ස්ථානය, පොලොන්නරුව
- ජුනි - කටාන පොලිස් විද්‍යාලය
- අගෝස්තු - කටාන පොලිස් විද්‍යාලය (වැඩසටහන 4)
- ඔක්තෝබර් - කටාන පොලිස් විද්‍යාලය, මරදාන පොලිස් විද්‍යාලය සහ කුරුනෑගල දෙහැර පොලිස් මධ්‍යස්ථානය
- දෙසැම්බර් - යාපනය
- පතල් හා ඛනිජ පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන් නීති අංශය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් - වැඩසටහන් 01
- භූ විද්‍යා සමීක්සණ හා පතල් කාර්යාංශය වෙනුවෙන් පිලියෙල කරන ලද වැඩසටහන් - 34
    - කල්බදු ගිවිසුම් - 11
    - විදුම් ගිවිසුම් - 02
    - සේවා ගිවිසුම් - 10
    - ඛනිජ ආයෝජන ගිවිසුම් - 06
    - අවබෝධතා ගිවිසුම් - 05
- පතල් හා ඛනිජ පනත සඳහා වූ සංශෝධන
    - අනිකුත් අංශ වල අදහස් ලබා ගැනීම සඳහා අභ්‍යන්තර රැස්වීම් පවත්වන ලදී
    - සංශෝධනය කළ යුතු වැදගත් ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී
    - පුනරුත්ථාපනය, කොන්දේසි උල්ලංඝනය කිරීම හා සම්බන්ධ වැරදි සහ නීති විරෝධී පතල් හා ඛනිජ සහ උපකරණ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් වැඩිදුර සංශෝධන හඳුනාගන්නා ලදී.
    - නීති අංශය විසින් පාදක ලේඛනයක් ලෙස කෙටුම්පතක් පිලියෙල කර පරිසර අමාත්‍යාංශයෙහි අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී

- රෙගුලාසි සඳහා සංශෝධන
  - රෙගුලාසිවල පළමු කොටස 04.07.2019 දින පල කරන ලද අතර දෙවන කොටස නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව යවනු ලැබ ඇත.
  - මා ඔය කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම 10.08.2021 දින විශේෂ රැස්වීමක් පවත්වන ලදී.
- අනිකුත් අභ්‍යන්තර / බාහිර රැස්වීම්- 50

සාරාංශය

කාර්ය මණ්ඩලය

- නීති අංශයෙහි සම්පූර්ණ ස්ථිර කාර්ය මණ්ඩලය - 09 : (නීතිඥවරුන් 2 දෙනෙකු නීතිය කියාත්මක කිරීමේ නිලධාරීන් තිදෙනෙකු, කළමනාකරණ සහායකයන් තිදෙනෙකු සහ එක් කාර්යාල සහායකයකු ඇතුළුව)
- නීති අංශයෙහි සේවයෙහි කොන්ත්‍රාත් පදනම මත සේවයෙහි නියුක්ත සේවකයන් සංඛ්‍යාව - 3 (නීතිඥවරුන් තිදෙනෙකු)

කාර්යයන්

- නීති අංශය විසින් මෙහෙයවන ලද මුළු නඩු සංඛ්‍යාව- 75
- උසාවියෙහි පෙනී සිටීම් - 213
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් සිදු කරන ලද වැටලී මිවලින් අනතුරුවැ අලුතින් නඩු පැවරීම් - 26
- නීති අංශය විසින් මෙහෙයවනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිමය මතය ලබා ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සමග පවත්වන ලද සාකච්ඡා - 15
- කැනීම් ලිපිගොනු සම්බන්ධයෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ ලිපිගොනු පරීක්ෂා කිරීම් - 16
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් සිදු කරන ලද විමර්ශන සහ වැටලීම් සංඛ්‍යාව - 147
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් මෙහෙයවන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව - 295
- විමර්ශන සහ වැටලීම් තුලින් දඩ මුදල් ලෙස රජය වෙත එකතු කර දෙන ලද මුළු මුදල - රු 1,874,766.25
- නීතීමය උපදෙස් ලබා ගැනීම පිණිස සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස නීති අංශය වෙත ලැබුණු ලිපි- 1334
- පොලිස් ස්ථාන අධිකරණ, රජයේ අධිකාරීන්, පරිපාලිත ආයතන බලපත්‍ර ලාභීන් / අයදුම්කරුවන් සහ වෙනත් තැනැත්තන් වෙත යැවීම සඳහා පිලියෙල කරන ලද ලිපි, වාර්තා සහ සිහි කැඳවීම්- 484
- නීති අංශය විසින් මෙහෙයවන ලද කැනී මිපිලිබඳ අභියාචනා ලිපිගොනු සංඛ්‍යාව - 20
- නීති උපදෙස් ලබා දීම සඳහා නීති අංශය විසින් මෙහෙයවන ලද කැනීම් ලිපිගොනු - 251
- නීතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් මෙහෙයවන ලද ලිපි සහ ලිපිගොනු - 312
- දැනුවත් කිරීමේ වැඩසටහන් -11
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙනුවෙන් පිලියෙල කරන ලද ගිවිසුම් - 34
- අභ්‍යන්තර / බාහිර රැස්වීම් - 51

මූල්‍ය සමාලෝචනය

රට පුරා වයසංගත තත්ත්වයක් පැවතියද 2020 වර්ෂයේ ආදායම සහ වියදම සමග සංසන්දනය කිරීමේදී 2020 වර්ෂය තුලදී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ආදායම හා වියදම තුළ ඉහළ මට්ටමක් පෙන්නුම් කරනු ලැබේ. 2021 වර්ෂය තුලදී කාර්යාංශය විසින් උපයන ලද ආදායම රාජ්‍ය භාගයද ඇතුලත්ව රුපියල් මිලියන 3230 ක් වූ අතර එය 2020 වර්ෂය හා සංසන්දනය කිරීමේදී 30.4% ක වර්ධනයකි.

එලෙසම 2021 වර්ෂය තුලදී වාර්ෂික වියදම මහ භාණ්ඩාගාරය වෙත ලබා දෙන ලද ප්‍රදානය හැර රුපියල් මිලියන 1197 ක් විය. 2020 වර්ෂයෙහි වියදම හා සංසන්දනය කිරීමේදී එය 23% ක අඩුවීමකි.

එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂයෙහි ශුද්ධ ආදායම රුපියල් මිලියන 2033 ක් වූ අතර එය 62% ක වර්ධනයකි.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2021 වර්ෂය තුලදී රුපියල් මිලියන 2000ක් ඒකාබද්ධ අරමුදලට ලබා දෙනලදී.

2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාර්යාංශයෙහි ආදායම පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කළ හැකි වන අතර ආදායම් ප්‍රභේදයන්හි විචලනයන් ඒ තුලින් නිරීක්ෂණය කරනු ලැබිය හැකිය.

	2017	2018	2019	2020	2021
Royalty Income	Rs.Mn 4626	Rs.Mn 4336	Rs.Mn 1998	Rs.Mn 1602	Rs.Mn 2451
License Income	Rs.Mn 276	Rs.Mn 182	Rs.Mn 194	Rs.Mn 143	Rs.Mn 232
Inspection Fees	Rs.Mn 260	Rs.Mn 244	Rs. Mn 262	Rs.Mn 252	Rs.Mn 286
Laboratory Income	Rs.Mn 2.6	Rs.Mn. 4.1	Rs.Mn 5.3	Rs.Mn 3.6	Rs.Mn 4
Project Income	Rs. Mn 24	Rs.Mn 49	Rs.Mn 18	Rs.Mn 24	Rs.Mn 27
Interest Income	Rs.Mn 281	Rs.Mn 323	Rs.Mn 228	Rs.Mn 173	Rs.Mn 165
Other Income	Rs.Mn 100	Rs.Mn 106	Rs.Mn 92	Rs.Mn 78	Rs.Mn 129



මූල්‍ය වාර්තා

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 සාමාන්‍ය ප්‍රතිපත්ති

1.1.1 ආයතනය පිළිබඳව වාර්තා කිරීම

1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත ප්‍රකාරව ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය හැඳින්විය හැකිය. මෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ යන ස්ථානයේ පිහිටා ඇත. නුවර, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය, අනුරාධපුරය, අම්පාර, මොනරාගල, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කළුතර, යාපනය, මඩකලපුව, ගම්පහ, පොළොන්නරුව, මන්නාරම,වවුනියාව,මාතලේ,මුලතිව් සහ කොළඹ යන නගරවල පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාල 21 ක් මගින් භූ. ස. ප. කා. වර්තමානයේදී ක්‍රියාත්මක වේ.

1.1.2 පරිපාලිත සහ උප පරිපාලිත සමාගම්

සී/ස ජී. එස්. එම්. බී තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහි නිකුත්ව ඇති කොටස්වලින් 66% ක (කොටස් 400,000) කාර්යාංශය විසින් ආයෝජනය කරනු ලැබ ඇත. එහි ලියාපදිංචි කාර්යාලය අංක 190/ඒ, ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ යන ස්ථානයේ පිහිටා ඇත.

සී/ස ජී. එස්. එම්. බී තාක්ෂණික සේවා පුද්ගලික සමාග මෙහි ප්‍රධාන කටයුතු වන්නේ වෙළෙඳපොලහි වැලි මිල පාලනය කිරීම සහ නියාමනය කිරීම සඳහා වෙළෙඳ කටයුතු සහ වෙළෙඳපොල වෙළඳ කටයුතු ක්‍රියාත්මක කිරීමයි. ප්‍රධාන වශයෙන්ම ඉදි කිරීම් අංශය සඳහා සහාය වීම සඳහා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස මෙම සමාගම විසින් සහනදායී මිලට වැලි අලෙවි කිරීම සිදු කරනු ලබන අතර වෙළෙඳ කටයුතු සඳහා ස්ථාන සමාගම විසින් ස්ථාපිත කරනු ලැබ ඇත. එලෙසම පුද්ගලික සමාගම විසින් සේවාදායකයන් සඳහා තාක්ෂණික සහාය සේවා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ මිනිස් බලය ලබා දීම වැනි සේවා සහ තාක්ෂණික විශේෂඥ දැනුම ආශ්‍රිත කටයුතු සිදු කරනු ලබන අතර ඒවා භූ. ස. ප. කා. හි බලතල යටතට අයත් නොවේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි සභාපතිවරයා සී/ස ජී. එස්. එම්. බී. තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහිද සභාපතිවරයා වන අතර භූ. ස. ප. කා. හි වෙනත් කිසිදු අධ්‍යක්ෂවරයකු / අධ්‍යක්ෂවරුන් හෝ සේවකයන් පරිපාලිත සමාග මෙහි අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු නොලැබේ.

1.1.3 ඒකාබද්ධ ගිණුම් පිළියෙල කිරීම

පරිපාලිත සමාගමෙහි ගිණුම් වර්ෂය මව් සමාගමෙහි ගිණුම් වර්ෂය හා අනුකූල වන ලෙස වෙනස් කරනු ලැබ ඇති අතර ඒකාබද්ධ ගිණුම් පිළියෙල කර ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2022 පෙබරවාරි මස 25 දින දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය ලබා දෙන ලදී.

1.1.4 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

ශ්‍රී ලංකාව ක්‍රමානුකූල ලෙස භූ විද්‍යා සිතියම්ගත කිරීම සහ භූ විද්‍යා සිතියම් පිළියෙල කිරීම සඳහා කටයුතු කිරීම, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම, එවැනි ඛනිජ කැනීම, සැකසීම සහ අපනයනය සඳහා වාණිජමය ශක්‍යතාවය ඇගයීමට ලක් කිරීම, බලපත්‍ර නිකුත් කිරීම මගින් ඛනිජ ගවේෂණය හා කැනීම, ඛනිජ සැකසීම, වෙළඳාම් කිරීම සහ අපනයනය කිරීම නියාමනය කිරීම, වාණිජමය පදනමකින් ඛනිජ නිස්සාරණය කිරීම , නිෂ්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අනුගමනය කළ යුතු පියවර සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් ලබා දීම, පනත යටතේ කාර්යයන් ඉටු කිරීමේදී ලබා ගන්නා තොරතුරු හා දත්ත සුදුසු ජනමාධ්‍යයන් තුළ ප්‍රචාරය කිරීම, භූ ඉංජිනේරු විද්‍යාව හා සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට භාර ගැනීම සහ භූ උවදුරු සහ ව්‍යසන සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ ප්‍රතිකර්ම

ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

1.1.5 පිළියෙල කිරීමේ පදනම

(අ) අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්කම් වීමේ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශන තුළ අඩංගු වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූල වන ලෙස මෙම ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇතග

(ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අංක 10 හා අනුකූලව 2021 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය වෙනස් කරනු ලැබ ඇත.

(ඇ) ඇගයීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය අනාවරණයන් සිදු කරනු ලබන අවස්ථාවලදී හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

(ඈ) සන්සන්දනාත්මක තොරතුරු

පහත දක්වා ඇති ගිනුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් කර ඇති සියළුම කාල පරිච්ඡේදයන් සඳහා සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රමිති වෙළුම් 1, 11 සහ 111 වාර්තා කිරීමේදී යෝග්‍ය ලෙස යොදා ගනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති හෝ වර්ගීකරණය කර ඇති විෂයයන් සංශෝධනය කරනු ලැබ ඇති විටකදී වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සිදු කිරීම සඳහා වර්තමානය හා ගැලපෙන ලෙස සංසන්දනාත්මක අගයන්ද නැවත වර්ගීකරණය කරනු ලැබ ඇත. එසේ හෙයින් ස්ථාවර වත්කම්, ජංගම වත්කම් සහ හිමිකම් වර්ගීකරණ දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයෙහි ගිණුම්කරණ ප්‍රමිති සහ මහා භාණ්ඩාගාර මාර්ගෝපදේශ හා අනුකූලව නිවැරදි කරනු ලැබ ඇත.

(ඉ) මූල්‍යමය සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇත.

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරන ලද සියලුම මූල්‍යමය තොරතුරු, අන් ආකාරයකින් සඳහන් කරනු ලැබ නොමැති නම්, ආසන්නතම රුපියලට වටයනු ලැබ ඇත.

(ඊ) ඇස්තමේන්තු සහ විනිශ්චයන් භාවිතා කිරීම

රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම මගින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ ඇස්තමේන්තු ප්‍රමාණයන් යෙදවීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහිත උපකල්පන සිදු කිරීම සඳහා කළමනාකාරිත්වයට නියම කරනු ලැබේ. භාවිතා කරන ලද මෙම ඇස්තමේන්තු සහ නිගමන වලින් තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක උපකල්පන අඛන්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ.ප්‍රතිශෝධනය එම කාල පරිච්ඡේදය සඳහා පමණක් හෝ ප්‍රතිශෝධනය සිදු කරනු ලබන කාලපරිච්දෙඡ්ය හෝ අනාගත කාල පරිච්ඡේදයන් තුළදී බලපායි නම්, වර්තමාන කාල පරිච්ඡේදය සහ අනාගත කාල පරිච්ඡේදය යන දෙකටම ප්‍රතිශෝධනය බලපායි නම් ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන ප්‍රතිශෝධන ප්‍රතිශෝධනය කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබූ මුදල් ප්‍රමාණයන් වෙත වඩාත්ම සුවිශේෂී බලපෑම ඇති කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීම හා සම්බන්ධ වැදගත් විනිශ්චයන්, අස්ථාවර තත්ත්වයන් හා සුවිශේෂී ඇස්තමේන්තු ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් තුළ ඇතුළත් කරනු ලැබේ.

1.1.6 මූල්‍ය ප්‍රකාශන තුළ අයවැය තොරතුරු ඉදිරිපත් කිරීම

වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූලිකව අනුමත කරන ලද අයවැය, එකී අයවැය තුළ නැවත ප්‍රතිපාදන වෙන් කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් සහ යම් යම් අවස්ථාවලදී කාර්යාංශයේ කටයුතු ඉටු කිරීම සඳහා ගන්නා ලද තීරණ හේතුවෙන් සංශෝධනය කරන ලදී.

1.2 වත්කම් සහ එකී වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.2.1 දේපල, පිරියත හා උපකරණ

(අ) හඳුනා ගැනීම සහ ඇගයීම

දේපල, පිරියත හා උපකරණ ඒවායේ සමුච්චිත විෂයය ප්‍රමාණයන් හා හානිකරන අලාභයන් අඩු කර ඒවායේ පිරිවැය හෝ සාධාරණ වටිනාකම මත සඳහන් කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වල අවම වටිනාකම රු. 5000 ලෙස භූ. ස. ප. කා. විසින් සලකනු ලබන අතර දේපල, පිරියත හා උපකරණ යටතේ අඩංගු සියලුම භාණ්ඩ සමුච්චිත ක්ෂය කිරීම් හෝ හානිකරණ අලාභ අඩු කර පිරිවැය මත මූලිකව සටහන් කරනු ලැබේ. වත්කමක සුවිශේෂී සංරචක හඳුනාගෙන වෙන වෙනම ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. යම් කාල ප්‍රාන්තර තුළදී දේපලක, පිරියතක හා උපකරණයක සුවිශේෂී කොටස් ප්‍රතිස්ථාපනය කරනු ලැබීම අවශ්‍ය විට දී, ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරන ලද කොටස පිළිගැනීම නවතා අළුතින් එක් කරන ලද කොටස එහි ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂය කිරීම් සහිතව පිළිගනු ලැබේ. අනිකුත් සියළුම ප්‍රතිසංස්කරණ සහ නඩත්තු පිරිවැය ඒවා දරන ලද ආකාරය අනුව ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

(ආ) පිරිවැය

දේපලක, පිරියතක හා උපකරණයක පිරිවැය තුළ එය මිලදී ගනු ලැබූ වටිනාකම සහ එකී වත්කම එමගින් අපේක්ෂිත ප්‍රයෝජනය ලබා ගත හැකි තත්ත්වයට පත් කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි කිසියම් වූ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වල ඉපැයීම් ශක්‍යතාවය අබාධිතව පවත්වාගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන ද්විතියික වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

දේපලක, පිරියතක සහ උපකරණයක අඩංගු සංරචකයක අනාගත ආර්ථික ප්‍රතිලාභ භූ. ස. ප. කා. වෙත ගලා යනු ලැබේ නම් එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් පමණක් ප්‍රධාන පරීක්ෂා කිරීමේ හා ප්‍රතිසංස්කරණ වියදම් ඇතුළුව වෙනම ගිණුම්ගත කරනු ලබන එකී සංරචකය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වැය වන වියදම ප්‍රාග්ධනීගත කරනු ලැබේ.

(ඇ) ප්‍රතිස්ථාපන පිරිවැය

මූලිකව තක්සේරු කරන ලද කාර්යසාධන තත්ත්වයකින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිස්ථාපනය කිරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දරනු ලබන වියදම දරනු ලබන අවස්ථාවේදී වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඈ) යම් යම් තෝරාගත් වත්කම් කාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීම

තෝරා ගනු ලැබූ ස්ථාවර වත්කම් පමණක් ප්‍රත්‍යාගණනය කිරීමට කාර්යාංශය විසින් තීරණය කරන ලද අතර කුරුණෑගල, මහකනදරාව සහ හක්මන කාර්යාලවලදී ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී.

කෙසේ වුවද, තක්සේරු කරන ලද භාණ්ඩවල ප්‍රභේදනයක් අප වෙත එවන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අප විසින් දන්වන ලද අතර මෙම ගිණුම් වර්ෂය අවසානයේදී භූ. ස. ප. කා. වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සාරාංශයක් පමණක් වන හෙයින් එකී තොරතුරු ලැබුණු විට පමණක් ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් හා සම්බන්ධ සටහන් ගිණුම් පොත්වල ඇතුළත් කළ හැකිය.

ඉදිරියේදී එවැනි වත්කම් සෑම අවුරුදු 5කට වරක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රතිපත්තියක් ලෙස භූ. ස. ප. කා. විසින් අනුගමනය කරනු ලබන අතර මීළඟ මූල්‍ය වර්ෂය අවසානයේදී මෝටර් වාහන සහ සන්නිවේදන උපකරණ ප්‍රත්‍යාගණනය කරනු ඇත.

(ඉ) ක්ෂය කිරීම්

පහත සඳහන් නිමානය කරන ලද ප්‍රයෝජනවත් ආයුකාලයක් මත සින්නක්කර අයිතිය සහිත ඉඩම් හැර සියළුම දේපල, පිරියත සහ උපකරණ අදාළ පිරිවැය ලියා හැරීම සඳහා ඒවායේ පිරිවැය මත සෘජු රේඛා ක්‍රමය ඔස්සේ විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ක්ෂය කිරීම් අය කරනු ඇත.

වත්කමක් ප්‍රයෝජනයට ගැනීමට පහසුකම් සලස්වන අවස්ථාවේදී එහි ක්ෂය කිරීම් ආරම්භ කරනු ලබන අතර වත්කම් විකිණීම සඳහා ඇති වත්කමක් බවට නියම කරනු ලබන දිනය සහ වත්කමක් සටහන් තුළ හඳුනාගැනීම නතර කරනු ලබන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේදී ක්ෂය කිරීම නතර කරනු ලැබේ.

කිසියම් දේපලක්,පිරියතක් සහ උපකරණයක් බැහැර කරනු ලැබීමේ දී හෝ එය භාවිතා කිරීම තුළින්, කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරනු ලබන විටක දී එකී දේපල, පිරියත, සහ උපකරණය හඳුනාගැනීම නතර කරනු ලැබේ. වත්කමක් සටහන් තුළ හඳුනාගැනීම නතර කරනු ලැබීම මත සිදුවන කිසියම් ලාභයක් හෝ අලාභයක් වත්කම හඳුනාග ැනීම නතර කරනු ලබන වර්ෂයෙහි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කරනු ලැබේ.

ප්‍රධාන වාර්ෂික අනුපාතයන් පහත දැක්වෙන පරිදි වේ.

වත්කම් ප්‍රභේදය	ප්‍රයෝජනවත් ආයු කාලය	ක්ෂය කිරීම් අනුපාතය
ගොඩනැගිලි සහ වෙන් කිරීම්	අවුරුදු 20	5%
වැට සෑදීම	අවුරුදු 5	20%
පිරියත හා යන්ත්‍රෝපකරණ	අවුරුදු 8	12.5%
විද්‍යාගාර උපකරණ	අවුරුදු 5	20%
මෝටර් වාහන	අවුරුදු 5	20%
ගෘහභාන්ඩ සහ උපාංග	අවුරුදු 10	10%
කාර්යාල උපකරණ	අවුරුදු 5	20%
ක්ෂේත්‍ර උපකරණ	අවුරුදු 5	20%
සිතියම් උපකරණ	අවුරුදු 5	20%
සන්නිවේදන උපකරණ	අවුරුදු 8	12.5%
පුස්තකාල පොත් සහ සිතියම්	අවුරුදු 20	5%
මෘදුකාංග උපාංග	අවුරුදු 5	20%

සී/ස ජී එස් එම් බී තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙහි සියලුම වත්කම් සඳහා ක්ෂයවීම් ලබා දීමේ කාර්ය සඳහා අවුරුදු 4ක ආයු කාලයක් (25%) සලකා බලනු ලැබ ඇත.

1.2.2 කෙරිගෙන යන වැඩ

පිටකෝට්ටේ පිහිටි විද්‍යාගාර ගොඩනැගිල්ලෙහි සහ රත්නපුරය, පොලොන්නරුව, අම්පාර සහ කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලවල ඉදි කිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නිම කරනු ලැබ නොමැත.එසේ හෙයින් ගිණුම් වර්ෂය අවසාන වන විට ඉදිකිරීම් නිම කිරීමේ ප්‍රතිශතය සහ වටිනාකම තහවුරු කරන සහතිකයක් සුදුසුකම් ලත් සිවිල් ඉංජිනේරුවරයෙකු වන කේ. ඒ. මුණසිංහ (වරලත් ඉංජිනේරු) වෙතින් අප විසින් ලබා ගෙන ඇත. අම්පාර බුද්දංගල සුනාමි ජී.එෆ්.ඉසඩ් මධ්‍යස්ථානවල මූලික ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂයේ දී නිම කරන ලදි.

1.2.3 භාණ්ඩ ලේඛනය

පිරිවැයෙහි සහ ශුද්ධ උපලබ්ධිගත වටිනාකමෙහි අඩු අගය මත භාණ්ඩ ලේඛන සඳහන් කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධිගත වටිනාකම යනු ඇස්තමේන්තු කළ නිම කිරීම් පිරිවැය සහ විකුණුම් වියදම් අඩු කරන ලද, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ ඇස්තමේන්තු කළ විකුණුම් මිලයි. යල් පැන ගිය සහ සෙමින් භාවිතා කරනු ලබන භාණ්ඩවල හානිය අඩු කරන ලද, භාණ්ඩ අත්පත් කර ගැනීම සහ ඒවා දැනට පවතින ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒම සඳහා වැය කරනු ලබන වියදම පිරිවැයට ඇතුළත් වේ. තොග නිකුත් කිරීමේදී පළමුව ලැබෙන භාණ්ඩය පළමුව නිකුත් කිරීමේ ක්‍රමවේදය භූ. ස. ප. කා. විසින් භාවිතා කරනු ලැබේ.

1.2.4 වත්කම් හානිය

කිසියම් හානියක් පිළිබඳව වාර්තා කරනු ලැබ තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වත්කම පිළිබඳව වාර්තා කරනු ලබන දිනයේදීම වත්කම්වල ධාරණ වටිනාකම සමාලෝචනය කරනු ලැබේ. එවැනි කිසියම් හානියක් පිළිබඳව වාර්තා වේ නම් වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ වත්කම් ඒකකයක ධාරණ වටිනාකම එහි අය කර

ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලැබේ. අය කර ගත හැකි වටිනාකම තීරණය කිරීම සඳහා භාවිතා කරන ලද ඇස්තමේන්තුවල වෙනසක් සිදු වී ඇති නම් හානිකරන අලාභයන් ප්‍රතිවර්තනය කරනු ලැබේ.

1.2.5 මූල්‍ය වත්කම්

වටිනාකම් පියවීම සඳහා භූ . ස. ප. කා. සතුව නීතිමය හිමිකමක් ඇති සහ වත්කම උපලබ්ධි කර වගකීම පියවීම එකවර සිදු කිරීම හෝ ශුද්ධ පදනමක් මත පියවීම යන කාර්යයන් දෙකෙන් එකක් සිදු කිරීමට අදහස් කරන අවස්ථාවකදී, සහ එවැනි අවස්ථාවකදී පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් සහ වගකීම් පියවා ශුද්ධ වටිනාකම ඉදිරිපත් කිරීම සිදු කරනු ලැබේ.

භූ . ස. ප. කා. හි මූල්‍ය වත්කම් තුළට මුදල් සහ කෙටිකාලීන ආයෝජන සහ වෙළඳ සහ අනිකුත් ලැබිය යුතු දෑ ඇතුළත් ය.

(අ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ තුළට වෙළඳ ලැබිය යුතු දෑ, සේවක ණය, තැන්පතු, අත්තිකාරම්, අනිකුත් ලැබිය යුතු දෑ සහ මුදල් හා මුදල් තුල්‍යයන් ඇතුළත් වේ.

ගිවිසුම්ගත වටිනාකම් මත ඇති සේවක ණය වාර්තා කිරීමට සහ ඉදිරිපත් කිරීමට භූ . ස. ප. කා. විසින් අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

(ආ) කල් පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් මත ස්ථාවර කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරෙන තෙක් රඳවා ගැනීමට භූ . ස. ප. කා. හට නිශ්චිත චේතනාවක් හා හැකියාවක් පවතින විටදී කල් පිරෙන තෙක් රඳවා ගත් දෑ ලෙසට වර්ගීකරණය කරනු ලැබේ. රජයේ සුරකුම්පත් සහ ස්ථිර තැන්පතු තුළ සිදු කර ඇති ආයෝජන කල් පිරෙන තෙක් රඳවා ගත් ආයෝජන යටතේ වර්ගිකරණය කරනු ලැබ ඇත.

(ඇ) බරපතල රෝග සහ සුභසාධන අරමුදල / ගෝලීය භූ කම්පන මාන ජාලය

පසුගිය වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශනය තුල පෙන්වනු ලැබ ඇති පහත සඳහන් ස්ථාවර තැන්පතු මෙම මූල්‍ය ප්‍රකාශනය තුල සටහනක් ලෙස වෙනම අනාවරණය කරනු ලැබ ඇත.

බරපතල රෝග සහ සුභසාධන අරමුදලෙහි ස්ථිර තැන්පතු 40,789,153.33

ගෝලීය භූ කම්පන මාන ජාලය
12,814,733.48

1.2.6 මූල්‍ය වත්කම්වල හානිය

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක් හානියට ලක් වී තිබේද යන්න පිළිබඳව විෂය මූලික සාක්ෂි තිබේද යන්න එක් එක් වාර්තාකරණ දිනයේදී භූ . ස. ප. කා. විසින් තක්සේරු කරනු ලබන අතර එවැනි හානියක් සිදු වී ඇත්නම්, වත්කමෙහි ධාරන වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගැලීම්වල වර්තමාන වටිනාකම අතර වෙනස සැලකිල්ලට ගනිමින් හානි වූ වටිනාකම ගණනය කරනු ලැබේ.

1.2.7 මුදල් හා මුදල් තුල්‍යයන්

අත ඇති මුදල් සහ බැංකුවෙහි ඇති තැන්පතු මුදල් හා මුදල් තුල්‍යයන්ට ඇතුළත් වේ.

සියලුම ප්‍රාදේශීය කාර්යාල සඳහා 2021 වර්ෂය තුලදී අදාල ප්‍රදේශ තුල බැංකු ගිනුම් විවෘත කිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි කළමනාකාරිත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ ඇත

1.3 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබ ඇත්තේ ඉල්ලීමක් කළ හැකි අවස්ථාවකදී හෝ වාර්තා කරන දිනයේ සිට අවුරුද්දක කාලයක් තුළ ගෙවිය යුතු වන වගකීම් ය. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තා කරන දිනයේ සිට අවුරුදු්දක කාලයකට පසුව ගෙවිය යුතු වන ශේෂයන් ය.

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේදී එම සියළුම දැනුවත් වගකීම් ගිණුම්ගත කර ඇත. අතීත සිදුවීමක් හේතුවෙන් භූ . ස. ප. කා. සතුව නීතිමය හෝ

අනුමත වගකීමක් ඇති සහ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වන අවස්ථාවකදී ප්‍රතිපාදන සහ වගකීම් හඳුනාගනු ලැබේ.

1.3 (අ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට එරෙහිව දිස්ත්‍රික් අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය සහ ශ්‍රේෂ්ඨාධිකරණය තුල පවරා ඇති නඩු සංඛ්‍යාව 28 කි. කෙසේ වුවද පැමිණිලිකරුවන් විසින් වන්දි ඉල්ලනු ලැබ තිබුනද නඩු 2 ක් සම්බන්ධ වගකීම නීති අංශය විසින් හඳුනාගනු ලැබ නොමැත.

1.3 (ආ) කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබේ නම් සේවාදායකයන් විසින් කරනු ලබන ඉල්ලීම් මත ඔවුන් වෙත ඔවුන් විසින් කරන ලද ගෙවීම් සිදු කිරීම සඳහා සේවාදායකයන් විසින් ලැබූ පරීක්ෂා කිරීම් ගාස්තු ආදායම සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ප්‍රතිපාදන සලසනු ලැබ ඇත.

1.3.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

ණය ගනුදෙනු, කලින් අත්සන් කරන ලද ගිවිසුම් මත භාරගනු ලබන ව්‍යාපෘති කටයුතු ,සඳහා එළඹීම කාර්යාංශය විසින් සීමා කරනු ලැබ තිබුණද එවැනි ගිවිසුම් මත කාර්යාංශය වෙත දිගු කාලයක් තිස්සේ අය විය යුතුව තිබෙන යම් යම් මුදල් ප්‍රමාණයන් ඇති අතර පහත සඳහන් නිර්ණායක යොදා ගනිමින් එවැනි නොගෙවා ඇති මුදල් ප්‍රමාණයන් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබ ඇත.

ණයකරුවන් විසින් නොගෙවා ඇති මුදල් ප්‍රමාණය	වර්ෂයකට අඩු කාලයක් තිස්සේ නොගෙවා තිබෙන (අවුරුදු0-1)	අවුරුද්දකට වඩා වැඩි සහ අවුරුද්ද දෙකකට වඩා අඩු කාලයක් තිස්සේ නොගෙවා තිබෙන(අවුරුදු1-2)	අවුරුදු දෙකකට වඩා වැඩි අවුරුදු තුනකට වඩා අඩු කාලයක් තිස්සේ නොගෙවා ඇති(අවුරුදු2-3)	අවුරුදු තුනකට වඩා වැඩි සහ අවුරුදු හතරකට වඩා අඩු කාලයක් තිස්සේ නොගෙවා තිබෙන (අවුරුදු3-4)	අවුරුදු පහකට වඩා වැඩි කාලයක් තිස්සේ නොගෙවා තිබෙන (අවුරුදු 5ට වැඩි)
ප්‍රතිපාදන ප්‍රමාණය	ප්‍රතිපාදන නොමැත	ණයකරවැන් ගෙවිය යුතු මුදලින් 40%	ණයකරුවන් ගෙවිය යුතු මුදලින් 50%	ණයකරුවන් ගෙවිය යුතු මුදලින් 60%	100% ක ප්‍රතිපාදන

1.3.2 ප්‍රදානයන්

(අ) ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

භූ. ස. ප. කා. විසින් දරන ලද වියදම් හානිපූරණය කරනු ලබන ප්‍රදානයන් එකී වියදම් හඳුනාගනු ලබන කාල පරිච්ඡේදය තුළදීම විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. වත්කමක් සඳහා භූ. ස. ප. කා. විසින් දරන ලද පිරිවැය හානිපූරණය කරනු ලබන ප්‍රදානයන් එකී වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය තුළ දී , ක්‍රමානුකූල පදනමක් මත, විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

1.3.3 සේවක ප්‍රතිලාභ

(අ) විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

සියළුම සුදුසුකම් ලත් සේවකයන් සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව නියම කර ඇති ප්‍රතිලාභ සැලැස්ම භූ . ස. ප. කා. විසින් සම්මත කර ඇත. ප්‍රතිලාභ සැලැස්ම සඳහා මූල්‍ය සම්පාදනය කරනු නොලැබේ. රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 19 - සේවක ප්‍රතිලාභ යන ප්‍රමිතිය සැලකිල්ලට ගනිමින් භූ . ස. ප. කා. විසින් පාරිතේෂික සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සාමාන්‍යයෙන් වයස, සේවය කළ හා වන්දි ලබා දුන් අවුරුදු ගණන යන සාධක වලින් එකක් හෝ කිහිපයක් මත පදනම් වෙමින් සේවකයෙකු හට විශ්‍රාම ලැබීමේ දී ලැබෙන ප්‍රතිලාභ ප්‍රමාණය නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් ඇස්තමේන්තු කරනු ලැබේ.

(ආ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් විසින් ස්ථාවර දායකත්ව මුදලක් වෙනම ආයතනයක් වෙතට ගෙවනු ලබන අතර ඊට අමතරව වැඩිදුර මුදල් ප්‍රමාණයක් ගෙවීම සඳහා නීතිමය හෝ අනුමිත වගකීමක් ඇති නොවේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්ව මුදල් ගෙවීම සඳහා වන වගකීම් එකී වගකීම් ඇති වන පරිදි සහ ඇති වන විට විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

(ඇ) සේවක අර්ථසාදක අරමුදල

භූ . ස. ප. කා. විසින් සහ එහි සේවකයන් විසින් එක් එක් සේවකයාගේ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 10% ප්‍රමාණයක් සේවක අර්ථසාදක අරමුදලට දායක මුදල් ගෙවනු ලැබේ.

කෙසේ වුවද සේවක දායකත්ව මුදල්වලින් නිවැරදි අනුපාතය පවත්වාගෙන යාම සඳහා භූ . ස. ප. කා. විසින් කම්කරු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡාවක් පවත්වා ඇත.

(ඈ) සේවකයන්ගේ භාර අරමුදල

එක් එක් සේවකයාගේ වැටුපෙන් 3% ප්‍රමාණයක් භූ . ස. ප. කා. විසින් සේවකයන්ගේ භාර අරමුදල වෙත දායක කරනු ලැබේ.

1.3.4 වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැය මත සඳහන් කරනු ලැබේ.

1.3.5 බදුකරණය

2016 අංක 10 දරණ දේශීය ආදායම් පනත සහ 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත ප්‍රකාරව බදුකරණ කාර්යයන් සඳහා ගැලපීම් සිදු කරන ලද පරිදි වර්ෂය තුළ ලාභය මත පදනම්ව බදුකරණය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. 2018.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තම මුළු ඉපැයීම් මත පදනම්ව කාර්යාංශය විසින් බදු ගෙවීමට යටත් වන අතර ක්‍රියාත්මක වන දිනෙන් පසුව ඉපැයීම් සඳහා 24%ක අනුපාතයකට බදු ගණනය කරනු ලැබේ.

භූ . ස. ප. කා. විසින් එකතු කළ අගය මත බද්ද ගෙවීමට වගකීමට ලක් වන අතර එකතු කළ අගය මත බදු පනතෙහි විධිවිධාන හා අනුකූලව කටයුතු කරනු ලැබ ඇත. ගෙවිය යුතු එකතු කළ අගය මත බදු සහ / හෝ අයකරගත හැකි ප්‍රමාණයන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ දක්වනු ලැබේ.

1.3.6 විලම්බිත බදුකරණය

ශේෂ පත්‍ර දිනයට විලම්බිත බදු වගකීම රු.49,919,112.00 වේ.

1.3.7 විදේශ මුදල් ගනුදෙනු

ගනුදෙනු සිදු කරන ලද අවස්ථාවේදී බලපැවැත්වූ විනිමය අනුපාත මත සියළුම විදේශ විනිමය ගනුදෙනු, වාර්තාකරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ.

1.3.8 ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

අසම්භාව්‍ය වගකීම් යනු පැවතීමට ඉඩකඩ ඇති වගකීම් වන අතර ඒවායේ පැවතීම සනාථ කරනු ලබන්නේ අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන වගකීම් මගින් පමණි. එහිදී ආර්ථික ප්‍රතිලාභ පැවරීම සිදු විය නොහැකි හෝ විශ්වාසනීය ලෙස මැනිය නොහැකි හෝ වේ. භූ . ස. ප. කා. හි ප්‍රාග්ධන බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම් පහත සඳහන් කරනු ලැබ ඇති ආකාරයට අනාවරණය කරනු ලැබේ.

බදුල්ල ප්‍රාදේශීය කාර්යාල පරිශ්‍රය 2010- 2011 කාල පරිච්ඡේදය තුළදී භූ . ස. ප. කා. විසින් කුලියට ගෙන තිබූ අතර එහි ගින්නක් ඇති වී තිබුණි. භූ . ස. ප. කා. පාර්ශ්වයෙහි නොසැලකිල්ල හේතුවෙන් ගින්න හට ගෙන ඇති බව ඉඩම් හිමියාගේ අදහස වන අතර ඔහු විසින් නඩු අංක එච් 7523 යටතේ බදුල්ල දිසා අධිකරණයෙහි නඩුවක් පවරා ඇත. කෙසේ වුවද ඉඩම් හිමියාට රුපියල් මිලියන 1.2ක මුදලක් ගෙවන ලෙස අධිකරනය විසින් තීන්දුක් ලබා දී ඇත.එසේහෙයින් එකී අලාභය ගෙවීම සඳහා 2022 ඇස්තමේන්තුගත අයවැයෙන් භූ . ස. ප. කා. විසින් ප්‍රතිපාදන වෙන් කරන ලදි.

1.4. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

1.4.1 ආදායම හඳුනාගැනීම

ආර්ථික ප්‍රතිලාභ භූ . ස.ප.කා. වෙත ගලා යාමට සහ එය විශ්වසනීය ලෙස මැනීමට හැකියාව ඇති ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු හැර ලැබී ඇති හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ අගය මත ආදායම මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

(අ) රාජ්‍ය භාග ආදායම

ශ්‍රී ලංකා රජය විසින් 1993 නොවැම්බර් මස 26 වන දින නිකුත් කරන ලද 794/23 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පස්වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය භාගය හඳුනාගැනීමට පියවර ගෙන ඇත.

එය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මෙහෙයුම් වියදමට සෘජුවම අදාල නොවන හෙයින් වර්ෂය තුලදී මහ භාණ්ඩාගාරය වෙත මාරු කර යවනු ලබන රාජ්‍ය භාග ආදායම හිමිකම්වල වෙනස්කම් තුළ ගලපනු ලැබේ.

(ආ) පොළී ආදායම

වත්කම් මත සඵල ආදායම සැලකිල්ලට ගනු ලබන කල අනුමාන පදනමක් මත පොළී ආදායම හඳුනාගනු ලැබේ.

(ඇ) අනෙකුත් ආදායම

උපචිත පදනම මත අනිකුත් ආදායම හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණ සහ අනිකුත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමේදී ඇතිවන ආදායමක ස්වභාවය ඇති ශුද්ධ ලාභ හෝ අලාභ ඒවා බැහැර කිරීමේදී ලැබෙන මුදලින් වත්කමෙහි ධාරණ වටිනාකම හා අදාළ විකුණුම් වියදම් අඩු කර ගිණුම්වල සටහන් කර ඇත.

(ඈ) රජයේ ප්‍රදානයන්

ආදායම සහ විලම්භිත ආදායම ස්වභාවයට අයත් ලෙස සැලකිය හැකි සංවර්ධන කටයුතු වලට අදාළ රජයේ ප්‍රදානයන් ආදායම් ප්‍රවේශය යටතේ ගිණුම්ගත කරනු ලැබේ.

(ඉ) ආයෝජන ආදායම

පරිපාලිත සමාගම වෙතින් 2021 වර්ෂය තුලදී රු. මිලියන 2 ක ලාභාංශ ලැබුණු අතර එය 2020 වර්ෂයට අදාල ලාභාංශ විය. 2021 වර්ෂය සඳහා මේ දක්වා ලාභාංශ ලැබී නොමැත. කෙසේ වුවද මෙම ලාභාංශ ආදායම 2022 වර්ෂය තුලදී ලැබෙනු ඇත.

1.4.2 වියදම

දරන ලද වියදම සහ විශේෂිත ආදායම් අංග ඉපැයීම අතර සෘජු සම්බන්ධයෙහි පදනම මත ආදායම් ප්‍රකාශනය තුළ වියදම් හඳුනාගනු ලැබේ. වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේ දී කාර්යක්ෂම තත්ත්වයකින් ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත සහ උපකරණ නඩත්තු කිරීම සඳහා දරන ලද සියළුම වියදම් ආදායමට වැය බරක් වී ඇත.

(ආ) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන අංශ ලෙස භූ විද්‍යා සහ කැනීම් අංශ වෙත දරන ලද වියදම මෙහෙයුම් කටයුතු තුළට ඇතුලත් වේ.

(ඇ) 2021 වර්ෂය තුලදී අනිකුත් සහායක අංශ සඳහා දරන ලද වියදම් පරිපාලන වියදම් තුලට ඇතුලත් වේ.

1.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිලියෙල කරනු ලැබ ඇත.

ගෙවන ලද පොළිය මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙස වර්ගීකරණය කරනු ලබන අතර ලැබෙන පොලිය ආයෝජන මුදල් ප්‍රවාහය ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

1.6 වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම් සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී යෝග්‍ය ගැලපීම් ගිණුම් තුළ සිදු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රමාණාත්මක ගැලපීම් හෝ

අනාවරණය කිරීම් අවශ්‍ය කරනු ලබන තත්ත්වයන් කිසිවක් වාර්තා කරන දින සිට ඇති වී නොමැත.

1.7 සම්බන්ධිත පාර්ශ්ව වල ගනුදෙනු

වාර්තා කරන දිනයට කාර්යාංශය සමග බලපැවැත්වෙන ගිවිසුම් සහ / හෝ යෝජිත ගිවිසුම් කිසිවකට කිසිදු අධ්‍යක්ෂවරයෙකු සම්බන්ධ වී නොමැත. කෙසේ වුවද භූ . ස. ප. කා. හි සභාපතිවරයා පරිපාලිත සමාගමෙහි ද (සී/ස ජී. එස්. එම්. බී. තාක්ෂණික සේවා සමාගම) සභාපතිවරයා වේ. භූ . ස. ප. කා. හි ජ්‍යෙෂ්ඨ කැනීම් ඉංජිනේරුවරයා SLRDC හි අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සාමාජිකයෙකි. (රාජ්‍ය ආයතන)

1.7.1 සාධාරණ වටිනාකම හෝ ප්‍රත්‍යාගනණය ආදේශක පිරිවැය ලෙස

පිරිවැය ආකෘතිය යොදා ගනිමින් ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පිලියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සින්නක්කර දේපල, පිරියත සහ උපකරණ දක්වනු ලැබේ. ආදේශක පිරිවැය ලෙස සාධාරණ වටිනාකම භාවිතා කිරීමට භූ . ස. ප. කා. විසින් තෝරා ගෙන නොමැත.

1.7.2 සුවිශේෂී ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීදෙදී වර්ෂය තුළ දී නිකුත් කරන ලද සහ ක්‍රියාත්මක ප්‍රමිතිය භූ . ස. ප. කා. විසින් අනුගමනය කරනු ලැබ ඇත.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2021 දෙසැම්බර් මස 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ව ප්‍රකාශනය

2020				2021	
භූ.ස.ප.කා	සමූහය	වත්කම්	සටහන	සමූහය	භූ.ස.ප.කා
Rs.	Rs.			Rs.	Rs.
462,909,038	504,027,729	**ජංගම නොවන වත්කම්**			
159,045,551	159,045,551	දේපල, පිරියත හා උපකරණ	1	493,727,022	464,956,754
621,954,589	**663,073,280**	කෙරිගෙන යන වැඩ	2	326,616,983	326,616,983
		මුළු ජංගම නොවන වත්කම්		**820,344,005**	**791,573,737**
		අනිකුත් ජංගම නොවන වත්කම්			
4,000,000	-	ආයෝජන	3	-	4,000,000
51,370,580	70,636,872	විලම්බිත බදු වත්කම්	4	82,214,179	65,860,635
3,119,309,526	3,390,493,340	ස්ථාවර තැන්පතු	5	2,882,877,543	2,596,992,830
3,174,680,106	**3,461,130,212**	මුළු අනිකුත් ජංගම නොවන වත්කම්		**2,965,091,723**	**2,666,853,465**
		ජංගම වත්කම්			
32,115,617	52,025,144	භාණ්ඩ තොගය	6	48,759,103	31,804,432
57,584,844		වෙළඳ ණය ගැතියන්	7	192,495,930	180,234,642
140,747,314	310,215,110	අනිකුත් ලැබිය යුතු දෑ	8	221,379,926	149,541,193
-		අන්තර් සමාගම	9	27,277,360	24,092,839
16,463,224		පූර්ව ගෙවීම් සහ තැන්පතු	10	14,509,329	14,509,329
84,772,024	103,602,797	මුදල් හා මුදල් තුල්‍යයන්	11	199,260,399	157,916,939
331,683,022	**465,843,051**	අනිකුත් ලැබිය යුතු දෑ		**703,682,048**	**558,099,374**
4,128,317,717	**4,590,046,543**	මුළු ජංගම වත්කම්		**4,489,117,775**	**4,016,526,577**
		හිමිකම් සහ වගකීම්			
		හිමිකම් සහ සංචිත			
2,736,894,110	2,948,639,366	අරම්භක හිමිකම් සහ සංචිත		2,778,886,771	2,612,432,098
(1,195,331,284)	(1,195,331,284)	ඉකුත් වර්ෂය සඳහා ගැලපීම්		41,863,532	28,611,675
773,685,180	730,394,597	වර්ෂය තුළ ලාභය		1,560,629,821	1,552,956,756
(8,598,504)	(8,598,504)	මහා භාණ්ඩාගාරය මාරු කර යැවීම්		(2,000,000,000)	(2,000,000,000)
-	86,227,336	පාලනයට අයත් නොවන හිමිකම්		95,689,797	-
305,782,596	305,782,596	ප්‍රත්‍යාගණන තැන්පතු		17,241,822	17,241,822
2,612,432,098	**2,867,114,107**			**2,494,311,743**	**2,211,242,351**
4,135,178	4,135,178	ලැබුණු විදේශ ප්‍රේෂණ	12	2,370,912	2,370,912
35,750,158	35,750,159	ආපදා සහ සේවක ප්‍රතිලාභ ගිණුම		-	-
2,652,317,434	**2,906,999,444**	මුළු හිමිකම් සහ සංචිත		**2,496,682,655**	**2,213,613,263**
		ජංගම නොවන වගකීම්			
238,321,390	219,000,818	විශ්‍රාම පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන	13	292,966,115	267,810,585
25,457,826	25,457,826	ගෙවිය යුතු දිගුකාලීන කල්බදු (වාහන)	16	15,964,704	15,964,704
60,253,441	61,244,360	විලම්බිත බදු වගකීම්	4	50,504,795	49,919,112
324,032,657	**305,703,004**	මුළු ජංගම නොවන වගකීම්		**359,435,614**	**333,694,401**
		ජංගම වගකීම්			
330,949,437	734,009,295	ණය හිමියන් සහ ගෙවිය යුතු දේ	14	643,424,633	525,013,235
194,130,301		උපචිත වියදම්	15	249,228,756	203,859,561
13,781,772	643,334,802	ගෙවිය යුතු කෙටි කාලීන කල් බදු (වාහන)	16	13,781,053	13,781,054
-		පරීක්ෂා කිරීමේ ගාස්තු ආපසු ලබා දීම් සඳහා ප්‍රතිපාදන	17	3,264,024	3,264,024
613,106,116		වෙනත් ගෙවිය යුතු දේ	18	723,301,038	723,301,038
1,151,967,626	**1,377,344,096**	**මුළු ජංගම වගකීම්**		**1,632,999,505**	**1,469,218,912**
1,476,000,283	**1,683,047,099**			**1,992,435,120**	**1,802,913,313**
4,128,317,717	**4,590,046,543**	**මුළු හිමිකම් සහ වගකීම්**		**4,489,117,775**	**4,016,526,577**



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2020			2021	
භූ ස ප කා රු.	**සමූහය රු.**		**සමූහය රු.**	**භූ ස ප කා රු.**
2,025,438,787	2,501,283,383	ආදායම	3,752,577,431	2,999,814,453
77,637,587	92,757,085	වෙනත් ආදායම	87,367,815	64,741,549
(650,901,099)	(1,071,335,505)	මෙහෙයුම් වියදම	(1,326,099,355)	(672,882,796)
(517,266,955)	(644,459,521)	පරිපාලන වියදම්	(585,094,263)	(492,011,335)
934,908,320	**878,245,442**	මෙහෙයුම් ලාභය	**1,928,751,627**	**1,899,661,871**
(5,525,422)	(5,765,578)	මූල්‍ය පිරිවැය	(4,655,790)	(4,319,059)
143,082,794	143,082,794	ශුද්ධ මුල්‍ය පිරිවැය	165,836,217	165,836,217
1,072,465,692	**1,015,562,658**	බදු වලට පෙර ලාභය	**2,089,932,054**	**2,061,179,029**
298,780,512	285,168,061	ආදායම් බදු වියදම්	525,465,700	508,222,272
773,685,180	**730,394,597**	වර්ෂය තුළ ලාභය	**1,564,466,354**	**1,552,956,756**
		ලාභය සඳහා වගකිව යුතු වන්නේ		
773,685,180	744,824,791	හිමිකරුවන් (භූ.ස.ප.කා)	1,560,629,821	1,552,956,756
-	(14,430,195)	පාලනයට අයත් නොවන හිමිකම්	3,836,532	
773,685,180	**730,394,596**		**1,564,466,354**	**1,552,956,756**

2021 දෙසැම්බර් මස 31 දිනට හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

සමූහය	ඒකාබද්ධ අරමුදල	දෙපාර්තමේන්තු අරමුදල	ප්‍රාග්ධන අරමුදල	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයීම්	පාලනයට අයත් නොවන හිමිකම්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
ජනවාරි මස 01 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	27,652,883	1,746,726	68,916,655	305,782,596	2,374,787,911	83,227,336	2,862,114,107
කොටස්	-	-	-	-	-	2,000,000	**2,000,000**
වර්ෂය තුල ලාභය	-	-	-	-	1,560,629,822	3,836,532	**1,564,466,354**
වර්ෂය තුල ප්‍රත්‍යාගණන අතිරික්තය	-	-	-	17,241,822	-	-	**17,241,822**
	-	-	-	-			
ආදායම් - ඉකුත් වර්ෂය සඳහා ගැලපීම්	-	-	-	-	41,863,533	6,625,928	**48,489,461**
මුළු ආදායම	**27,652,883**	**1,746,726**	**68,916,655**	**323,024,418**	**3,977,281,266**	**95,689,796**	**4,494,311,743**
	-	-	-	-			
මහා භාණ්ඩාගාරයට මාරු කර යැවීම්	-	-	-	-	(2,000,000,000)	-	**(2,000,000,000)**
ලාභාංශ	-	-	-	-	-		-
වියදම් - ඉකුත් වර්ෂය හා ගැලපීම	-	-	-	-		-	-
2021 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	**27,652,883**	**1,746,726**	**68,916,655**	**323,024,418**	**1,977,281,266**	**95,689,796**	**2,494,311,743**



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
2021 දෙසැම්බර් මස 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020			2021
භූ.ස.ප.කා	සමූහය	විස්තරය	සමූහය
රු.	රු.		රු.
1,072,465,693	**1,029,175,108**	බදු සහ පොළී ගෙවීම් වලට පසුව පුනරාවර්තන ව්‍යාපෘති වලට සාපේක්ෂව ආදායම හෝ අතිරික්තය	**1,564,466,354**
-	-	ආදායම් බදු	17,243,428
-	-	පරිපාලිත සමාගමෙන් ලාභාංශ ආදායම්	(2,000,000)
106,782,013	118,598,066	ක්ෂයවීම්	115,257,802
-	(13,612,451)	විලම්බිත බදු ගැලපීම්	
48,567,942	52,632,599	පාරිතෝෂික	34,625,333
(5,331,284)	(5,331,284)	ඉකුත් වර්ෂය හා ගැලපීම්	48,489,461
-	43,054,708	බොල් ණය සඳහා ප්‍රතිපාදන	(5,660,884)
		බැහැර කිරීම් මත (ලාභය) / අලාභය	25,938
(143,082,794)	(143,082,794)	මූල්‍ය ආදායම්	(15,170,906)
1,079,401,570	**1,081,433,952**		**1,757,276,525**
		කාරක ප්‍රාග්ධන ගැලපීම්	
16,170,703	16,825,163	තොග (වැඩි කරන ලද) / අඩු කරන ලද	3,266,041
35,709,843	39,010,601	වෙළඳ ණය ගැතියන් (වැඩි කරන ලද / අඩු කරන ලද)	(110,900,731)
-	-	විලම්බිත බදු (වැඩි කරන ලද / අඩු කරන ලද)	(24,824,384)
-	-	අනිකුත් ලැබිය යුතු දේ (වැඩි කරන ලද / අඩු කරන ලද)	(14,540,638)
-	-	අන්තර් සමාගම් (වැඩි කරන ලද / අඩු කරන ලද)	(19,629,337)
-	-	පූර්ව ගෙවීම් හා තැන්පතු (වැඩි කරන ලද / අඩුකරන ලද)	1,953,895
143,402,537	145,418,042	ණයහිමියන් සහ අනිකුත් ගෙවිය යුතු දේ (වැඩි කරන ලද / අඩු කරන ලද)	160,251,973
93,185,414	93,185,415	උපචිත වියදම් (වැඩි කරන ලද / අඩු කරන ලද)	26,383,627
-	-	පරීක්ෂා කිරීමේ ගාස්තු ආපසු ගෙවීම් සඳහා ප්‍රතිපාදන (වැඩි කරන ලද / අඩු කරන ලද)	3,264,024
-	-	අනිකුත් (වැඩි කරන ලද / අඩු කරන ලද)	110,194,922
1,367,870,067	**1,375,873,173**	මෙහෙයුම් කටයුතු වලින් උපදවනු ලැබ මුදල්	**1,892,695,916**
-	(119,999)	ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු	-
(8,197,930)	(8,197,930)	ගෙවන ලද පාරිතෝෂික	(1,768,195)
1,359,672,137	**1,367,555,245**	බදුවලට පෙර මෙහෙයුම් කටයුතු වලින් උපදවනු ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,890,927,721**
(152,352,709)	(160,646,195)	ගෙවන ලද ආදායම් බදු	(14,735,916)
1,207,319,428	**1,206,909,049**	බදුවලට පෙර මෙහෙයුම් කටයුතු වලින් උපදවනු ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,876,191,805**
(61,669,692)	(84,144,062)	දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(87,741,211)
(59,272,501)	(59,272,501)	කෙරඟෙන යන වැඩ සඳහා එකතු කිරීම්	(167,571,432)
		ස්ථිර තැන්පතු ආපසු ගැනීම්	522,316,696
(1,176,096,010)	(1,196,685,002)	ස්ථිර තැන්පතු වල ආයෝජනය	(14,700,899)
148,505,843	148,505,843	මූල්‍ය ආදායම්	15,170,906
(1,148,532,360)	**(1,191,595,721)**	ආයෝජන කටයුතු, මූල්‍ය කටයුතු වලින් උපයන ලද ශුද්ධ මුදල් ප්‍රමාණය	**267,474,060**
(8,440,913)	(8,440,913)	මහා භාණ්ඩාගාරයට මාරු කර යැවීම	(2,000,000,000)
-	-	ගෙවන ලද ලාභාංශ	(1,000,000)
(13,781,772)	(13,781,772)	ගෙවන ලද කල්බදු	(9,493,839)
(4,860,050)	(4,860,050)	ආපදා අරමුදල	(35,750,159)
		ප්‍රේෂණ මඟින් ලැබුණු මුදල් (විදේශීය)	(1,764,266)
(27,082,735)	**(27,082,735)**	මූල්‍ය කටයුතු වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(2,048,008,264)**
31,704,333	(11,769,407)	වර්ෂය තුළදී උපයන ලද (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රමාණය	95,657,602
53,067,690	115,372,204	වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් තුල්‍යයන්	103,602,798
84,772,024	**103,602,798**	වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් තුල්‍යයන්	**199,260,399**
84,772,024	103,602,798	මුදල් හා මුදල් තුල්‍යයන්	199,260,399

සටහන 01
දේපල, පිරියත හා උපකරණ
1. 1 සමූහය

විස්තරය	2021-01-01 දිනට ශේෂය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ප්‍රත්‍යාගණනය	බැහැර කරන ලද භාණ්ඩ	2021-12-31 දිනට ශේෂය	2021-01-01 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	වර්ෂය තුල ක්ෂය කිරීම්	ගැලපීම්	2021-12-31 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	2021-12-31 දිනට ලියා හරින ලද වටිනාකම
ඉඩම් වටා වැට බැඳීම	1,882,214	4,874,816	-	-	6,757,030	876,855	285,192	-	1,162,047	5,594,982
ගොඩනැගිලි	45,347,210	10,133,193	12,307,000	-	67,787,403	14,343,447	2,286,660	-	16,630,107	51,157,296
ගොඩනැගිලි කොටස් කිරීම	68,864,156	2,757,005	-	-	71,621,161	39,496,155	10,000,879	-	49,497,035	22,124,126
පිරියත හා යන්ත්‍රෝපකරණ	52,263,316	1,350,000	-	-	53,613,316	10,285,062	6,784,040	-	17,069,101	36,544,215
මෝටර් වාහන	358,977,261	-	-	-	358,977,261	284,783,885	21,183,333	-	305,967,218	53,010,043
සිතියම් උපකරණ	9,103,384	-	-	-	9,103,384	9,103,317	-	-	9,103,317	68
විදුම් අමතර කොටස	131,076,109	10,687,093	-	-	141,763,202	23,358,229	17,200,114	-	40,558,343	101,204,859
විද්‍යාගාර උපකරණ	232,097,316	45,443,566	-	-	277,540,882	208,848,510	16,136,321	-	224,984,831	52,556,051
ක්ෂේත්‍ර උපකරණ	65,574,894	1,670,330	-	-	67,245,224	39,770,795	7,511,071	-	47,281,866	19,963,358
කාර්යාල උපකරණ	126,242,542	3,494,015	-	(30,000)	129,706,557	95,590,462	11,397,275	(4,063)	106,983,675	22,722,882
සන්නිවේදන උපකරණ	15,985,353	420,010	-	-	16,405,363	7,931,557	1,633,420	-	9,564,977	6,840,385
ගෘහභාණ්ඩ සහ උපාංග	53,790,788	1,154,412	-	-	54,945,200	25,440,652	5,035,483	-	30,476,135	24,469,066
නාම පුවරු	1,597,610	87,271	-	-	1,684,881	1,120,230	278,952	-	1,399,182	285,699
සිතියම්	475,825	-	-	-	475,825	359,963	23,790	-	383,753	92,072
පුස්තකාල පොත්	30,525,273	-	-	-	30,525,273	17,668,848	1,202,935	-	18,871,783	11,653,490
කෞතුකාගාර භාණ්ඩ	1,337,056	-	-	-	1,337,056	-	-	-	-	1,337,056
මෘදුකාංග හා උපාංග	10,504,638	-	-	-	10,504,638	10,422,598	28,132	-	10,450,730	53,908
යක්කල වෙරළවත්තේ පිහිටි එම ගබඩාව	27,207,663	-	-	-	27,207,663	27,108,572	8,089	-	27,116,661	91,003
ගම්පහ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල	19,251,356	-	-	-	19,251,356	17,708,941	962,568	-	18,671,509	579,848
පරිගණක හා උපාංග	105,974,800	5,669,500	-	-	111,644,300	68,731,110	13,299,549	-	82,030,659	29,613,641
ඉඩම් - භූ. ස ප. කා	28,000,000	-	7,000,000	-	35,000,000	-	-	-	-	35,000,000
නුවර ප්‍රාදේශීය කාර්යාලය	1,745,685	-	-	-	1,745,685	-	-	-	-	1,745,685
රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය	13,687,291	-	-	-	13,687,291	-	-	-	-	13,687,291
මහකනදරාව ජ එෆ් ඉඩම් මධ්‍යස්ථානය	2,670,527	-	(970,527)	-	1,700,000	-	-	-	-	1,700,000
හක්මන ජ එෆ් ඉඩම් මධ්‍යස්ථානය	2,794,651	-	(1,094,651)	-	1,700,000	-	-	-	-	1,700,000
මුළු එකතුව	**1,406,976,917**	**87,741,211**	**17,241,822**	**(30,000)**	**1,511,929,950**	**902,949,189**	**115,257,802**	**-**	**1,018,202,928**	**493,727,022**

සටහන 01
දේපල, පිරියත හා උපකරණ
1. 2 භූ . ස.ප. කා

විස්තරය	2021-01-01 දිනට ශේෂය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ප්‍රත්‍යාගණනය	බැහැර කරන ලද භාණ්ඩ	2021-12-31 දිනට ශේෂය	2021-01-01 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	වර්ෂය තුල ක්ෂය කිරීම්	ගැලපීම්	2021-12-31 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	2021-12-31 දිනට ලියා හරින ලද වටිනාකම
ඉඩම් වටා වැට බැඳීම	1,882,214	4,874,816	-	-	6,757,030	876,855	285,192	-	1,162,047	5,594,982
ගොඩනැගිලි	45,347,210	10,133,193	12,307,000	-	67,787,403	14,343,447	2,286,660	-	16,630,107	51,157,296
ගොඩනැගිලි කොටස් කිරීම	46,332,692	2,005,126	-	-	48,337,818	24,505,388	6,459,085	-	30,964,472	17,373,346
පිරියත හා යන්ත්‍රෝපකරණ	52,263,316	1,350,000	-	-	53,613,316	10,285,062	6,784,040	-	17,069,101	36,544,215
මෝටර් වාහන	340,065,299		-	-	340,065,299	265,871,923	21,183,333	-	287,055,256	53,010,043
සිතියම් උපකරණ	9,103,384		-	-	9,103,384	9,103,317	-	-	9,103,317	68
විදුම් අමතර කොටස	131,076,109	10,687,093	-	-	141,763,202	23,358,229	17,200,114	-	40,558,343	101,204,859
විද්‍යාගාර උපකරණ	230,762,723	45,443,566	-	-	276,206,289	207,557,085	16,117,821	-	223,674,905	52,531,384
ක්ෂේත්‍ර උපකරණ	13,102,132	409,309	-	-	13,511,441	6,422,882	1,922,926	-	8,345,808	5,165,633
කාර්යාල උපකරණ	113,535,382	2,753,685	-	-	116,289,067	87,667,597	9,349,584	-	97,017,180	19,271,886
සන්නිවේදන උපකරණ	15,541,365	420,010	-	-	15,961,375	7,880,434	1,522,423	-	9,402,857	6,558,518
ගෘහභාණ්ඩ සහ උපාංග	45,323,837	1,035,162	-	-	46,358,999	19,181,793	3,982,165	-	23,163,958	23,195,040
නාම පුවරු					-					
සිතියම්	475,825	-	-	-	475,825	359,963	23,790	-	383,753	92,072
පුස්තකාල පොත්	30,525,273	-	-	-	30,525,273	17,668,848	1,202,935	-	18,871,783	11,653,490
කෞතුකාගාර භාණ්ඩ	1,337,056	-	-	-	1,337,056	-	-	-	-	1,337,056
මෘදුකාංග හා උපාංග	10,504,638	-	-	-	10,504,638	10,422,598	28,132	-	10,450,730	53,908
යක්කල වෙරළවත්තේ පිහිටි එම ගබඩාව	27,207,663	-	-	-	27,207,663	27,108,572	8,089	-	27,116,661	91,003
ගම්පහ ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල	19,251,356	-	-	-	19,251,356	17,708,941	962,568	-	18,671,509	579,848
පරිගණක හා උපාංග	87,138,436	5,243,000	-	-	92,381,436	56,442,094	10,230,209	-	66,672,303	25,709,133
ඉඩම් - භූ. ස ප. කා	28,000,000	-	7,000,000	-	35,000,000	-	-	-	-	35,000,000
නුවර ප්‍රාදේශීය කාර්යාලය	1,745,685	-	-	-	1,745,685	-	-	-	-	1,745,685
රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය	13,687,291	-	-	-	13,687,291	-	-	-	-	13,687,291
මහකනදරාව ජ එග් ඉඩම් මධ්‍යස්ථානය	2,670,527	-	(970,527)	-	1,700,000	-	-	-	-	1,700,000
හක්මන ජ එග් ඉඩම් මධ්‍යස්ථානය	2,794,651	-	(1,094,651)	-	1,700,000	-	-	-	-	1,700,000
මුළු එකතුව	**1,269,674,064**	**84,354,959**	**17,241,822**	**-**	**1,371,270,845**	**806,765,026**	**99,549,064**	**-**	**906,314,091**	**464,956,754**

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය - 2021

සටහන 01
දේපල, පිරියත හා උපකරණ
1. 3 ජී එස් එම් බී තාක්ෂණික සේවා සමාගම

විස්තරය	2021-01-01 දිනට ශේෂය	වර්ෂය තුල එකතු කිරීම්	වර්ෂය තුල ප්‍රත්‍යාගණනය	බැහැර කරන ලද භාණ්ඩ	2021-12-31 දිනට ශේෂය	2021-01-01 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	වර්ෂය තුල ක්ෂය කිරීම්	ගැලපීම්	2021-12-31 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	2021-12-31 දිනට ලියා හරින ලද වටිනාකම
පරිගණක හා උපාංග	22,531,464	751,879		-	23,283,343	14,990,768	3,541,795	-	18,532,562	4,750,780
Name Board	1,597,610	87,271		-	1,684,881	1,120,230	278,952	-	1,399,182	285,699
ලී බඩු හා සවි කිරීම	8,466,952	119,250		-	8,586,202	6,258,859	1,053,318	-	7,312,177	1,274,025
පරිගණක හා උපාංග	18,836,364	426,500		-	19,262,864	12,289,016	3,069,340	-	15,358,356	3,904,508
කාර්යාල උපකරණ	12,707,159	740,330		(30,000)	13,417,490	7,922,866	2,047,691	(4,063)	9,966,494	3,450,995
ක්ෂේත්‍ර උපකරණ	52,472,761	1,261,021		-	53,733,782	33,347,913	5,588,145	-	38,936,058	14,797,725
මොටර් වාහන	18,911,962	-		-	18,911,962	18,911,962	-	-	18,911,962	-
විද්‍යාගාර උපකරණ	1,334,593	-		-	1,334,593	1,291,426	18,500	-	1,309,926	24,667
සන්නිවේදන උපකරණ	443,988	-		-	443,988	51,124	110,997	-	162,121	281,868
මුළු එකතුව	**137,302,853**	**3,386,251**	**-**	**(30,000)**	**140,659,105**	**96,184,162**	**15,708,738**	**(4,063)**	**111,888,837**	**28,770,267**

2020		සටහන 02	2021	
භූ ස ප කා රු.	සමූහය රු.	කෙරිගෙන යන වැඩ	භූ ස ප කා රු.	සමූහය රු.
17,583,073	17,583,073	වෙරළවත්ත ප්‍රදේශයේ පිහිටි යෝජිත ගබඩා සංකීර්ණය	-	-
2,807,165	2,807,165	යක්කල ප්‍රාදේශිය කාර්යාලයෙහි යෝජිත ගොඩනැගිල්ල	-	-
503,540	503,540	යෝජිත පී පී ආර් / ඊ ආර් පී පද්ධතිය	503,540	503,540
130,011,351	130,011,351	පිටකෝට්ටේ ප්‍රදේශයෙහි විද්‍යාගාරය සඳහා යෝජිත ගොඩනැගිල්ල	280,073,784	280,073,784
-	-	නුවරඑළිය - සංචාරක බංගලාව - යෝජිත ගොඩනැගිල්ල	69,890	69,890
3,976,250	3,976,250	රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය - යෝජිත ගොඩනැගිල්ල	8,881,474	8,881,474
2,563,889	2,563,889	පොලොන්නරුව - යෝජිත ප්‍රාදේශිය කාර්යාලය	32,025,499	32,025,499
366,000	366,000	අම්පාර යෝජිත ගොඩනැගිල්ල	366,000	366,000
182,510	182,510	යෝජිත ගොඩනැගිල්ල - කුරුණෑගල	4,696,795	4,696,795
1,051,773	1,051,773	අම්පාර බුද්ධංගල ප්‍රදේශයේ යෝජිත ජී එෆ් ඉඩම් මධ්‍යස්ථානය	-	-
159,045,551	**159,045,551**		**326,616,983**	**326,616,983**

		සටහන 03		
භූ ස ප කා රු.	සමූහය රු.	ආයෝජන	භූ ස ප කා රු.	සමූහය රු.
4,000,000	-	පරිපාලිත සමාගමෙහි ආයෝජනය		4,000,000
4,000,000	-		-	4,000,000

		සටහන 04		
		විලම්බිත බදු වත්කම්	සමූහය රු.	භූ ස ප කා රු.
56,288,829	61,235,900	2021-01-01 දිනට ආරම්භක ශේෂය	70,636,872	51,370,580
(4,918,249)	9,400,972	ගැලපීම්	11,577,308	14,490,055
51,370,580	**70,636,872**	2021-12-31 දිනට අවසන් ශේෂය	**82,214,179**	**65,860,635**

			සමූහය	භූ ස ප කා
		විලම්භිත බදු වගකීම්	රු.	රු.
76,398,944	76,683,093	2021-01-01 දිනට ආරම්භක ශේෂය	61,244,360	60,253,441
(16,145,503)	(15,438,733)	ගැලපීම්	(10,739,565)	(10,334,329)
60,253,441	**61,244,360**	2021-12-31 දිනට අවසන් ශේෂය	**50,504,795**	**49,919,112**

		සටහන 05		
		ස්ථාවර තැන්පතු	සමූහය රු.	භූ ස ප කා රු.
852,163,556.00	852,163,556.00	ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු	880,469,276	880,469,276
-	253,396,561.00	මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු	282,208,676	-
1,401,203,327.00	1,401,203,327.00	මහජන බැංකුව ගාලුපාර දෙහිවල ස්ථාවර තැන්පතු	1,459,802,351	1,459,802,351
-	3,500,000.00	රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුව - ස්ථාවර තැන්පතු	3,676,037	-
241,593,123.00	241,593,123.00	පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා මහජන බැංකුව ස්ථාවර තැන්පතු	256,721,203	256,721,203
-	14,287,253	ස්ථාවර තැන්පතු සම්පත් බැංකුව	-	-
350,552,740.00	350,552,740.00	මහා භාණ්ඩාගාර බිල්පත්	-	-
9,982,899.00	9,982,899.00	ස්ථාවර තැන්පතු - මහජන බැංකුව ගාලුපාර ජී එස් එස් ගිණුම සඳහා	-	-
30,182,747.00	30,182,747.00	ස්ථාවර තැන්පතු ජී එස් එම් බී ආපදා අරමුදල - පී පී අයි එස් බැංකුවේ පිටකෝට්ටේ	-	-
233,631,134.00	233,631,134.00	ස්ථාවර තැන්පතු සාමාන්‍ය - පී බී එල් එස් බැංකුව පිටකෝට්ටේ	-	-
3,119,309,526.00	**3,390,493,340.00**		**2,882,877,543**	**2,596,992,830**

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය - 2021

2020		සටහන 06	2021	
ජී එස් එම් බී	සමූහය	භාණ්ඩ ලේඛනය	සමූහය	ජී එස් එම් බී
රු.	රු.		රු.	රු.
4,010,110	4,010,110	ලිපිද්‍රව්‍ය	3,160,478	3,160,478
-	14,558,233	වැලි	12,123,460	
10,481,747	15,616,850	පාරිභෝජ්‍ය භාණ්ඩ	15,448,117	10,833,097
-	216192	වැලි බෑග්	216,192	
2,428,865	2,428,864	බලපත්‍ර පොත්	690,805	690,805
635,303	635,303	පුස්තකාල පොත්	635,303	635,303
30,224	30,224	සිතියම්	22,724	22,724
14,529,368	14,529,368	විදුම් සහ අනිකුත් පාරිභෝජ්‍ය භාණ්ඩ	16,462,025	16,462,025
32,115,617	**52,025,144**	භාණ්ඩ ලේඛනය	**48,759,103**	**31,804,432**

සටහන 07

ජී එස් එම් බී	සමූහය	වෙළඳ ණයගැතියන්	සමූහය	ජී එස් එම් බී
රු.	රු.		රු.	රු.
62,682,371	338,641,248	ලැබිය යුතු සම්පූර්ණ වෙළඳ ණය ප්‍රමාණය	227,975,070	186,843,370
(5,097,527)	(36,237,346)	අඩු කලා - බොල් ණය සඳහා ප්‍රතිපාදන	(35,479,140)	(6,608,728)
57,584,844	302,403,902	ලැබිය යුතු ශුද්ධ වෙළඳ ද්‍රව්‍ය ප්‍රමාණය	192,495,930	180,234,642
-	7,811,208	ආශ්‍රිත පාර්ශ්වවල ගිණුම්	-	-
57,584,844	**310,215,110**		**192,495,930.34**	**180,234,642.04**

ජී එස් එම් බී	සමූහය	සටහන 08	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	අනිකුත් ලැබිය යුතු දේ	රු.	රු.
38,093,304	-	අනිකුත් පාර්ශ්ව වෙත ලබා දෙන ලද අත්තිකාරම් (සටහන 8 ඒ)	11,544,506	11,544,506
73,263,355	-	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් (සටහන 8 බී)	91,042,432	91,042,432
29,390,655	-	ලැබිය යුතු පොලී (සටහන 8 සී)	46,954,256	46,954,256
-	-	අනිකුත් ලැබිය යුතු දෑ (ජී එස් එම් බී ටී එස්)	71,838,733	
140,747,314	-		**221,379,926**	**149,541,193**

ජී එස් එම් බී	සමූහය	සටහන 08 - අ	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	අනිකුත් ලැබිය යුතු දේ	රු.	රු.
		අනිකුත් පාර්ශ්ව වෙත ලබා දෙන ලද අත්තිකාරම්		
208,775	-	අත්තිකාරම් සහ ණය (අත්තිකාරම් බී)	208,775	208,775
28,421,027	-	දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගැනීම් සඳහා ගෙවන ලද අත්තිඃ	3,258,959	3,258,959
3,555,313	-	ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා ගෙවන ලද අත්තිකාරම්	1,520,913	1,520,913
2,630,664	-	අනිකුත් සේවකයන් සඳහා ගෙවන ලද අත්තිකාරම්	2,571,013	2,571,013
378,066	-	සී/ස මොබිටෙල් පුද්ගලික සමාගම	28,066	28,066
2,899,459	-	සී/ස මොබිටෙල් පුද්ගලික සමාගම - හුවාවෙයි ෆෝන් සීපී - 2	3,956,780	3,956,780
38,093,304	-		**11,544,506**	**11,544,506**

ජී එස් එම් බී	සමූහය	සටහන 8 - (ආ) (අනිකුත් ලැබිය යුතු දේ)	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	රු.	රු.
45,400	-	විශේෂ අත්තිකාරම්	8,200	8,200
450,900	-	උත්සව අත්තිකාරම්	78,400	78,400
72,767,055	-	කාර්ය මණ්ඩල ණය (ආපදා) ඒකාබද්ධ	90,837,135	90,837,135
-	-	අවිනිශ්චිත ගිණුම් දිරා දමනා	118,696	118,696
73,263,355	-		**91,042,432**	**91,042,432**

ජී එස් එම් බී	සමූහය	සටහන - 8 - ඇ	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	ලැබිය යුතු පොලී	රු.	රු.
11,968,710	-	ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී, ලංකා බැංකුව	11,444,475	11,444,475
2,670,589		ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලී, මහජන බැංකුව	-	-
2,136,931		භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලී	-	-
12,614,425	-	ලැබිය යුතු පොලී පී පී එල් එස් බැංකුව, ගාලු පාර	35,509,780	35,509,780
29,390,655	-		**46,954,256**	**46,954,256**

ජී එස් එම් බී	සමූහය	සටහන 09	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	ජී එස් එම් බී ටී එස් අන්තර් සමාගම	රු.	රු.
-	-	අන්තර් සමාගම් වත්කම්	32,058,378	27,360,000
-	-	අන්තර් සමාගම් වගකීම්	(4,781,018)	(3,267,161)
-	-		**27,277,360**	**24,092,839**

ජී එස් එම් බී	සමූහය	සටහන 10	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	පූර්ව ගෙවීම් සහ තැන්පත	රු.	රු.
5,682,042	-	කුලී අත්තිකාරම්- ගොඩනැගිලි	3,629,292	3,629,292
366,000	-	ගොඩනැගිලි තැන්පතු	366,000	366,000
973,143	-	ආපසු අය කර ගත හැකි භාණ්ඩ හා සේවා බදු	973,143	973,143
8,500	-	ජලය සඳහා තැන්පතු	8,500	8,500
348,000	-	ඉන්ධන සඳහා තැන්පතු	348,000	348,000
87,500	-	විවිධ වියදම් සඳහා තැන්පතු	87,500	87,500
840,000	-	ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිලි සඳහා තැන්පතු	840,000	840,000
8,154,439	-	විවිධ වියදම් සඳහා පූර්ව ගෙවීම්	8,253,276	8,253,276
3,600	-	බැංකු	3,600	3,600
-	-	ටීපීඑල් / එච් ඩබ්ලිව් ටී පී එල් සඳහා මුද්දර ගාස්තු	18	18
16,463,224	-		**14,509,329**	**14,509,329**

ජී එස් එම් බී	සමූහය	සටහන 11	සමූහය	ජී එස් එම් බී
රු.	රු.	මුදල් හා මුදල් තුල්‍යයන්	රු.	රු.
2,550,920	2,550,920	කොමර්ෂල් බැංකුව ජංගම ගිණුම	130,240	130,240
5,412,777	5,412,777	ලංකා බැංකුව ජංගම ගිණුම	11,192,975	11,192,975
13,252,316	20,986,155	සම්පත් බැංකුව ජංගම ගිණුම	27,604,641	10,768,832
-	8,744,115	මහජන බැංකුව ගිණුම් අංකය 337100140000881	22,086,021	
25,000	25,000	මහජන බැංකුව වැල්ලවත්ත ජංගම ගිණුම	25,000	25,000
-	2,295,188	මහජන බැංකුව ඉතිරි කිරීමේ ගිණුම	2,364,998	
1,108,448	1,108,448	මහජන බැංකුව මාතර ජංගම ගිණුම	671,006	671,006
3,583,604	3,583,604	මහජන බැංකුව ගාලුපාර දෙහිවල ජංගම ගිණුම	89,856,286	89,856,286
-	57,632	නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ගිණුම් අංකය 100270004596	56,632	
-	-	මහජන බැංකුව - බොරැල්ල ජංගම ගිණුම	1,846,860	1,846,860
47,727,721	47,727,721	ජී එස් එස් බී ඉතිරි කිරීමේ ගිණුම 337-2-001-7-6137984	43,326,369	43,326,369
-	-	මහජන බැංකුව සුළු මුදල් අග්‍රිමය	33,776	33,776
68,000	68,000	මුද්දර අග්‍රිමය - පරිපාලන	65,595	65,595
2,592,346	2,592,346	සම්පත් බැංකුව - ජී එස් එස් මධ්‍යස්ථානය - ජංගම ගිණුම	-	-
8,450,893	8,450,893	මහජන බැංකුව - පිටකෝට්ටේ	-	-
84,772,024	**103,602,797**		**199,260,399**	**157,916,939**

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය - 2021

2020			2021	
ජ එස් එම් බී	සමූහය	මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය	සමූහය	ජ එස් එම් බී
රු.	රු.		රු.	රු.
		1993 වර්ෂයේදී භූ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලබා දෙන ලද වත්කම්වල සම්පූර්ණ ශුද්ධ වටිනාකම මෙමගින් නිරූපණය කරනු ලැබේ.		
27,652,883	27,652,883	මහ භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද (ඒකාබද්ධ) ප්‍රාග්ධනය	27,652,883	27,652,883
1,746,726	1,746,726	මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය (දෙපාර්තමේන්තුව)	1,746,726	1,746,726
68,916,655	68,916,655	මහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද ප්‍රාග්ධනය (1993-2001) (ප්‍රාග්ධන)	68,916,655	68,916,655
98,316,264	**98,316,264**		**98,316,264**	**98,316,264**

ජ එස් එම් බී	සමූහය		සමූහය	ජ එස් එම් බී
රු.	රු.	**ප්‍රත්‍යාගණන සංචිත**	රු.	රු.
305,782,596	**305,782,596**	ප්‍රත්‍යාගණන සංචිත	**323,024,418**	**323,024,418**

ජ එස් එම් බී	සමූහය	**රඳවා ගත් ඉපැයීම්**	සමූහය	ජ එස් එම් බී
රු.	රු.		රු.	රු.
2,638,577,846	2,934,550,439	රඳවා ගත් ඉපැයීම්	2,458,015,247	2,208,333,238
773,685,180	730,394,597	වියදමට සාපේක්ෂව අතිරේක ආදායම	1,564,466,354	**1,552,956,756**
(1,195,331,284)	(1,195,331,284)	ඉකුත් වර්ෂය ගැලපීම් 13 වී	48,489,461	**28,611,675**
-	(83,227,336)	පරිපාලිත සමාගමෙහි කොටස් වෙත මාරු කර යැවීම	(93,689,797)	
(8,598,504)	(8,598,504)	මහා භාණ්ඩාගාරය වෙත මාරු කර යැවීම	2,000,000,000)	(2,000,000,000)
-	(1,000,000)	ගෙවන ලද ලාභාංශ (පරිපාලිත සමාගම)	-	-
2,208,333,238	**2,376,787,911**		**1,977,281,265**	**1,789,901,670**

ජ එස් එම් බී	සමූහය		සමූහය	ජ එස් එම් බී
රු.	රු.	**පාලනය කළ නොහැකි අයිතිය**	රු.	රු.
-	2,000,000	කොටස්	2,000,000	-
-	83,227,336	රඳවා ගත් ඉපැයීම්	93,689,797	-
-	1,000,000	ලාභාංශ	-	-
-	**86,227,336**		**95,689,797**	**-**

ජ එස් එම් බී	සමූහය		සමූහය	ජ එස් එම් බී
රු.	රු.		රු.	රු.
		ආපදා සහ සේවක ප්‍රතිලාභ ගිණුම		
35,750,159	**35,750,159**	ආපදා සහ සේවක ප්‍රතිලාභ ගිණුම	**37,906,482**	**37,906,482**

2020		සටහන 12	2021	
ජී එස් එම් බී රු.	සමූහය රු.	ලැබුණු විදේශීය ප්‍රේෂණ	සමූහය රු.	ජී එස් එම් බී රු.
4,135,178.0	**4,135,178.0**	ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබුණු ප්‍රේෂණ	**2,370,912**	**2,370,912**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 13 විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	සමූහය රු.	ජී එස් එම් බී රු.
200,499,915.0	-	2021-01-01 දිනට ශේෂය	260,108,978	238,321,390
48,567,942.0	-	එකතු කළා : වර්ෂය තුල ලබා දෙන ලද ප්‍රතිපාදන	34,625,333	30,906,805
-	-	2021-12-31 දිනට මුළු ප්‍රතිපාදන	294,734,310	269,228,195
(10,746,467.0)	-	වර්ෂය තුළ ගෙවන ලද මුදල	(1,768,195)	(1,417,610)
238,321,390	**219,000,818**	2021-12-31 දිනට ප්‍රතිපාදන ශේෂයන්	**292,966,115**	**267,810,585**
197,213,230.0	-	පාරිතෝෂික ප්‍රතිපාදන (දිගුකාලීන වගකීම්)	231,371,635	206,216,105
41,108,160.0	-	පාරිතෝෂික ප්‍රතිපාදන (කෙටිකාලීන වගකීම්)	61,594,480	61,594,480
238,321,390	**219,000,818**		**292,966,115**	**267,810,585**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 14 ණය හිමියන් සහ ගෙවිය යුතු දේ	සමූහය රු.	ජී එස් එම් බී රු.
330,949,437	**734,009,295**	ණය හිමියන් සහ ගෙවිය යුතු දේ	**643,424,633**	**525,013,235**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 15 උපචිත සහ අනෙකුත් ගෙවිය යුතු දේ	සමූහය රු.	ජී එස් එම් බී රු.
194,130,301	-	උපචිත වියදම් සහ අනිකුත් ගෙවිය යුතු දේ	**249,228,756**	**203,859,561**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 16 ගෙවිය යුතු කල්බදු - වාහන	සමූහය රු.	ජී එස් එම් බී රු.
71,206,998	-	2020-12-31 දිනට ආරම්භක ශේෂය	48,428,622	48,428,622
13,590,070	-	එකතු කලා : වර්ෂය සඳහා වාරික සහ පොලිය	(13,781,772)	(13,781,772)
57,616,928	34,646,850		**34,646,850**	**34,646,850**
(9,189,024)	(9,189,024)	අඩු කළා : අවිනිශ්චිත ගිණුමේ බදු පොලිය	(4,900,374)	(4,900,374)
48,427,904	**25,457,826**		**29,746,476**	**29,746,476**
25,457,826		ගෙවිය යුතු කල් බදු - දිගුකාලීන	15,964,704	15,964,704
13,781,772	-	ගෙවිය යුතු කල් බදු - කෙටි කාලීන	**13,781,053**	**13,781,054**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 17 පරීක්ෂා කිරීමේ ගාස්තු ආපසු ගෙවීම සඳහා ප්‍රතිපාදන	සමූහය රු.	ජී එස් එම් බී රු.
-	-	පරීක්ෂා කිරීමේ ගාස්තු ආපසු ගෙවීම සඳහා ප්‍රතිපාදන	3,264,024	3,264,024
-	-		**3,264,024**	**3,264,024**

ජී එස් එම් බී රු.	සමූහය රු.	සටහන 18 අනිකුත් ගෙවිය යුතු දේ	සමූහය රු.	ජී එස් එම් බී රු.
		ලැබුණු අත්තිකාරම්	492,280,513	492,280,513
		බැංකු ඇපකරය	230,968,025	230,968,025
		ආපසු ගෙවිය යුතු තැන්පතු	46,500	46,500
613,106,116	643,334,802	වෙනත් අත්තිකාරම්	6,000	6,000
613,106,116	**643,334,802**		**723,301,038**	**723,301,038**

ආයතනික පාලනය

ආයතනයක තරඟකාරිත්වය, වර්ධනය සහ තිරසර බව පවත්වාගෙන යාම සඳහා ආයතනයක යහපාලනය මූලික කාරණයක් වන බව ගෝලීය වශයෙන් පිලිගත් කරුණකි. යහපාලන ක්‍රියා පිලිවෙත් කෙරෙහි කැපවීමක් දක්වමින් ඉහළ ආචාර ධර්ම වටිනාකම් සහ වගවීම සහිතව තම රාජකාරි ඉටු කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්ව මණ්ඩලය විසින් සුවිශාල අවධානයක් යොමු කර ඇත.

අපගේ කාර්යාංශය විසින් දිගුකාලීන ලෙස සාර්ථක වීමට සහ ගනුදෙනුකවරුන් වෙත වටිනාකමක් ලබා දීම සඳහා සමාජය සඳහා වටිනාකමක් නිර්මාණය කළ යුතුය. එවැනි වටිනාකමක් නිර්මාණය කිරීම සඳහා වන අපගේ ප්‍රවේශය, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද ශක්තිමත් ප්‍රතිපත්ති සහ වටිනාකම් සමුදායක් මත ගොඩ නැගී ඇත. නීතිමය නියමයන් සහ යහපත් ක්‍රමවේදයන්ට සාපේක්ෂව අපගේ පාලන ක්‍රමවේදය අප විසින් නිරන්තරවම පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

කළමනාකාරිත්ව මණ්ඩලය කාර්යාංශයෙහි වටිනාකම්වල සහ එහි දිගුකාලීන දැක්මෙහි භාරකරු වන අතර එකී කළමනාකාරිත්ව මණ්ඩලය විසින් කාර්යාංශය වෙත ක්‍රමෝපායන් මාර්ගෝපදේශ සහ මගපෙන්වීම් ලබා දෙනු ලැබේ. ප්‍රධාන කටයුතු මූල්‍ය නීතිමය හා ගනුදෙනුකවරුන් හා අදාල කටයුතු ඇතුළු කරුණු ගණනාවක් සම්බන්ධයෙන් අවශ්‍ය නම් රැස්වීම් අතරතුර අවස්ථාවන්ද ඇතුලුව නිරන්තර දැනුවත්වීමක් කළමනාකාරිත්ව මණ්ඩලය විසින් ලබා ගනු ලැබේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පාලනය කරනු ලබන්නේ කළමනාකාරිත්ව මණ්ඩලය විසිනි. පතල් හා බනිජ පනතෙහි නියමයන් හා අනුකූලව විෂයභාර ගරු අමාත්‍යවරයා විසින් කළමනාකාරිත්ව මණ්ඩලයෙහි සාමාජිකයන් පත් කරනු ලැබේ.

කළමනාකාරිත්ව මණ්ඩලය පහත සඳහන් පරිදි සාමාකජියන් 7 දෙනෙකුගෙන් සමන්විත වේ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නීති නිලධාරියා කළමනාකාරිත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

- කර්මාන්ත විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතවරයා
- පරිසර විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතවරයා
- භූ විද්‍යාව, කැනීම්, ව්‍යාපාර කළමනාකරනය, මූල්‍ය හා නීති යන ක්ෂේත්‍ර තුල දැනුම සහිත සහ ප්‍රායෝගික පලපුරුද්ද සහිත බව පෙන්නුම් කරනු ලැබ ඇති බවට අමාත්‍යවරයා හට පෙනී යන සාමාජිකයන් තිදෙනෙකු
- මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කර අමාත්‍යවරයා විසින් පත් කරන ලද එක් සාමාජිකයෙකු
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අධ්‍යක්ෂ ජනරාල් වරයා

කළමනාකාරිත්ව මණ්ඩලයේ රැස්වීම්

කළමනාකාරිත්ව මන්ඩලය මාසිකව රැස් වන අතර අවශ්‍ය පරිදි සහ අවශ්‍ය අවස්ථා වලදී අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ.

2021 මූල්‍ය වර්ෂය තුලදී කළමනාකාරිත්ව මණ්ඩලයෙහි රැස්වීම් නවයක් පවත්වන ලදී. එළඹෙන ලද තීරණ, මතු කරන ලද ගැටළු සහ ප්‍රකාශ කරන ලද විසම්මුතික අදහස් පිලිබඳ තොරතුරු සහිතව කළමනාකාරිත්ව මණ්ඩලයෙහි ලේකම්වරයා විසින් පිලියෙල කරන ලද න්‍යාය පත්‍රය සහ කාර්ය සටහන් කෙටුම්පත් කළමනාකාරිත්ව මණ්ඩලයෙහි එක් එක් රැස්වීම පැවැත්වීමට අදහස් කරනු ලබන දිනයට පෙර වැඩ කරන දින තුනක් ඇතුලත සියලුම සාමාජිකයන් අතර ඒ පිලිබඳව ඔවුන්ගේ අදහස් ලබා ගනු පිණිස බෙදා දෙනු ලැබුණි.

නිතිපතා පවත්වනු ලබන එක් එක් රැස්වීමේදී කාර්යාංශයෙහි කාර්යසාධනයන් සහ මූල්‍ය කාර්යසාධනයන් ආදිය අදාල විවිධ අංශ පිලිබඳව කාර්යාංශයෙහි අංශ ප්‍රධානීන් විසින් කළමනාකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

තම වෘත්තිය අදහස් ලබා දීම සහ සාකච්ඡාවන්ට සක්‍රිය ලෙස සහභාගි වීම තුලින් කාර්යාංශයෙහි රැස්වීම් වලදී කළමනාකාරිත්ව මණ්ඩලය විසින් ඉතා සක්‍රිය කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඩබ්ලිව්ආර්/සී/ජීඑස්එම්බී/1/21 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 අගෝස්තු 18 දින

සභාපති,

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ සහ එහි පරිපාලිතයන්ගේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ (“කාර්යාංශය”) සහ එහි පරිපාලිතයන්ගේ(“සමූහය”) 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු පිරිවැය රු.550,059,778 ක් වූ සමූහයේ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද එම වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙම වත්කම්වල ඵලදායී ජීවිතකාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි.

(ආ) ආයෝජනවලට අදාල බැංකු වලින් කර තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව කාර්යාංශයේ ස්ථාවර තැන්පතු ආයෝජනය රු.2,641,230,569 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එම ආයෝජනවල අගය රු.2,596,992,830 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.44,237,739 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත් මෙම වෙනසට හේතු සොයා බලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කරද නොතිබුණි.

(ඇ) 99 අවුරුදු බදු පදනමට ගත් ඉඩමක ඉදිකර තිබුණු ගම්පහ ප්‍රාදේශීය කාර්යාලය හා තොග ගබඩාව සඳහා 2018 සිට 2020 වර්ෂ දක්වා සංවර්ධන කටයුතු සඳහා දරා තිබුණ රු.8,193,693 ක වියදම ගොඩනැගිලි ලෙස ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර පුර්ව වර්ෂ ගැලපීමක් ලෙස සමුච්චිත ලාභයට එරෙහිව කපා හැර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභය හා ගොඩනැගිලිවල වටිනාකම ඉහත ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඈ) ඉකුත් වර්ෂයන්හිදී පල්ලෙකැලේ සුනාමි මධ්‍යස්ථාන නඩත්තුව සඳහා විදේශ විශ්ව විද්‍යාලයකින් කාර්යාංශයට ලැබී වියදම් දැරීමෙන් පසු ඉතිරිව තිබූ මුදල් ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ සඳහා නිවැරදි ගිණුම් ප්‍රතිපත්තියක් තෝරාගෙන ඒ අනුව ගිණුම්ගත කිරීමට හා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රදාන ලැබීම් පිළිබඳ අනාවරණය කිරීමට කටයුතු කරන ලෙස ඉකුත් වර්ෂවල විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණි. එසේ වුවත් ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී ප්‍රදාන වශයෙන් ලැබී තිබුණු රු. 1,824,809 ක් හා ප්‍රධාන ලැබීම් ඉතිරියෙන් සිදුකර තිබුණු ස්ථාවර තැන්පතු සඳහා ලැබී තිබුණු ආයෝජන ආදායම් රු.359,498 ක් සහ වර්ෂය තුලදී ප්‍රදාන වලින් දරන ලද රු.2,591,292 ක වියදම් වෙනමම ගිණුමක සටහන් කර තිබුණද මෙම ආදායම් හා වියදම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) කාර්යාංශයේ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙන් සමාගමට ලැබිය යුතු හා සමාගමට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.4,698,378 ක් හා රු.1,513,857 ක් වූ

අතර කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශයෙට පරිපාලිත සමාගමෙන් ලැබිය යුතු හා සමාගමට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.27,360,000 ක් හා රු.3,267,161 විය. ඒ අනුව පිළිවෙලින් රු.22,661,622 ක් හා 1,753,304 ක වෙනසක් නිරීක්ෂණය විය. සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාංශයෙන් සමාගමට හා සමාගමෙන් කාර්යාංශයට ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂවල ශුද්ධ අගය වූ රු.27,277,360 ක් අන්තර් සමාගම් යටතේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමූහයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමූහයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුත්තය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමුහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමුහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමුහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමුහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමුහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම

හා නක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදි. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කාර්යාංශය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඈ) ඡේදයෙහි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට, කාර්යාංශය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්	ඉකුත් වර්ෂයේ ජංගම නොවන වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණ වාර්තා 2022 ජුනි 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකළ

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756	අතර සමාලෝචිත වර්ෂයේ යක්කල ශාඛාවේ හා ප්‍රධාන කාර්යාලයේ විද්‍යාගාරවල භාණ්ඩ පමණක් සමීක්ෂණය කර තිබූ අතර කාර්යාංශයේ අනෙකුත් අංශවල භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ආ) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත	
(i) 26(1) හා 44(ආ) වගන්ති	රජය වෙනුවෙන් කාර්යාංශය අයකර ගත් රාජ්‍යභාගය භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත් 2016 සිට 2021 දක්වා කාලය තුල භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර කාර්යාංශයේ රඳවාගෙන තිබූ රාජ්‍යභාග වටිනාකම රු.මිලියන 3,147 ක් විය.
(ii) 52(2) වගන්තිය හා 1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 21(අ) වැනි පතල් හා කැණීම් නියෝගය	කැණීම්වලින් අනතුරුව මාස 2 සිට වර්ෂ 09 ක් දක්වා කාලය තුල ඉඩම් පුනරුත්ථාපනය කරවීමට කටයුතු කළ යුතු වුවද කැණීම් බලපත්‍රලාභීන් 1943 දෙනෙකු ලවා එම කාර්ය ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඉහත බලපත්‍රලාභින්ගෙන් ලබාගෙන තිබූ වටිනාකම රු.439,004,539 ක් වූ බැංකු ඇපකර මුදල් කරගෙන තිබුණද එම මුදල් භූමි පුනරුත්ථාපන කටයුතු සඳහා භාවිතා නොකර ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.
(iii)1997 ජනවාරි 10 දිනැති අංක 958 දරන ගැසට්පත්‍රය මගින් සංශෝධිත 33(4) වැනි පතල් කැණීම් නියෝග	පතල් නිෂ්පාදනවල නිශ්චය කළ වෙළඳ වටිනාකම, ඉඩදිය හැකි අඩු කිරීම් හා රාජ්‍යභාග ගෙවීම් වැඩපිළිවෙල සඳහා ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කර කාර්යයන් සම්බන්ධව කාලීන සංශෝධනයන් සිදු කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ඇ) 2009 අංක 66 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත	
(i) 2(ඉ) වගන්තිය	ඛනිජ සඳහා වටිනාකම් එකතු කිරීම සඳහා උපයෝගී කරගත යුතු පියවර කාර්යාංශය විසින් හඳුන්වාදී නොතිබීම හේතුවෙන් කැණීම් කරන මිනිරන්, ඛනිජ වැලි හා තිරුවානා ඛනිජ සඳහා අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස අපනයනය කෙරෙමින් පැවතුණි.

(ii) 37(අ) (ආ) (ඇ) වගන්ති	කැණීම් බලපත්‍රයට අදාල යම් කොන්දේසියක් උල්ලංඝනය කිරීම, කාර්යාංශය විසින් දෙන ලද යම් නීත්‍යානුකූල විධානයක් ක්‍රියාත්මක කර නොමැති වීම, කාර්යාංශයේ අවසරයක් නොමැතිව මාස 03 කට වැඩි කාලයක් අත්හිටුවා ඇති බවට කාර්යාංශය සෑහීමකට පත් වන්නේනම් එම කැණීම් බලපත්‍ර අවලංගු කිරීමට කාර්යාංශයට බලය පැවරී ඇත. එසේ වුවද බනිජ වැලි කැණීම සඳහා 2017/2018 කාලය සඳහා වී.වී.එම් ලංකා මිනිරන් (පුද්) සමාගමට සහ 2014/2024 කාලය සඳහා ඇල්කෙමි හෙවි මෙට්ල්ස් (පුද්) සමාගමටත් බනිජ වැලි ලබා දුන් කැණීම් බලපත්‍ර මගින් 2022 ජුනි 30 දින දක්වා කැණීම් කටයුත්තක් සිදුකර නොනිබූ අතර එම බලපත්‍ර අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ) 2002 අප්‍රේල් 19 දිනැති අංක 1232/14 දරන සහ 2017 නොවැම්බර් 17 දිනැති අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රවල සඳහන් විදේශ විනිමය නියෝග	ශ්‍රී ලංකාව තුල පතල් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් විදේශීය අයිතිය සියයට 40 ක ප්‍රතිශතයක් දක්වා විය යුතු අතර එම සීමාව ඉක්මවා විදේශීය අයිතිය පවතී නම් ලංකා ආයෝජන මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබාගත යුතු විය. නමුත් ශ්‍රී ලංකාව තුල මිනිරන් කැණීම් සිදුකරන සමාගමක මුළු කොටස් අයිතියෙන් සියයට 86.55 ක්ම විදේශීය සමාගම් 02 කට අයත් වූ අතර, මෙම සමාගම ලංකා ආයෝජන මණ්ඩලයෙන් එලෙස අනුමැතියක් ලබාගෙන හෝ එම මණ්ඩලය සමඟ ආයෝජන ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ පිළිබඳ නොසලකා මෙම සමාගමට මිනිරන් කැණීම් සඳහා කාර්යාංශය විසින් කැණීම් බලපත්‍ර 02ක් නිකුත් කර තිබුණි.
(ඉ) 2017 මාර්තු 29 දිනැති අංක අමප/17/530/704/009 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය	රජයේ සංවර්ධන කටයුතු සඳහා මහවැලි අධිකාරිය විසින් කළමනාකරණය කරනු ලබන ගංගා සහ ගංගා ද්‍රෝණිවල පවතින බනිජ ද්‍රව්‍ය ඉවත් කිරීමේදී එම ප්‍රදේශවල පුළුල් පාරිසරික බලපෑම් ඇගයීමක් කර අසීමාන්තිකව එම බනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම නිසා පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමේ වැදගත්කම ද සැලකිල්ලට ගෙන කාර්යාංශය විසින් ජීඑස්එම්බී තාක්ෂණ සේවා(පුද්) සමාගමට පමණක් කැණීම් බලපත්‍ර ලබාදිය යුතු බව සඳහන් වේ. කාර්යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ එම සමාගමට අමතරව පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මහවැලි

අධිකාරියට අයත් මාදුරුඔයෙහි වැලි කැණීම් කිරීම සඳහා බලපත්‍ර ලබාදී තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2020 වර්ෂයේදි භාණ්ඩාගාර ලේකම් සහ ජර්මන් සමාගමක් අතර ඇතිකරගත් ගිවිසුමක් අනුව බෝගල ග්‍රැපයිට් සමාගමෙන් රජය සතු කොටස් සියයට 50.01 ක් එකී ජර්මන් සමාගමට පවරා තිබු අතර මෙම ගිවිසුම ප්‍රකාරව මිලදී ගන්නා සමාගම ශ්‍රී ලංකාව තුල මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනය සහ අලෙවිය සිදුකිරීමට අදාළ යෝජනා රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිසමට භාරදීමටත් එකඟ වී තිබුණි. නමුත්, සමාගම විසින් මිනිරන් පදනම් කරගත් කර්මාන්ත සංවර්ධනයක් ශ්‍රී ලංකාව තුල සිදුකර නොතිබු අතර සමාගම විසින් කැණීම් කරන මිනිරන් අගය එකතු කිරීමකින් තොරව අමුද්‍රව්‍ය ලෙස විදේශගතකිරීම් සිදුකර තිබුණි.

(ආ) කහටගහ ග්‍රැපයිට් සමාගම කැණීම් සිදුකරන කහටගහ පතලෙහි, කාර්යාංශය විසින් වාර්ෂිකව සහ විශේෂ අවස්ථාවල සිදුකරන ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී එහි පවතින අඩුපාඩු පිළිබඳව පරීක්ෂණ වාර්තා මගින් නිරන්තරව දැනුම් දෙමින් කැණීම් බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ කර තිබු අතර අදාල සමාගම මගින් එම අඩුපාඩු නිවැරදි කර ගැනීමට පියවර ගෙන නොතිබු බව පරීක්ෂණ වාර්තා වලින් තහවුරු විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල කාර්යාංශයේ කැණීම් ඉංජිනේරුවන් සහ භූ විද්‍යාඥයන්ගෙන් සැදුම්ලත් තාක්ෂණික කණ්ඩායමක් සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂණයකින් සහ කමිටු රැස්වීමකින් අනතුරුව සකුරා ග්‍රැපයිට් සමාගම සඳහා වූ කැණීම් බලපත්‍රය වර්ෂයකින් පමණක් දීර්ඝ කිරීමට එම කමිටුවේ අධ්‍යක්ෂ(පාරිසරික බලපෑම් ඇගයීම් හා ප්‍රාදේශීය) විසින් නිර්දේශ කර තිබියදී අදාල බලපත්‍රය 2021 සිට 2031 දක්වා වර්ෂ 10 කින් දීර්ඝ කිරීමට කාර්යාංශය විසින් පියවර ගෙන තිබු අතර මේ සඳහා කාර්යාංශය පිහිටුවීම් පනත මගින් හෝ වෙනත් අති විශේෂ ගැසට් නිවේදනයක් මගින් මේ සඳහා විශේෂ බලතල පැවරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) කරස්නාගල මිනිරන් පතලේ කැණීම් කටයුතු සර්කෝන් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම විසින් සිදුකරන අතර එහි සම්පූර්ණ අයිතිය විදේශීය පාර්ශවයන් වෙත පවතින නිසා ශ්‍රී ලංකාවේ මිනිරන් ගවේෂණය, කැණීම හා දේශීය වෙළඳපල හා විදේශීය වෙළඳපල වෙත අලෙවි කිරීම සඳහා එකී සමාගම 2012 වර්ෂයේදී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාල වැඩ කටයුතු ඉටුවී නොතිබූ නිසා එම ගිවිසුම්වල වලංගු කාලය 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබූ අතර එම ගිවිසුම්වල වලංගු භාවය පිළිබඳ තවදුරටත් පරීක්ෂා කිරීමකින් තොරව මෙම පතල සඳහා 2019 අගෝස්තු 26 දින සිට 2022 පෙබරවාරි 28 දින දක්වා අවස්ථා 02 කදී කැනීම් බලපත්‍ර නිකුත් කර තිබුණි. 2019-2021 කාලය තුල මෙම මිනිරන් පතලෙහි මිනිරන් කැණීම් ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබූ අතර 2020 වර්ෂයේදී මිනිරන් ටොන් 01 ක් පමණක් විදේශ රටකට අමුද්‍රව්‍ය ලෙස අපනයනය කර තිබුණි.

(ඉ) 1991 වර්ෂයේ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය මගින් ප්‍රකාශිත දැනට භාවිතයේ පවතින ජාතික ඛනිජ ප්‍රතිපත්තිය අනුව පවතින ඛනිජ පාදක කරගත් කර්මාන්ත සඳහා අගය එකතු කිරීම සිදුකල යුතු වුවත් බෝගල ග්‍රැපයිට්, කහටගහ ග්‍රැපයිට්, කරස්නාගල සහ සකුරා ග්‍රැපයිට් යන සමාගම් 4 විසින් 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අගය එකතු කිරීමකින් තොරව මිනිරන් කිලෝග්‍රෑම් 1 ක් රු.282 ත් රු.415 ත් අතර මිලකට කිලෝ ග්‍රෑම් 7,632,000 ක් රු.මි.2,708 ක වටිනාකමකට අපනයනය කර තිබුණි.

(ඊ) මන්නාරම දිස්ත්‍රික්කයේ ඛනිජ වැලි කැණීම හා අගය එකතු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සහ වී.වී.එම් ලංකා මිනිරන් (පුද්) සමාගම අතර 2012 වර්ෂයේදී ආයෝජන ගිවිසුමකට එළඹ තිබූ අතර එම ව්‍යාපෘතිය සිදු නොකිරීම නිසා අදාල ගිවිසුම 2020 පෙබරවාරි 25 දින ලංකා ආයෝජන මණ්ඩලය මගින් අවලංගු කර තිබුණි. මෙම ගිවිසුම් පරීක්ෂා කිරීමකින් තොරව කාර්යාංශය විසින් ත්‍රිකුණාමලය මුතූර් ප්‍රදේශයේ ඛනිජ වැලි කැණීම සඳහා 2017 සිට 2018 වර්ෂය දක්වාද, 2018 ජූලි 12 සිට 2028 ජූලි 11 දක්වා වර්ෂ 10 කටද බලපත්‍රයක් ලබාදී තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂය අවසානය වන තෙක්ම කිසිදු කැණීමක් සිදුකර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ අළුතින් ලියාපදිංචි කරන ලද සමාගමකට මෙම බලපත්‍රය පැවරීමට කටයුතු කරමින් පැවතුණි.

(උ) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වී.වී.එම්. ලංකා මිනරල් සමාගමට සහ ඇල්කෙම් හෙවි මෙටල් සමාගමට පිළිවෙළින් 2018 ඔක්තෝබර් 23 දිනෙන් පසුව හා 2017 දෙසැම්බර් 20 දිනෙන් පසුව අදාල වෙරළ තීරයන්හි ඛනිජ වැලි කැණීමට බලපත්‍ර ලබාදී නොතිබුණ නමුත් කාර්යාංශය වර්ෂ 10 ක් සඳහා මෙම සමාගම් වෙත බලපත්‍ර ලබා දී තිබුණි.

(උ) 2017 මැයි 22 දින අමාත්‍ය මණ්ඩලය සිදුකල දැනුම් දීම ප්‍රකාරව ඛනිජ සම්පත් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අනුමැතිය ලබා ගැනිමට 2022 ජුනි 30 දක්වා කටයුතු කර නොතිබුණි.

(එ) කළුගල් කැණීම් ප්‍රමාණය හදුනා ගැනිමට විද්‍යාත්මක ක්‍රමවේදයක් මෙතෙක් අනුගමනය කර නොතිබුණු අතර කළුගල් කැණීම සඳහා යොදා ගන්නා පුපුරන ද්‍රව්‍ය මෙන් දෙගුණයක් කැණීම් කළ කියුබ් ප්‍රමාණය ලෙස සලකා පදනමකින් තොරව රාජ්‍යභාග අයකර ගනිමින් පැවතුණි.

(ඒ) යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2016-2018 කාලපරිච්ඡේදය තුල භාවිත කල පස් කියුබ් 1,343,810 ක් හා වැලි කියුබ් 3397 ක් සඳහා පිළිවෙලින් ලැබිය යුතු රු. 26,876, 200 ක් සහ රු.543,490 ක් බැගින් වූ එකතුව රු.27,419,690 ක රාජ්‍යභාගය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාල කොන්ත්‍රාත් සමාගමෙන් අයකරගෙන නොතිබුණි.

(ඔ) පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මහවැලි අධිකාරියට අයත් මාදුරු ඔයෙහි වැලි කැණීම සඳහා මාසික ධාරිතාවය කියුබ් 100 කැණීම් බලපත්‍ර නිකුත් කර තිබු අතර ඒ මගින් සතියේ දින 03 ක් පමණක් කැණීම් කිරීමට අවසර ලබාදී තිබුණි. නමුත් බලපත්‍රලාභීන් පරිසර අධිකාරියේ සහ කාර්යාංශය නිකුත් කර ඇති කැණීම් කොන්දේසි කඩකරමින් කරන මාසික ධාරිතාවය වූ කියුබ් 100 ඉක්මවමින් සතියේ දින 07 ම කැණීම් කරමින් පැවති අතර කාර්යාංශය විසින් මේ සම්බන්ධව නිසි නියාමනයක් සිදුකර නොතිබුණි.

(ඕ) කන්තලේ වැලි කැණීම් ව්‍යාපෘතිය සඳහා කාර්යාංශය විසින් නිකුත් කල IML/A/HO/13015 දරන කැණීම් බලපත්‍රයේ කැණීම් කිරීමට අනුමත ප්‍රදේශය හෙක්ටයාර 01 ක් ලෙස දක්වා තිබුණත් කැණීම් කල A නැමැති වැලි නිධිය හෙක්ටයාර 06-07 ක ප්‍රදේශයක පැතිර පැවතුණි. එමෙන්ම කැණීම් බලපත්‍රයේ මාසිකව කැණීම් කල හැකි උපරිම ධාරිතාවය සඳහන්ව නොමැති බවත්, කැණීම් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර භාවිතා කල හැකි ද යන්න සහ භාවිතා කල හැකි යන්ත්‍ර සුත්‍ර මොනවාද යන්න වැලි නිධියේ කැණීම් කල හැකි මට්ටම සහ කැණීම් කල යුතු ප්‍රදේශයේ නිවැරදි GPS බණ්ඩාංක සඳහන්ව නොමැති බවත් කැණීම් කටයුතු කාර්යාංශය මගින් හෝ 03 වන පාර්ශවයක් මගින් පුර්ණ අධීක්ෂණයකට ලක් කිරීම සුදුසු වන බවට කාර්යාංශයේ කැණීම් ඉංජිනේරුවරයකු විසින්ම නිකුත් කල වාර්තාවක දක්වා තිබුණි. නමුත්, සමාලෝචිත වර්ෂයේදි එම කැණීම් පිළිබඳ අධීක්ෂණය සහ කැණීම් බලපත්‍රයේ සඳහන් ඉහත අඩුපාඩු කාර්යාංශය විසින් නිවැරදි කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

2022.08.28

ඔබේ අංකය :- අයිඩබ්ලිව්ආර්/සී/ජීඑස්එම්බී/1/21

අපේ අංකය :- එච් ආර් / ඒ ආර් /09

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව

විගණකාධිපති වාර්තාව

වාර්තාවේ සඳහන් ඡේදවලට අදාල පිළිතුරු පහත දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂය කරතිබූ ස්ථාවර වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින හෙයින් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියේදී අණාවරනය කිරීමටත් වත්කම් වල ඵලදායී ජීවිත කාලය ඇස්තමේන්තු කිරීම සඳහා වෘත්තීමය සුදුසුකම්ලත් තක්සේරුකරුවකු මගින් මෙම වත්කම් වල ජීවිත කාලය ඇස්තමේන්තු කිරීමටත් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ) 2021 වර්ෂයේ ගිණුම් ප්‍රකාශන සකස් කිරීමේදී කාර්යාංශයට අයත් ස්ථාවර තැන්පතු පමණක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ලදී. කාර්යාංශයේ සේවකයන්ට හිමි බරපතල අසනීප අරමුදල සහ සුනාමි භූ කම්පන මධ්‍යස්ථාන සඳහා විදේශයකින් ලද ආධාර මුදල යටතේ ඇති ස්ථාවර තැන්පතු සහ ජංගම ගිණුමේ ශේෂය ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් යටතේ 1:2:5 ක සටහන මගින් දක්වා ඇති අතර, එහි සාරාංශය පහත පරිදි වේ.

ස්ථාවර තැන්පතු ශේෂය (2021.12.31)	
සුනාමි භූ කම්පන මධ්‍යස්ථාන අරමුදල	11,841,846.83
බර පතල රෝගාබාධ සඳහා අරමුදල	32,385,892.14
	44,227,738.97

(ඇ) මෙම ඉඩමේ කානු පද්ධතිය සකස් කිරීම, පාර සකස් කිරීම සහ ඉඩම ප්‍රයෝජනයට ගත හැකි ආකාරයෙන් සකස් කිරීම සඳහා දරන ලද වියදම් සඳහා වන ගැලපීම ඉදිරි ගිණුම් වර්ෂය තුල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිත වලට අදාලව ගිණුම් ගත කිරීමට පියවර ගනු ඇත.

(ඈ) 2021 වර්ෂයේ සිට මෙම ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් අංක 1:2:5 ක යටතේ දක්වා ඇත. මෙම විදේශ ආධාර මුදල ලැබී ඇත්තේ කාර්යංශයේ කටයුතු සඳහා නොව සුනාමී සන්නිවේදන මධ්‍යස්ථාන වල කටයුතු වෙනුවෙනි.

පල්ලෙකැලේ සුනාමි මධ්‍යස්ථානයේ නඩත්තු සිදුකරනුයේ කාර්යාංශය සහ කැලිෆෝනියාවේ සෙන් දියාගෝ විශ්ව විද්‍යාලය අතර අත්සන් කරන ලද ගිවිසුමක් හරහා වේ. මෙයට අදාල ගිණුම් ප්‍රතිපත්ති ඉදිරියේදී නිවැරදි කරනු ඇත.

(එ) කාර්යාංශයේ සහ ජීඑස්එම්බී තාක්ෂණික සේවා සමාගමේ අන්තර් ගණුදෙනු සම්බන්ධයෙන් සාකච්ජා වට කිහිපයක් පැවැත්වූ අතර එම ගිණුම් පිළිබඳ තවදුරටත් සාකච්ජා කිරීමට නියමිතව ඇත.එය ඉදිරියේ දී නිරාකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 නීති රීති / විධානයට යොමුව

(අ) කාර්යාංශයේ ජංගම නොවන වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් 2022 වසරේදී සිදුකරනු ලබන අතර, අදාල වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

(ආ) (ස) 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල රාජ්‍ය භාග ආදායම භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර කාර්යාංශයේ රඳවාගෙන තිබූ රුපියල් මිලියන 3147 ක මුදලක් වුවද,

"1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ, 17 (1) කාර්යාංශයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, කාර්යාංශය විසින් ඒ අරමුදල පවත්වා ගෙන යනු ලැබිය යුතුය.

(2) (අ) කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන

සියලු මුදල් : සහ

(ආ) කාර්යාංශයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේදී ලැබෙන සියලු මුදල් ගෙවනු ලැබිය යුතුය. "

ඒ අනුව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාර්යාංශය විසින් වැයකරනු ලබන මුළු වියදම් රුපියල් මිලියන 11697 බව ඔබගේ අවධානයට යොමු කරනු කැමැත්තෙමි. (අදාල ගිණුම් සාරාංශ මේ සමඟ අමුණා ඇත.)

(සස) 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 52 (2) වගන්තිය හා ඒ යටතේ සාදන ලද බලපත්‍ර නිකුත් කිරීමේ නියෝග වලට අනුව කාර්යාංශය විසින් නිකුත් කරනු ලබන බලපත්‍ර අතරින් කැණීම් කිරීමෙන් අනතුරුව හා කැණීමෙන් පසු භූමිය පුනරුත්ථාපනය කළ යුතුව ඇත. නමුත් මේ වනවිට මුදල් බවට පත්කර ගෙන ඇති බැංකු ඇපකර සඳහා වෙනම ගිණුමක් පවත්වාගෙන යන අතර, අදාල ඉඩම් පුනරුත්තාපනය කිරීම උදෙසා කඩිනමින් පියවර ගනිමින් පවතී. මේ සඳහා චක්ලේඛද නිකුත් කර ඇත. (213/217)

(සසස)1997.01.10 වන දිනැති අංක 958 දරණ ගැසට්පත්‍රය මඟින් සංශෝධිත 33(4) නියෝග යට අනුව පතල් නිෂ්පාදන වන වෙළඳ වටිනාකම, රාජ්‍යභාග ප්‍රතිශතය, ඉඩදිය හැකි අඩුකිරීම් සහ ආයෝජන ගිවිසුමට අවශ්‍ය අංග ඇතුලත රාජ්‍යභාග ගෙවීම් සඳහා වූ වැඩ පිළිවෙළ ලේකම් විසින් කාර්යාංශය විමසා නිශ්චය කරනු ලැබිය හැකිය ලෙස දක්වා ඇත. ඒ අනුව, රෙගුලාසි අංක 4 යටතේ දක්වා ඇති රාජ්‍යභාග ප්‍රතිශතයන් වැඩි කිරීමක් හෝ අඩු කිරීමත් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් අත්සන් තබනු ලබන ආයෝජන ගිවිසුමක දී වෙනස් කිරීමට භාජනය කළ හැක.

මෙම කටයුතු කාර්යාංශය විසින් ආයෝජන ගිවිසුම් අත්සන් තැබීමේ දී දැනටමත් සිදු කරමින් පවතින බව දන්වමි. කෙසේ වෙතත් මේ වනවිට කාර්යාංශය විසින් අයකරනු ලබන රාජ්‍ය භාග ගාස්තු සංශෝධනය කිරීම සඳහා පරිසර අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ඇ) (ස)පවත්නා ඛනිජ ප්‍රතිපත්තිය අනුව කාර්යාංශය විසින් වටිනාකම් එකතු කිරීමකින් තොරව ඛනිජ අපනයනය සඳහා අවසර දෙනු නොලැබේ.

මේ වන විට අපනයනයට අනුමත කරනු ලබන

ඇතැම් ඛනිජ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මඟින් හඳුනා ගෙන ඇති වටිනාකම් එකතු කිරීමේ සීමාවන්ට අනුකූලව ඛනිජ අපනයනය සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබේ.

පනත හා රෙගුලාසි වලට අනුව ඛනිජ සේදීම, කැබලි කිරීම, කුඩු කිරීම හා ඇඹරීම යන කාර්යයන් ද පොළොවෙන් ගනු ලබන ඛනිජ වලට සිදු කරන අගය එකතු කිරීම වේ.

කෙසේ වෙතත්, මේ සම්බන්ධව කාර්යාංශය විසින් එක් එක් ඛනිජ වර්ග සඳහා නව වටිනාකම් එකතු කිරීමේ සීමාවන් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතී.

ඛනිජ වල අගය එකතුකිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදෙශයක් මේ වනවිට ඉදිරිපත් කර ඇත.

(සස) විගණනය වෙතින් පෙන්වා දී ඇති පරිදි, වී.වී.එම්. ලංකා පෞද්ගලික සමාගම හා ඇල්කෙමි හෙවි මෙටල්ස් පෞද්ගලික සමාගම යන සමාගම් දෙක සඳහා පනත හා රෙගුලාසි වලට අනුකූලව කාර්යාංශය විසින් වසර 10 කට වලංගු වන පරිදි කැනීම් බලපත්‍ර නිකුත් කර ඇත. එහෙත් කාර්යාංශය 2017 වර්ෂයේ දී ඇල්කෙමි හෙවි මෙටල්ස් පෞද්ගලික සමාගම වෙත නිකුත් කරන ලද කැනීම් බලපත්‍ර දෙක පනත හා රෙගුලාසි වලට අනුකූලව අවලංගු කර ඇත. එහෙත් බලපත්‍රලාභීන් විසින් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත කරනු ලබන අභියාචනයකින් අනතුරුව නැවත මෙම බලපත්‍ර පනත හා රෙගුලාසි වලට අනුව වලංගුභාවයට පත් කිරීමට කාර්යාංශය විසින් කටයුතු කර ඇත.

(ඇ) මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුව ඛනිජ කැනීම් ආශ්‍රිත ශ්‍රී ලංකාවේ කරනු ලබන විදේශීය ආයෝජනයක දී 40% ක් විදේශීය ආයෝජන කොටස් වශයෙන් ද, 60% ක් දේශීය ආයෝජන කොටස් වශයෙන් ද පැවතිය යුතු වේ.

එලෙස නොවන 40% කට වඩා ආයෝජනයක් ශ්‍රී ලංකාව තුළ විදේශීය සමාගමක් සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අවසරය මත සිදු කළ යුතු වේ.

ඒ අනුව, බෝගල ග්‍රැෆයිට් සමාගම විසින් සිදු කරන ආයෝජනයෙන් 40% කට වඩා විදේශීය ආයෝජනයක් සිදුවන බවට හා ඒ සම්බන්ධව ආයෝජන මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන තිබේ ද යන්න කාර්යාංශය විසින් මේ වන විට විමසීමක් සිදු කර ඇත.

ඒ අනුව, ඔවුන්ගෙන් ලබන තොරතුරු මත ඉදිරියේ දී කාර්යාංශය විසින් ආයෝජන මණ්ඩලයේ අවසරය ලබා ගැනීම සඳහා කටයුතු කරනු ඇත.

(ඉ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මහවැලි ගඟේ, මනම්පිටිය ප්‍රදේශයේ වනජීවී කලාපය තුළ ඇති නිධිගත වැලි නිධි ඉවත් කිරීම සඳහා අංක 81/2004 දරණ ශේෂ්ඨාධිකරණ නඩුවෙන් ලද නියෝග මත ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්.) ආයතනය වෙත වැලි කැනීම සඳහා 2008 වසරේ සිට කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කරන ලදී.

මනම්පිටිය හැරුණුවිට පොළොන්නරු දිස්ත්‍රික්කයේ මහවැලි ගඟේ හා මාඳුරු ඔය ආශ්‍රිත වැලි කැනීම් බලපත්‍ර සෙසු පුද්ගලයින් වෙත වැලි කැනීම සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී.

ඒ අනුව ඉඩමේ හිමිකාරීත්වය දරණ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුමැතිය මත වෙනත් පුද්ගලයින් වෙත වැලි කැනීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම නීතිමය වශයෙන් ගැටළුවක් නොවන බව දන්වමු.

2.2.3 කාර්යාංශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තිය ඉක්මවා කටයුතු කර නොමැත.

2.2.4 කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව, කාර්යාංශයේ අරමුණු හා ඉලක්ක කරා ලඟා වීමට අවශ්‍ය ආකාරයට ප්‍රසම්පාදන කටයුතු සිදුකර භාවිතා කර ඇත.

2.3 වෙනත් කරුණු

(අ) බෝගල ග්‍රැෆයිට් සමාගම යටතේ නිකුත් කරනු ලබන කැනීම් බලපත්‍ර යටතේ පොළව මතුපිට සිට අඩි 1,000 ඉක්මවූ ගැඹුරක සිට විශාල ප්‍රාග්ධන වියදමක් යොදමින් සිදුකරනු ලබන කැනීම් වලින් අනතුරුව පොළව මතුපිටට ගෙන එන ඛනිජ නැවත පිරිසැකසුම් කිරීමකට ලක්කර අපනයනය සඳහා සැකසීම් සිදු කරනු ලැබේ.

ඒ අනුව, ඛනිජයක වටිනාකමක් එකතු කිරීම සඳහා බෝගල ග්‍රැෆයිට් සමාගම ඇතුළු සියළුම මිනිරන් කැනීම් බලපත්‍රලාභීන් විශාල ආයෝජනයක් සිදු

කරනු ලබයි.

ඒ අනුව, මේ වනවිට මිනිරන් බනිජය කාර්යාංශය විසින් හඳුනාගත් වටිනාකම් එකතු කිරීමකට අනුකූලව අපනයනය සිදුකරන මුත්, ඉදිරියේ දී ඒ සඳහා නව වටිනාකම් එකතු කිරීමේ සීමාවන් හඳුන්වා දීමටත්, එම සීමාවන්ට අනුව අපනයනය සඳහා අවසර දීමටත් කටයුතු කිරීමට කාර්යාංශය අවශ්‍ය මූලික කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

(ආ) රජයේ පරිපාලය යටතේ පවතින කහටගහ ග්‍රැෆයිට් සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පැරණිතම හා ඓතිහාසිකමය වශයෙන් වැදගත් වන මිනිරන් පතලකි.

මෙම මිනිරන් පතල සඳහා නිකුත් කර ඇති කැනීම් බලපත්‍රය වාර්ෂිකව දීර්ඝ කරනු ලබන අතර, එම පතලේ පවතින අඩුපාඩු නිවැරදි කිරීම සඳහා කාර්යාංශය විසින් කොන්දේසි පනවා ඇති අතර, වාර්ෂිකව අළුත් කිරීමේ දී එහි කොන්දේසි මඟින් දී ඇති උපදෙස් අනුගමනය කර තිබේ ද යන්න කාර්යාංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ.

(ඇ)ජේ.ඩී.කේ. වික්‍රමරත්න මහතා වෙත මාතලේ දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රාගෙදරවත්ත නැමැති ඉඩමේ මිනිරන් කැනීම සඳහා කාර්මික කැනීම් " ඒ" කාණ්ඩයේ බලපත්‍රයක් කාර්යාංශය විසින් වසරක් වලංගු වන පරිදි නිකුත් කර තිබිණ.

පනත හා රෙගුලාසි යටතේ පවරා ඇති නීතිරීති වලට අනුව කාර්මික කැනීම් "ඒ" කාණ්ඩයේ බලපත්‍රයක වලංගු කාලය කාර්යාංශයේ අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කර ඇති ආර්ථික ජීව්‍යතා වාර්තා පදනම් කොටගෙන තීරණය කළ හැක.

ඒ අනුව, ඉදිරිපත් කර ඇති ආර්ථික ජීව්‍යතා වාර්තාව පදනම් කරගෙන අයදුම්කරු විසින් පනත හා රෙගුලාසි වලට අනුකූලව කරන ලද ඉල්ලීම මත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බැවින් කාර්යාංශය විසින් වසර 10 ක කාලයකට බලපත්‍රය නිකුත් කර ඇත.

තවද, කාර්මික කැනීම් "සී" හා "ඩී" කාණ්ඩය සඳහා ද වසර 03 කට නොවැඩි කාලයකට කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට මේ වන විට රෙගුලාසි නිකුත් වී ඇති බව ද දන්වමි.

(ඈ)සාර්කෝන් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම විසින් සිදු කරන ලද බනිජ ගවේෂණයෙන් අනතුරුව කරස්නාගල ප්‍රදේශයේ මිනිරන් කැනීම් සඳහා කැනීම් බලපත්‍රයක් කාර්යාංශය විසින් ලබාගෙන ඇත.

එහෙත්, කැනීම් කිරීමේ දී යොදා ගනු ලබන තාක්ෂණික ක්‍රමවේද හා මිහි තුළ මිනිරන් නිෂ්පාදනයන් සිදු කිරීමට මිනිරන් කැනීම් බලපත්‍රය යටතේ නොහැකි වන අවස්ථා පවතී.

(ඉ) බෝගල ග්‍රැෆයිට් සමාගම, කහටගහ ග්‍රැෆයිට් සමාගම, කරස්නාගල හා සකුරා ග්‍රැෆයිට් සමාගම් විසින් පනත හා රෙගුලාසි යටතේ මේ වන විට මිනිරන් අපනයනය සිදු කර ඇත.

ඉහත ආයතන වෙත නිකුත් කරනු ලබන කැනීම් බලපත්‍ර යටතේ පොළව මතුපිට සිට අඩි 1,000 ඉක්ම වූ ගැඹුරක සිට විශාල ප්‍රාග්ධන වියදමක් යොදමින් සිදුකරනු ලබන කැනීම් වලින් අනතුරුව පොළව මතුපිටට ගෙන එන ඛනිජ නැවත පිරිසැකසුම් කිරීමකට ලක්කර අපනයනය සඳහා සැකසීම් සිදු කරනු ලැබේ.

මේ අනුව, මූලික අගය එකතු කිරීමක් ඛනිජ අපනයනයේ දී බලපත්‍රලාභීන් විසින් සිදු කර ඇති අතර, කාර්යාංශය විසින් මිනිරන් සඳහා අගය එකතු කිරීමේ සීමාවන් හඳුන්වා දීමට මේ වනවිට කටයුතු කරමින් පවතී.

(ඊ) පනත හා රෙගුලාසි යටතේ කාර්මික කැනීම් ඒ හා බී කාණ්ඩයේ බලපත්‍රයක් නීතිමය වශයෙන් පැවරීමට නීති සැකසී ඇත.

ඒ අනුව ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍ර හා තාක්ෂණික කරුණු, ගිවිසුම් පදනම්කොට ගෙන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යටත්ව පැවරීම සිදුකර ඇත.

(උ) මූලික පාරිසරික පරීක්ෂණ අධ්‍යනය මත වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය නිකුත් කරනු ලබන අතර, බලපත්‍රලාභියා විසින් අදාළ නිර්දේශ මත බලපත්‍රයෙන් පැවරී ඇති කාර්යයන් සිදු කළ යුතු වේ.

(ඌ) 1999 එවකට කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ජාතික ඛනිජ ප්‍රතිපත්තියට අනුව මේ වන විට කාර්යාංශය විසින් කටයුතු කරමින් සිටින අතර, එම ප්‍රතිපත්තිය

වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කොට මේ වන විට එය පරිසර අමාත්‍යාංශය වෙත යොමු කොට ඇත.

මේ පිළිබඳව පරිසර අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඉදිරි මාස 06 ක කාලය ඇතුළත නව ප්‍රතිපත්තිය එළිදැක්වීම සඳහා කටයුතු කිරීමට කාර්යාංශය විසින් සාකච්ඡා කරමින් පවතී.

(එ) 2009 අංක 66 දරණ පනතින් සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 26 වන වගන්තියේ ප්‍රකාරව ඛණිජ වල අයිතිය රජය සතු වීමත් ඒ හේතුකොට ගෙන එකී පනතේ 44 වගන්තිය ප්‍රකාරව කැණීම් බලපත්‍රයක් යටතේ කණිනු ලබන ඛනිජ වල විකුණුම් මිලෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා 4% ක ප්‍රතිශතයක් ද කාර්මික ඛනිජ (දේශීය) සඳහා 6% ක ප්‍රතිශතයක් ද රාජ්‍යභාගය වශයෙන් අයකරනු ලැබේ.

එලෙස අයකරනු ලබන රාජ්‍යභාගය ගණනය කිරීම සඳහා භූමියෙන් ඉවත් වූ ඛනිජ ප්‍රමාණය ගණනය කිරීම සඳහා කාර්යාංශය විසින් භාවිතා කරන ලද පුපුරණ ද්‍රව්‍ය මත ඉවත් වූ ඛනිජ ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

ඒ මත පදනම්ව කාර්යාංශය විසින් 1994 වර්ෂයේ සිට වර්තමානය දක්වා රාජ්‍යභාගය ගණනය කිරීම සඳහා භූමියෙන් ඉවත් වූ ඛනිජ ප්‍රමාණය පිළිබඳ තොරතුරු ගණනය කරනු ලැබේ.

මෙම ක්‍රමවේදයේ පැවැති අඩුපාඩු හඳුනාගෙන තවදුරටත් නිරවද්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මේ වන විට ඉහළ ධාරිතාවයකින් මාසිකව කැණීම් කරනු ලබන කාර්මික කැණීම් බලපත්‍ර "ඒ" හා "බී" කාණ්ඩයේ බලපත්‍ර යටතේ ඉවත් කරනු ලබන ඛනිජ ප්‍රමාණය ගණනය කිරීම වඩා විධිමත් අධ්‍යනයක් සඳහා අධි තාක්ෂණික මිනුම් උපකරණ භාවිතා කිරීමට මේ වන විට කාර්යාංශය විසින් කටයුතු කරනු ලැබේ.

මෙවැනි අධි තාක්ෂණික මිනුම් උපකරණ ඉහළ ධාරිතාවයක් සහිත කැණීම් බලපත්‍ර වලට සුදුසු වුවත්, අඩු ධාරිතාවක් සහිත කැණීම් සඳහා ඉවත් කරන ලද ඛනිජ ප්‍රමාණය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීම වඩාත් ඉහළ පිරිවැයක් දැරීමට සිදු වන බැවින්, ඒ සඳහා කටයුතු කිරීම සුදුසු නොවේ.

කෙසේ වෙතත්, භාවිතා කරන පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය මත සිදු කරන ඉවත් වූ ඛනිජ ප්‍රමාණය පිළිබඳ ගණනය කිරීමේ දී ඒ තුළින් දක්නට ඇති ගැටළුව වන්නේ, ලබාගත් මුළු පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණයම එම කැණීම් සඳහා භාවිතා කළේ ද නැතිනම්, වෙනත් ස්ථානයක කැණීම් සඳහා භාවිතා කළේ ද යන්න පැහැදිලිතාවක් හඳුනා ගැනීමට නොහැකි වීමයි.

එම ගැටළුව මඟහැරවීම සඳහා වරින් වර කණිනු ලබන කළුගල් ප්‍රමාණය හා භාවිතා කළ පුපුරණ ද්‍රව්‍ය ප්‍රමාණය සංසන්දය කිරීම සඳහා අහඹු ලෙස පරීක්ෂා කිරීමට මේ වන විට කටයුතු කර ඇත.

(ඒ) යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය විසින් කාර්යාංශය වෙතින් ලබාගත් කැනීම් බලපත්‍ර යටතේ අදාළ රාජ්‍යභාගය කාර්යාංශය වෙත ගෙවා ඇත.

එහෙත්, විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි ව්‍යාපෘතිය සඳහා භාවිතා කළ ඛනිජ සඳහා රාජ්‍යභාගය එම ඛනිජ සැපයුම්කරුවන් සතු කැනීම් බලපත්‍ර යටතේ ගෙවිය යුතු වේ.

කෙසේ වෙතත්, විගණනය විසින් පෙන්වා දී පරිදි කාර්යාංශය විසින් අදාළ රාජ්‍යභාගය ගෙවන ලෙසට යාන්ඔය ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවූ චීන සමාගමට හා ව්‍යාපෘතියේ හිමිකාරීත්වය දරණ වාර්මාර්ග දෙපාර්තමේන්තුව වෙත කාර්යාංශය විසින් රාජ්‍යභාගය ගෙවන ලෙසට දන්වා සිටිය ද, මෙතෙක් ඔවුන් විසින් එම ගෙවීම් සිදු කිරීමට කටයුතු කර නොමැත.

කෙසේ වෙතත්, කාර්යාංශය විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ කරන ලද සාකාච්ඡාවකට අනුව මේ පිළිබඳව කාර්යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර තවදුරටත් සාකච්ඡා කළ යුතු බවට දන්වා ඇති බැවින්, ඒ පිළිබඳව ඉදිරියේ දී දෙපාර්ශවය අතර සාකච්ඡාවක් පැවැත්වීමට යෝජිතය.

(ඔ) පොළොන්නරු දිස්ත්‍රික්කයේ, මහවැලි ගඟේ වැලි කැනීම් සඳහා පෞද්ගලික බලපත්‍රලාභීන් 82 ක් වෙත මසකට වැලි කියුබ් 100 බැගින් කැනීම් කිරීමටත්, එම කැනීම් කටයුතු සතියේ සඳුදා, බදාදා හා සිකුරාදා දින වල පමණක් සිදු කරන ලෙසත් කොන්දේසි නිකුත කරමින් කැනීම් බලපත්‍ර නිකුත් කර ඇත.

එම කොන්දේසි උල්ලංඝණය කරමින් කැනීම් කරන බවට කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලි වලට අනුව කාර්යාංශයේ වැටලීම් අංශය විසින් වැටලීම් කිහිපයක් සිදු කර ඇත.

ඊට අමතරව පනත හා රැුගුලසි යටතේ අනවසර

ක්‍රියා වැළක්වීම සඳහා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ද නීතිය ක්‍රියාත්මක කිරීමට බලතල හිමිවී ඇති බැවින්, මේ සම්බන්ධව වැටලීම් කිරීමට කාර්යාංශය විසින් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත.

ඊට අමතරව විශේෂ කාර්ය බලකායට ද කැනීම් බලපත්‍ර සම්බන්ධ වැටලීම් සිදු කිරීමට කාර්යාංශය විසින් උපදෙස් දී ඇත.

(ඔ) කන්තලේ-සූරියපුර මහවැලි ගඟේ ගං ඉවුරට සිදුවන හානි වැළැක්වීම සඳහා වේල්ලක් ඉදිකිරීම මූලික කර ගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමෙන්තුව හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ වලට යටත්ව ගං ඉවුරට හානි වන පරිදි තැන්පත් වී ඇති වැලි නිධිය ඉවත් කිරීම සඳහා කාර්යාංශය මඟින් ජී.එස්.එම්.බී. තාක්ෂණික සේවා (පුද්.) ආයතනය වෙත අංක ඔඵබ/ඍධ/13015 දරණ කාර්මික කැනීම් බලපත්‍රය නිකුත් කර ඇත.

මෙය මූලික වශයෙන්ම ගං ඉවුරට හානි කරන වැලි නිධි ඉවත් කර, හානියට පත් වූ ගං ඉවුරේ වේල්ලක් ඉදිකිරීම මුල්කොට ගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයක් මත නිකුත් කරන ලද්දක් බැවින්, මෙහි අධීක්ෂණ කටයුතු එම ආයතන වලින් සිදු කිරීම කළ යුතු වේ.

විගණන කමිටු වාර්තාව

"ස්වාභාවික සම්පත් සහ පරිසරය ආරක්ෂා කිරීමේ කාර්යයෙහි නිරත ජනතාව විසින් නිරන්තරවම විශ්වාසය තබනු ලබන වඩාත් යහපත් පාලන කාර්යරාමුවක් තුළ ක්‍රියාත්මක වන රජයට අයත් නියාමන ආයතනයක් බිහි කිරීම උදෙසා"

යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ තුළ සඳහන් මාර්ගෝපදේශ මත පදනම්ව සකසා ඇති විගණන හා කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය තුළ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කළමනාකරණ කමිටුවෙහි නීති හා වගකීම් පැහැදිලිව විස්තර කරනු ලැබ ඇත.

කළමනාකරණ කමිටුව වෙත මෙම කමිටුව වගකිව යුතු වන අතර ස්වකීය රැස්වීම් පිලිබඳ වාර්තා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වේ.

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි විගණන කමිටුව කළමනාකාරිත්ව මණ්ඩලයෙහි විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර භාණ්ඩාගාර නියෝජිතවරයෙකු විසින් මෙහි සහභාගිත්වය දරනු ලැබේ. එකී සාමාජිකයන් පහත දැක්වේ.

1. සභාපති - රෝහිත වික්‍රමරත්න මහතා

(අධ්‍යක්ෂ ජාතික ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව)

2. සාමාජික - අයි සී පතිරාජ මහතා

(අතිරේක ලේකම් - කර්මාන්ත හා කර්මාන්ත උද්‍යාන සංවර්ධන)

3. සාමාජික - ඩබ් සී එස් සී වැලිවත්ත මහතා

අතිරේක ලේකම්, ස්වාභාවික සම්පත්

විගණන හා කළමනාකරණ කමිටුවෙහි නීති හා වගකීම්

සමාගමෙහි මූල්‍ය හා අනිකුත් ඒ ආශ්‍රිත කටයුතු හා අදාල තම වගකීම් සක්‍රිය ලෙස සපුරාලීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දීම විගණන කළමනාකරණ කමිටුව විසින් සිදුකරනු ලැබේ. පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට කමිටුව වෙත බලතල ලබා දී ඇත

1. වාර්ෂික විගණන සැලැස්ම, වැඩසටහන ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික අයවැය සහ ප්‍රාග්ධන අයවැය පරීක්ෂා කිරීම
2. ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ක්‍රියා පිලිවෙත්හි කිසියම් වෙනස්කම් තුල යෝග්‍යතාවය හා ගුණාත්මකභාවය සහ අදාල ගිනුම්කරණ ප්‍රමිතින්හි ව්‍යවස්ථාපිත හා නියාමන අනුකූලතාවයන් සමඟ ඒවායේ අනුගතභාවය පරීක්ෂා කිරීම
3. විගනන වාර්තා සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කළමනාකරණ තීරණ මත පදනම්ව ගිණුම්කරණ, මූල්‍ය සහ මෙහෙයුම් අංශ ආවරණය කරමින් අභ්‍යන්තර පාලන පද්ධතිය පරීක්ෂාවට සහ ඇගයීමට ලක් කිරීම
4. ව්‍යවස්ථා, නීති, රෙගුලාසි ,මහා භාණ්ඩාගාර චක්‍රලේඛ සහ විධානයන් යන මේවායේ අනුකූලතාවය පරීක්ෂා කිරීම
5. කමිටුවෙහි නිර්දේශ කළමනාකාරිත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම
6. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය පිරිවැය කෙරෙහි සවිඥානික සහ ඵලදායිතාවය සහිත ආයතනයක් බවට පත් කිරීමේ ඵුරමුණ ඇතිව ආයතනයෙහි කාර්ය මණ්ඩලයෙහි විනය , කාර්යසාධනය ,අනවශ්‍ය වියදම් සහ දූෂණ ක්‍රියා දුරලීම හා අදාල කරුණු පරීක්ෂා කිරීම
7. වංචාවන් සිදුවීමේ අවදානම දුරලීම සඳහා යෝග්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම

කමිටුවෙහි රැස්වීම්

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුලදී කමිටුවෙහි රැස්වීම් දෙකක් පවත්වන ලදී. කමිටු රැස්වීම් කටයුතු ප්‍රමාණවත්ව විස්තර සහිතව සටහන් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත් ලෙස වාර්තා කරනු ලැබේ. කමිටුවෙහි ආරාධනය මත විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිතවරයා වර්ෂය තුලදී පවත්වන ලද කමිටු රැස්වීම්වලට සහභාගි විය.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණකවරයෙකු විසින් ප්‍රධානත්වය

දරන ස්වකීය වූ අභ්‍යන්තර විගණන අංශයක්ද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සතුව ඇත. විගණන හා කළමනාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම ඉදිරිපත් කර අනුමත කරවා ගන්නා ලද අතර අභ්‍යන්තර විගණන කටයුතු සහ පරීක්ෂා කිරීමේ කටයුතු කමිටුව විසින් නිරන්තරවම පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කරනු ලැබේ.

බාහිර විගණනය

අනනුකූලතාවය හා අක්‍රමවත් ගිනුම්කරණ හා වාර්තාකරණ ගැටලු සම්බන්ධයෙන් වාර්තාවන සිද්ධි සම්බන්ධයෙන් නියමිත කලට කටයුතු කරනු ලබන බවට වගබලා ගනු පිණිස විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා විගණන හා කළමනාකරන කමිටුව විසින් පරීක්ෂා කරනු ලැබේ

ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතයෙහි යෝග්‍යතාවය පලිබඳව කමිටුව විසින් සෑහීමට පත් වන අතර ඒ අනුව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි මූල්‍ය ප්‍රකාශනය විශ්වසනීය බවට සාධාරණ සහතිකයක් ලබා දෙනු ලැබේ. තවද, අදාල නීතිරීති හා රෙගුලාසි සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය අනුගතව ක්‍රියා කරන බවට සහ සමාලෝචිත වර්ෂය තුලදී වාර්තා වූ අනනුකූලතාවයන් සම්බන්ධයෙන් විශෝධන සහ නිවාරණ ක්‍රියාමාර්ග ගන්නා ලද බවට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි අනුකූලතා කාර්යරාමුව විසින් තහවුරු කරනු ලබන බවට කමිටුව විසින් සෑහීමට පත් වනු ලැබේ.

රෝහිත වික්‍රමරත්න මහතා
සභාපති
විගණන හා කළමනාකරණ කමිටුව

ආයතනික සමාජ වගකීම

ආයතනික සමාජ වගකීම

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ව්‍යාපෘති

ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (1)

යහපත් අරමුණක් උදෙසා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කළමනාකාරීත්වය විසින් ලබාදෙන ලද දායකත්වය තුළින් මහරගම අපේක්ෂා රෝහල වෙත කන්තුක නිරීක්ෂණ යන්ත්‍ර දෙකක් පරිත්‍යාග කරන ලදි.





කොවිඩ් 19 රෝගයෙන් පීඩා විඳින තැනැත්තන්හට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා සහාය වනු පිණිස ගම්පහ මහ රෝහල වෙත බිත්ති මත නංවන ලද ඔක්සිජන් සැපයුම් මාන හයක් ලබා දෙන ලදි. මෙම වසං ගතයෙන් පීඩා විඳින රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමට දැඩි ලෙස අත්‍යවශ්‍ය වූ ඔක්සිජන් සිලින්ඩර හිගකම හේතුවෙන් සමස්තයක් ලෙස රටම මුහුණ දෙන ලද අසීරුතා තත්ත්වය සැලකිල්ලට ගනිමින් රෝහල වෙත සහාය ලබා දීම මෙම පරිත්‍යාගය සිදු කිරීමේ ප්‍රධාන හේතුව විය.





ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (02)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත්ව තිබූ සහ භූ විද්‍යා සමීක්ෂන හා පතල් කාර්යාංශය විසින් කුලියට ගන්නා ලද යක්කල වෙරළවත්තේ පිහිටි ඉඩම මඤ්ඤොක්කා, පොල්, තැඹිලි සහ කොස් යන ශාක වගා කිරීම සඳහා යොදා ගන්නා ලද අතර මෙම හිස් ඉඩම උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම එහි අරමුණ විය.





ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (3)

අවශ්‍යතාවයන් සහිත කාර්යමණ්ඩල සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට සිය දෛනික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා උපකාර කිරීමේ අරමුණ සහිතව 2021 දෙසැම්බර් මාසයේදී පවිත්‍ර කිරීම් සහ ආරක්ෂක කාර්ය මණ්ඩල සාමාජිකයන්ට වියලි ආහාර පරිත්‍යාග කරන ලදි.





ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (4)

ලෝක පරිසර දිනය හා සමගාමීව පරිසර අමාත්‍යාංශය හා එක්ව සුදු හඳුන් ශාක වගා කිරීමේ වැඩ වැඩසටහනක් බත්තරමුල්ල ප්‍රදේශයේ දී ක්‍රියාත්මක කරන ලදි. මීට අමතරව ලෝක පරිසර දිනය සැමරීම සඳහා ප්‍රාදේශීය කාර්යාලවල විවිධ ශාක වගා කරන ලදි.





ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (5)

කිරුළපන ප්‍රදේශයේ කෝවිලක් ආශ්‍රිතව කොහොඹ ශාක වගා කිරීම සඳහා වැඩසටහනක් සංවිධානය කරන ලද අතර පරිසර අමාත්‍යාංශයේ ලේකම්වරයා ගේ අනුග්‍රහය යටතේ එය සාර්ථකව පවත්වන ලදි.





ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති (6)

කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවැති කාල පරිච්ඡේදය තුළදී එම මාරාන්තික රෝගයෙන් පීඩා විඳින ලද තැනැත්තන් හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීම සඳහා සහ එම කාලය තුළදී ශ්‍රී ලංකාවේ ජනතාව මුහුණ දුන් මානසික පීඩනය දුරලීම සඳහා කළමනාකාරීත්වය විසින් ධර්ම දේශනාවක් සංවිධානය කරන ලදි.

අවසාන වශයෙන්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි ප්‍රධාන දැක්ම වනුයේ ශ්‍රී ලංකාව තුළ තිරසර ආර්ථික සමෘද්ධියක් සුරක්ෂිත කරන අතරම කාර්යක්ෂම මහජන සේවාවක් ලබා දෙමින් සිය ක්‍රියාවලීන් ප්‍රමිතිගත කිරීම සහ ඒවායේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමයි.





කාර්යාංශය සමග සම්බන්ධ වීමට අවශ්‍ය තොරතුරු

අපගේ කාර්යාල	ලිපිනය	විද්‍යුත් තැපැල් ලිපිනය	දුරකථනය/ ෆැක්ස්
ප්‍රධාන කාර්යාලය	අංක 569, එපිටමුල්ල පාර. පිටකෝට්ටේ	info@gsmb.gov.lk	11-2886289 11-2886290
අම්පාර	අංක 96 , දුටුගැමුනු මාවත	ampara@gsmb.gov.lk	0632223385
අනුරාධපුරය	අංක 519/F/3 ජයන්ති පාර ,බණ්ඩාරනායක මාවත	anuradhapura@gsmb.gov.lk	0252224388
බදුල්ල	අංක 117/3, මහියංගන පාර	badulla@gsmb.gov.lk	0552225210
මඩකලපුව	අංක 20/G, බෙලි ඇවනියු ,සින්න උප්පොදෙයි	batticaloa@gsmb.gov.lk	0652222266
කොළඹ	අංක 463, කෝට්ටේ පාර	info@gsmb.gov.lk	0112886522
හම්බන්තොට	අංක 21, ටෙරස් ඇවනියු	hambantota@gsmb.gov.lk	0472222477
ගම්පහ	අංක 6, වෙරළුවත්ත, යක්කල	gampaha@gsmb.gov.lk	0332231430
යාපනය	අංක 170, කොලොම්පුතුරෙයි මාවත	jaffna@gsmb.gov.lk	042224595
කළුතර	අංක 11/ඊ, සෙනෙවිරත්න පෙදෙස, කළුතර දකුණ	kalutara@gsmb.gov.lk	0342225580
නුවර	ජනසවිගම, පල්ලෙකැලේ නුවර	kandy@gsmb.gov.lk	0812421294
කුරුණෑගල	අංක 72, විලේගොඩ පාර	kurunegala@gsmb.gov.lk	0372230858
මාතර	අංක 224, සුනන්ධ මාවත, වල්ගම	matara@gsmb.gov.lk	0412736765
මොනරාගල	අංක 134/4, අමිල හාඩ්වෙයාර් ගොඩනැගිල්ල ,නව බස් නැවතුම් පොළ	monaragala@gsmb.gov.lk	0552277392
රත්නපුරය	අංක 66, ශ්‍රී සරණංකර මාවත, හිදැල්ලන	rathnapura@gsmb.gov.lk	0452228117
ත්‍රිකුණාමලය	අංක 272, 4 වැනි සැතපුම් කනුව,අන්දන්කුලන් ත්‍රිකුණාමලය	trinco@gsmb.gov.lk	0262052815
පොලොන්නරුව	අංක 26, රොවුන් පාර	polonnaruwa@gsmb.gov.lk	0272226366
වවුනියාව	අංක 45/1A යාපනය පාර	vavniya@gsmb.gov.lk	0242229005
කෑගල්ල	අංක 102/8 , අංක 102/8 මොලමුරේ වත්ත	kegalla@gsmb.gov.lk	0352221958
මාතලේ	අංක 80/2 අල්වලා, උකුවෙල	matale@gsmb.gov.lk	0662058585

2021



භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
නො. 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.
www.gsmb.gov.lk